# වාර්ෂික වාර්තාව 2016

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

# පටුන


| | |
|---|---|
| ආයතනික තොරතුරු | 2 |
| කාර්ය මණ්ඩලය | 3 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 4 – 5 |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | 6 – 7 |
| අපගේ දැක්ම හා මෙහෙවර | 8 |
| කාර්ය සාධනය | 9 – 28 |
| මූල්‍ය වාර්තාව | 29 – 48 |
| විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වාර්තාව | 49 - 62 |
| විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද පිළිතුරු වාර්තාව | 63 - 73 |

## ආයතනික තොරතුරු

## ආයතනයේ නම

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

## නීත්‍යානුකූල පනත

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත

## අධ්‍යක්ෂ මණ්ඩලය 2016

| | | |
|---|---|---|
| කීර්ති වික්‍රමරත්න මහතා | සභාපති | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය |
| එම්.ජී.ඒ.ගුණතිලක මහතා | සාමාජික | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය |
| බී. එන්. දමින්ද කුමාර මහතා | සාමාජික | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| අයි. ජේ. අබේරත්න මිය | සාමාජික | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය |
| ඩී. වී. බන්දුලසේන මහතා | සාමාජික | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| කේ.බී. ගුරුගේ මහතා | සාමාජික | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| ඩබ්. ටී. එච්. රුචිර විතාන මහතා | සාමාජික | මහවැලි අමාත්‍යාංශය |
| ඩී. ඩී. ආරියරත්න මහතා | සාමාජික | වාර්මාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය |
| ඒ. එම්. ආර්. ජේ. කේ. ජයසිංහ මහතා | සාමාජික | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය |
| එස්. තර්ෂන් මහතා | සාමාජික | මුදල් අමාත්‍යාංශය |
| ආර්. පී. ආර්. අමරසිංහ මිය | සාමාජික | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය |
| දමිත කුමාරසිංහ මහතා | සාමාජික | මහජන උපයෝගීතා කොමිසන් සභාව |
| ඩී.ඩී. ආනන්ද නාමල් මහතා | සාමාජික | ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය |
| ෆර්සානා අනීෆ් මිය | සාමාජික | පත් කරන ලද සාමාජික |
| ඒ. එම්. සී. පෙරේරා මහතා | සාමාජික | පත් කරන ලද සාමාජික |
| හිරාන් අජිත් කරුණාරත්න මහතා | සාමාජික | පත් කරන ලද සාමාජික |
| ජී. මහේන්ද්‍ර පෙරේරා මහතා | සාමාජික | පත් කරන ලද සාමාජික |


## විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් 2016

| | | |
|---|---|---|
| එස්. තර්ෂන් මහතා | සභාපති | මුදල් අමාත්‍යාංශය |
| එම්. ජී. ඒ. ගුණතිලක මහතා | සාමාජික | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය |
| ෆර්සානා අනීෆ් මිය | සාමාජික | පත් කරන ලද සාමාජික |
| එල්. කේ. අයි. සමන්ත මහතා | සාමාජික | ජාතික විගණන කාර්යාලය |
| එස්. කේ. මලවිසූරිය මහතා | නිරීක්ෂක | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය |

## කාර්ය මණ්ඩල සංයුතිය 2016

මුළු කාර්ය මණ්ඩල සංඛ්‍යාව 104 දෙනෙකුගෙන් සමන්විත වන අප ආයතනය සාපේක්ෂව කුඩා ආයතනයකි.

අපගේ කාර්ය මණ්ඩල සංයුතිය පහත දක්වා ඇත.




### ප්‍රධාන කාර්යාලය

**ගොඩනැගිලි අංක 05, පළමු වන මහල,**
**බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව**
**බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07**

**දුරකථන අංකය : 0112677445**
**ෆැක්ස් අංකය : 0112682534**
**ඊමේල් ලිපිනය : info@energy.gov.lk**
**වෙබ් අඩවිය : www.energy.gov.lk**

## සභාපතිතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සභාපතිවරයා ලෙස, 2016 වර්ෂයේ ක්‍රියාකාරකම් වල කාර්ය සාධන සමාලෝචනය සඳහා මෙම පණිවුඩය එකතු කිරීමට මා සතුටු වෙමි.

රට සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූලික ශක්තිය යනු බලශක්තියයි. ජාතික බලශක්ති ප්‍රතිපත්ති හා උපායමාර්ගයන් ජාතික හා පෞද්ගලික අංශයන්ගෙන් බලශක්ති සුරක්ෂිතතාව කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. සෑම පුරවැසියෙකුටම විශ්වසනීය හා දැරිය හැකි මිලකට පිරිසිදු බලශක්ති ප්‍රමාණයක් සෑම පුරවැසියෙකුටම ලබා දෙන තත්ත්වයක් මෙම ප්‍රතිපත්තිය මගින් අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (ශ්‍රීලසුබඅ) යනු රට තුළ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ප්‍රචලිත කිරීම හා තිරසාර බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා පිහිට වූ ආයතනයයි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත මගින් පුනර්ජනනීය බලශක්තිය භාවිත ක්‍රියාමාර්ග කරා යොමුවීමට අවශ්‍ය ප්‍රමාණවත් ප්‍රතිපාදන පවතින බව මාගේ හැඟීමයි. ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය වර්තමානයේ දී බොහෝ අභියෝගවලට මුහුණ පා සිටින අතර, විශේෂයෙන්ම විදුලිය මිල අධිකවීම, තාප විදුලිබල උත්පාදනය සඳහා ආනයනය කරනු ලබන පොසිල ඉන්ධන මත දැඩි ලෙස යැපීම ප්‍රධාන හේතුවයි. තවද මෙය ආර්ථිකය කෙරෙහි දැඩි අහිතකර බලපෑමක් ද ඇති කරයි. මෙම තත්ත්වය අවම කිරීම සඳහා රජය පහත සඳහන් ඉලක්ක සපුරා ගැනීමට සැලසුම්කර ඇත;

- ආනයනය කරන ලද පොසිල ඉන්ධන සඳහා විකල්පයක් වශයෙන් 2020 දී නව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් 20% ක විදුලිය නිපදවීම.
- විදුලිබල සංරක්ෂණ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම තුළින් 2020 වන විට මුළු බලශක්ති පරිභෝජනයෙන් 10% ක අඩු කිරීම.

2020 වන විට නව පුනර්ජනනීය බලශක්ති (NRE) භාවිතා කරමින් 20% ක් විදුලිය නිපදවීමේ අරමුණේ සතුටුදායක ප්‍රවේශයක් ලෙස, මුළු විදුලිබල උත්පාදනයෙන් 10% ක් නව පුනර්ජනනීය බලශක්ති (NRE) මගින් නිපදවීමේ ඉලක්කය මෙ වන විට ඉක්මවා යාමට හැකි වී තිබේ.

බලශක්ති සංරක්ෂණ ක්ෂේත්‍රය තුළ නියාමන මැදිහත්වීම් හා බලශක්ති කාර්යක්ෂමතා සේවා අංශය ශක්තිමත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. 2016 දී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන මගින් විදුලිය ගිගාවොට් පැය 38 ක්, ඇවිතෙල් ලීටර් මිලියන 14 ක් සහ දැව ඉන්ධන ලීටර මිලියන 27.2 ක් ඉතිරි කිරීමට හැකිවිය.

ඉහත අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා පහත සඳහන් පරිදි තේමාගත ක්ෂේත්‍ර 4 ක් යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන් ශ්‍රීලසුබඅ ක්‍රියාවට නංවන ලදී.

i. පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය - ජාතික පුනර්ජනනීය බලශක්ති ඉලක්කයන් සපුරා ගැනීම සඳහා සෘජුව සම්බන්ධ වීම මෙහි අරමුණයි.

ii. බලශක්ති සංරක්ෂණය සහ කළමනාකරණය - ජාතික බලශක්ති සංරක්ෂණ ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා සෘජුව සම්බන්ධ වීම මෙහි අරමුණයි.

iii. දැනුම් කළමනාකරණය - බලශක්ති දැනුවත් ජනතාවක් වෙත බලශක්ති අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අරමුණ වේ.

iv. ක්‍රමෝපාය - දිගුකාලීන තිරසාර බලශක්ති සංස්ථාපිතයට සහාය වීම සඳහා ප්‍රතිපත්ති මැදිහත්වීම්, පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්, තාක්ෂණික සංවාදයන් ආදිය අරමුණු කර ගැනීමයි.

බලශක්ති භාවිතය විධිමත්ව කළමනාකරණය කිරීම තුළින් බලශක්ති සංරක්ෂණය ක්‍රියාවට නැංවීම සඳහා නවීන තාක්ෂණය, නීති සම්පාදක ප්‍රවේශයන්, පර්යේෂණ සහ සංවර්ධන, දැනුම සහ දැනුම්වත් කිරීම අපට අවශ්‍ය වේ. ඒ සමානව, දිවයිනෙහි අනාගත බලශක්ති ඉල්ලුම සපුරාලීම සඳහා දේශීය පුනර්ජනනීය බලශක්ති සම්පත් ප්‍රශස්ථ අයුරින් ගොනු කිරීම පිණිස බලශක්ති සම්පත් පරිභෝජනය සම්බන්ධයෙන් ද අප නව්‍ය ප්‍රවේශයන් කරා යා යුතු වේ.

දිවයිනෙහි තිරසර බලශක්තිය මහා පරිමාණයෙන් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය රාමුවක් මේ වනවිටත් සකස් කර ඇති කාරණය සම්බන්ධයෙන් සලකා බැලූ විට පසුගිය කාල පරිච්ඡේදයේදී ක්‍රියාවට නංවන ලද වැඩසටහන් වල ප්‍රගතිය සම්බන්ධයෙන් අපට සතුටට පත් විය හැක. එය අනාගතයේ දී සංවර්ධනය වූ තිරසර බලශක්ති අදියරක් සඳහා උපකාරී වන වේදිකාවක් වනු ඇත. සූර්ය කෝෂ තාක්ෂණය මඟින් නිපදවන විදුලිය ගබඩා කිරීමේ තාක්ෂණය අනාගත බලශක්ති ගැටළුවට තිරසාර විසඳුමක් වනු ඇති බව මම විස්වාස කරමි.

දිවයිනෙහි තිරසර බලශක්ති මුලපිරීම් සිදු කිරීම සඳහා ලබාදුන් සහයෝගය වෙනුවෙන් විදුලිබල සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයාට සහ සියලු පාර්ශවකරුවන්ට මාගේ හෘදයාංගම ස්තුතිය පළ කර සිටිමි.



**කීර්ති වික්‍රමරත්න**

සභාපති


## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



බලශක්ති තිරසාරකත්වය උදෙසා මග පෙන්වන ප්‍රධාන ජාතික ආයතනය වන්නේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියයි (ශ්‍රීලසුබඅ). ශ්‍රීලසුබඅ 2007 වර්ෂයේදී ස්ථාපිත කර ඇති අතර, එය දිවයිනෙහි බලශක්ති ගමන් මගෙහි වැදගත් සන්ධිස්ථානයකි. බලශක්තිය තර්කාන්විතව භාවිතා කිරීම කෙරෙහි ගෝලීය අවධානය ක්‍රමයෙන් යොමු වෙමින් පවතින බව අවබෝධ කර ගනිමින්, සුනිත්‍ය බලශක්තියෙහි මුලපිරීම් සමග සමස්ත දිවයිනම අනුගත වීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් අපට සතුටු විය හැක. මේ දක්වා ක්‍රියාවට නංවා ඇති ක්‍රියාකාරකම් මගින් අනාගතයේදී ශ්‍රී ලංකාවට මෙම විෂය සම්බන්ධයෙන් ප්‍රමුඛ රටක් වීම සඳහා අවශ්‍ය වටපිටාව සකස් කර දී ඇත.

පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කළමනාකරණය යන ප්‍රධාන තේමා දෙකක් යටතේ මෙන්ම දැනුම සහ උපාය මාර්ගික විෂය පථයන්හි ක්‍රියාවට නංවන ලද වැඩසටහන් සමගින් සහ සමාලෝචිත වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම් සමගින් 2016 වර්ෂයේදී ශ්‍රීලසුබඅ හි ක්‍රියාකාරකම්වල විශිෂ්ට ප්‍රගතියක් සනිටුහන් කිරීම සම්බන්ධයෙන් අපට සතුටු විය හැක. මේ වසර තුළ මෙගාවොට් 53 ක නව පුනර්ජනනීය බලශක්ති ධාරිතාවක් එකතු කරන ලද අතර 2016 වසර අවසානය වන විට සමස්ත ධාරිතාව මෙගාවොට් 518 ඉක්මවීමත් සමගින් විදුලිබල උත්පාදනයෙන් 10% ක් නව පුනර්ජනනීය බලශක්ති සම්පත් භාවිතා කිරීමෙන් සිදු කිරීමේ මුල් ඉලක්කය පසු කර යා හැකි විය. මේ හා සමානව, නියාමන සහ පහසුකම් සැපයීමේ මැදිහත්වීම් ආකාරයෙන් සිදු කරන බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන් තුළින් කර්මාන්ත, වාණිජ සහ ව්‍යවස්ථාපිත ආයතනවල මෙන්ම ගෘහස්ථ ක්ෂේත්‍රයේ ක්‍රියාවට නංවන ලද වැඩසටහන් හරහා විදුලිය, ඉන්ධන තෙල් සහ දර භාවිතා කිරීමේ සැලකිය යුතු අඩු වීමක් සාක්ෂාත් කර ගැනීමට හැකි වී ඇත. මේවාට අමතරව, අනාගත ඉලක්කයක් ඇතිව, විශේෂයෙන් ප්‍රතිපත්ති, උපාය මාර්ග, පර්යේෂණ සහ සංවර්ධන සහ දැනුවත්භාවය ඇති කිරීමෙහි ක්‍රියාවට නංවන ලද වැඩසටහන් මගින් කෙටි කාලීන අනාගතයෙහි මෙන්ම දීර්ඝ කාලීනව තේමාත්මක ක්ෂේත්‍ර දෙකෙහිම විෂය පථය ඉහළ නැංවීම සඳහා උපකාරී වන තත්ත්වයක් ඇති කරනු ඇත.

දිවයිනෙහි තිරසර බලශක්ති සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම සඳහා සහයෝගය ලබා දුන් සියලු පාර්ශවකරුවන්ට මාගේ හෘදයාංගම ස්තූතිය පළ කර සිටීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. බලශක්ති තිරසාරකත්වය උදෙසා දිවයිනට ඉදිරි වැඩ කටයුතු රාශියක් සිදු කිරීමට ඇති බැවින් අපගේ අනාගත සාර්ථකත්වය සඳහා සියළු පාර්ශවයන්ගේ අඛණ්ඩ සහයෝගය ප්‍රධාන අවශ්‍යතාවයක් වේ. බලශක්ති තිරසාරකත්වය උදෙසා දිවයින රැගෙන යන අනාගත වැඩසටහන් සඳහා සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන මෙන් මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමි.



එම්.එම්.ආර්. පත්මසිරි
අධ්‍යක්ෂ ජනරාල්

# අපගේ දැක්ම

බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක්

# අපගේ මෙහෙවර

ගවේෂණය, සුසාධනය, පහසුකම් සැපයීම, පර්යේෂණ සහ සංවර්ධන මෙන්ම දැනුම් කළමනාකරණය තුලින් දේශීය බලශක්ති ප්‍රභව සංවර්ධනයට සහ බලශක්ති සම්පත් ඉතිරි කරගැනීමටත් සිදු කෙරෙන්නා වූ ජාතික ව්‍යායාමයට මඟ පෙන්වීම සහ එමඟින් ස්වාභාවික, මානව සහ ආර්ථික සම්පත් සුරකිමින් ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීමට මඟ සැලසීම.

**<u>ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කාර්ය සාධනය</u>**

ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්ති හා උපාය මාර්ගයන් ජාතික හා පෞද්ගලික දෘෂ්ටිකෝණයෙන් බලශක්ති සුරක්ෂිතතාව කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. සෑම පුරවැසියෙකුටම විශ්වසනීය, දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය ලබා ගැනීමට හැකි වන තත්ත්වයක් මෙම ප්‍රතිපත්තිය මඟින් අපේක්ෂා කරයි.

දිවයිනෙහි සියලු ආකාරයේ පුනර්ජනනීය බලශක්ති යොදාගැනීම ඉහළ නැංවීම සහ සුනිත්‍ය භාවිතය ප්‍රවර්ධනය කරනු ලබන ප්‍රධාන රාජ්‍ය ආයතනය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියයි (ශ්‍රීලසුබඅ). විශේෂයෙන්ම දැරිය හැකි මිලකට මුළු දිවයිනටම විදුලිය සැපයීම සහ තාප විදුලිබල උත්පාදනය සඳහා ආනයනය කරනු ලබන පොසිල ඉන්ධන මත දැඩි ලෙස රඳා පැවතීම හේතුවෙන් ආර්ථිකය කෙරෙහි දැඩි අහිතකර බලපෑම් එල්ලවීමට අදාළව ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය වර්තමානයේ බොහෝ අභියෝගවලට මුහුණ දී සිටී. මෙම තත්ත්වය මැඩපැවැත්වීම සඳහා රජය පහත සඳහන් ඉලක්ක පිහිටුවා ඇත;

- ආනයනය කරන ලද පොසිල ඉන්ධන සඳහා විකල්පයක් වශයෙන් වර්ෂ **2020** දී නව පුනර්ජනනීය බලශක්ති (**NCRE**) ප්‍රභවයන් මඟින් ජාල විදුලියෙන් **20%** ක් නිපදවීම.
- බලශක්ති සංරක්ෂණ ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීම තුළින් වර්ෂ **2020** වනවිට මුළු බලශක්ති පරිභෝජනයෙන් **10 %** ක් අඩු කිරීම.

වසර **2020** වනවිට **NCRE** භාවිතා කර **20 %** ක් විදුලිය නිපදවීමක් අත්පත් කර ගැනීමේ ගමනේ සතුටුදායක කඩඉමක් සනිටුහන් කරමින් මේ වනවිට මුළු විදුලිබල උත්පාදනය තුළ නව පුනර්ජනනීය බලශක්ති එක්කිරීම **10%** සීමාව ඉක්මවා යාමට හැකි වී තිබේ.

බලශක්ති සංරක්ෂණ ක්ෂේත්‍රය තුළ නියාමන මැදිහත්වීම් හා බලශක්ති කාර්යක්ෂමතා සේවා අංශය ශක්තිමත් කිරීම ඉලක්ක කර ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. 2016 දී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන යටතේ ගිගාවොට් පැය 38 ක විදුලි බලශක්තියක්, ඩීසල් ලීටර් මිලියන 14 ක් සහ ඉන්ධන දැව කිලෝග්‍රෑම් මිලියන 27.2 ක් ඉතිරි කර ගැනීමට හැකි විය.

පහත සඳහන් කර ඇති පරිදි තේමාත්මක ක්ෂේත්‍ර **4** ක් යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී.

- පුනර්ජනනීය බලශක්ති සංවර්ධන – ජාතික පුනර්ජනනීය බලශක්ති ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ඍජු දායකත්වය ලබා දීම මෙහි අරමුණ වේ.

  **(විශේෂිත තේමාව: REACT – පුනර්ජනනීය බලශක්ති ක්‍රියාමාර්ග)**
- බලශක්ති සංරක්ෂණය සහ කළමනාකරණය – ජාතික බලශක්ති සංරක්ෂණ ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ඍජුවම මැදිහත් වීම අරමුණු වේ.

  **(විශේෂිත තේමාව: EnMaP – බලශක්ති කළමනාකරණ සැලැස්ම)**
- දැනුම කළමනාකරණය – බලශක්ති දැනුවත් සමාජයක් සඳහා බලශක්ති අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙහි අරමුණයි.

  **(විශේෂිත තේමාව: SEEK – බලශක්ති දැනුම තුළින් තිරසාර බල ශක්තිය)**
- ක්‍රමෝපාය – දිවයිනෙහි දිගුකාලීන තිරසර බලශක්ති සංස්ථාපනයකට සහාය දීම සඳහා ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සකස් කිරීම, පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම්, තාක්ෂණික සංවාද, ආදිය සිදු කිරීම මෙහි අරමුණයි.

  **(විශේෂිත තේමාව: SAFE – අනාගත බලශක්ති සඳහා තිරසර ප්‍රවේශය)**

2016 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත සඳහන් කර ඇත.

**2016 වර්ෂයේ කාර්ය සාධනය**

| අංකය | ක්‍රියාකාරකමෙහි විස්තරය (ප්‍රධාන සාක්ෂාත් කර ගැනීම්) |
|---|---|
| | ***පුනර්ජනනීය බලශක්ති සංවර්ධන (REACT යටතේ)*** |
| **1** | <u>සම්පත් වෙන්කිරීම සහ සංවර්ධන ක්‍රියාකාරකම්</u><br>දේශීය පුනර්ජනනීය බලශක්ති සම්පත් වාණිජ පරිමාණයේ ව්‍යාපෘති බවට සංවර්ධනය කිරීම වේගවත් කිරීම සඳහා ජාලගත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා බලශක්ති බලපත්‍ර නිකුත් කිරීම (EP) සහ තාවකාලික අනුමැතීන් (PA) නිකුත් කිරීම ශ්‍රීලසුබඅ මගින් සිදුකෙරේ. 2016 වර්ෂය අවසන් වනවිට ජාලගත කරන ලද ව්‍යාපෘතිවල සාරාංශයක් පහත දැක්වේ.<br><br>**පුනර්ජනනීය බලශක්ති ප්‍රභවය** \| **ව්‍යාපෘති සංඛ්‍යාව** \| **ස්ථාපිත ධාරිතාවය**<br>ජල \| 170 \| මෙ.වො. 340<br>සුළං \| 15 \| මෙ.වො. 128.45<br>ජෛවස්කන්ධ \| 9 \| මෙ.වො. 28.6<br>සූර්ය \| 5 \| මෙ.වො. 21.36<br><br>2016 වර්ෂයේදී පුනර්ජනනීය බලශක්තිය භාවිතා කරමින් සිදු කළ මුළු විදුලි උත්පාදනය ගි.වො.පැ. 1,169 කි. |
| **2** | <u>ප්‍රගති අධීක්ෂණය</u><br>මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ සංවර්ධකයින්ට සිය ව්‍යාපෘති කිසිදු ප්‍රමාදයකින් තොරව සාර්ථක ලෙස ඉදිරියට ගෙන යාම සඳහා සහාය වීමයි.<br>✓ PA සහ EP නිකුත් කළ සියලුම ව්‍යාපෘතිවල ප්‍රගතිය කාර්තුමය වශයෙන් නිරීක්ෂණය කරනු ලබන අතර එම ව්‍යාපෘති ජාලගත කිරීමට අදාළ ගැටලු විසඳීම සඳහා ඔවුන්ට සහාය වේ.<br>ඊට අමතරව මෙම වැඩසටහන යටතේ ජාල සම්බන්ධිත ව්‍යාපෘතිවල කාර්ය සාධනය පරීක්ෂා කෙරේ. |
| **3** | <u>තාක්ෂණ සංවර්ධන සහ පර්යේෂණ</u><br>ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති සම්පත් විභවතාවය සිතියම්ගත කිරීමේ අරමුණින් ශ්‍රීලසුබඅ විසින් තාක්ෂණික සංවර්ධන හා පර්යේෂණ ක්‍රියාකාරකම් සිදුකරනු ලැබේ. පුනර්ජනනීය බලශක්ති (තාප හා විදුලිය) සඳහා මාර්ග සිතියමක් නිර්මාණය කිරීම සඳහා යෙදවුම් ලබා දීමේ අරමුණින් සූර්ය, සුළං, කුඩා ජල විදුලි, ජෛවස්කන්ධ සහ රළ ශක්තිය, කෘෂිකාර්මික අපද්‍රව්‍ය, නාගරික ඝන අපද්‍රව්‍ය පිළිබඳ අධ්‍යයන සිදු කරමින් පවතී. තවද, තාප ගබඩා පද්ධති වැනි මතුවට එන තාක්ෂණයන් සඳහා සම්පත් සමීක්ෂණ තාක්ෂණික ඇගයීම් සිදුකරනු ලැබේ. මේ සම්බන්ධයෙන් අවසන් කළ සමහර ක්‍රියාකාරකම් වන්නේ, |

- ✓ උතුරු පළාතේ නව සුළං මැනීමේ කුළුණු 3ක්, යාපනය අර්ධද්වීපයේ, පූනරීන්, පොන්නලෛයි සහ මුලතිව් කෝකිලායි ප්‍රදේශයේ ස්ථාපිත කරන ලදී.
- ✓ යාපනය අර්ධද්වීපයේ සහ ඊසාන දිග වෙරළ තීරයේ සුළං බලශක්ති ධාරිතාවය ඇගයීම සඳහා පරිගණක දත්ත පාදක විශ්ලේෂණයක් සිදු කරන ලදී. මුළු ධාරිතාවය මෙ.වො. 345 ක් වන ස්ථාන 25 ක් හඳුනාගන්නා ලදී.
- ✓ වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමඟ ජෛවස්කන්ධ වැඩසටහන සම්පූර්ණ කරන ලදී. ආසන්න වශයෙන් ඒකක 100 ක් ස්ථාපිත කෙරිණි.

<u>පුනර්ජනනීය බලශක්ති සේවාවන්</u>

ග්‍රාමීය ප්‍රජාව, ගෘහස්ථ, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සහ කෘෂිකර්මාන්ත අංශ සඳහා බලශක්ති සේවාවන් සැපයීම වැඩි දියුණු කිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති තුළින් ශ්‍රීලසුබඅ මැදිහත්වීම් සිදු කර ඇත.

I. ජාලයෙන් පිටත විසඳුම් යොදාගනිමින් ජාතික ජාලය සඳහා ප්‍රවේශයක් නොමැති ප්‍රදේශ සඳහා විදුලි බලය ලබා දීම. (සුනිත්‍යාලෝක)

II. කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය සහ ග්‍රාමීය කර්මාන්ත සඳහා පුනර්ජනනීය බලශක්ති (RE) විසඳුම් ලබා දීම.

III. ලංවිම (CEB) සහ ලවිපෞස (LECO) සමඟ සහයෝගිත්වයෙන් "සූර්යබල සංග්‍රාමය" සංකල්පය ක්‍රියාවට නැංවීම.

IV. මූලික බලශක්ති අවශ්‍යතාවයන් සඳහා පවතින තාක්ෂණික ක්‍රමවේද ඇගයීම සහ පුනර්ජනනීය බලශක්ති (RE) විසඳුම් හඳුන්වාදීම (පළාත් ජීව වායු වැඩසටහන)

2016 වර්ෂයේදී නිම කර ඇති ක්‍රියාකාරකම් පහත සඳහන් වේ;

- ✓ උච්චමුනායි සහ කල්පිටිය ගම්මානවල ගෘහස්ථයන් සඳහා ගෘහස්ථ සූර්ය බලශක්ති පද්ධති 167 ක් ස්ථාපිත කිරීම නිම කර ඇත.

- ✓ බලශක්ති කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් ආදිවාසී ප්‍රජාව දැනුම්වත් කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ඔවුන්ට කාර්යක්ෂම ලිප් සහ බලශක්ති කාර්යක්ෂමතා LED විදුලි පහන් හඳුන්වාදීම සිදු කෙරිණි.

- ✓ ජල විදුලි සංවර්ධනය සඳහා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවනු ලබන ඉඳුරාන "හරිත ගම්මාන වැඩසටහන" දියත් කරන ලදී. දැනුම පුළුල් කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර කාර්යක්ෂම ලිප් සහ බලශක්ති කාර්යක්ෂමතා LED විදුලි පහන් (විදුලි පහන් 2,000) හඳුන්වාදීම සිදු කෙරිණි.

- ✓ ජාල මනුකරණ යෝජනා ක්‍රමය යටතේ ආගමික ස්ථාන සඳහා සූර්යබල පද්ධති 29 ක් ස්ථාපිත කරන ලදී.

- ✓ අනුරාධපුර ශ්‍රී මහා බෝධිය වාහන අංගනයේ සූර්ය වීදි ලාම්පු 30 ක් ස්ථාපිත කරන ලදී.

- ✓ ප්‍රදර්ශක ව්‍යාපෘතියක් ලෙස උම්බලකඩ වේලීම සඳහා දෙවිනුවර, හම්බන්තොට සහ වැලිගත්ත ප්‍රදේශ වල ධීවර සමිති සඳහා පරිසර හිතකාමී, අඩු වියදම් ජෛවස්කන්ධ වියළීමේ යන්ත්‍ර හඳුන්වාදෙන ලදී.

- ✓ කිලිනොච්චියේ පිහිටි යාපනය විශ්වවිද්‍යාලයේ "පුනර්ජනනීය බලශක්ති උද්‍යානය" සඳහා සහ හම්බන්තොට පිහිටි කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි-තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය සඳහා ජෛවස්කන්ධ වියළීමේ යන්ත්‍ර දෙකක් සැපයීම, ස්ථාපිත කිරීම සහ ජාලගත කිරීම සිදු කරන ලදී.

- ✓ 2016 සැප්තැම්බර් මස 06 වන දින "සූර්යබල සංග්‍රාමය" සංකල්පය උත්සවාකාරයෙන් දියත් කෙරිණි.

- ✓ ජාල සම්බන්ධිත සූර්ය බලශක්ති PV පද්ධති සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති කාර්ය සංග්‍රහය –SLS1522 සකස් කර ප්‍රසිද්ධියට පත් කෙරිණි.

- ✓ "සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා (PV) පද්ධතිය සඳහා ආයෝජනය කිරීමේ ගෘහස්ථ හිමිකරු මාර්ගෝපදේශ සංග්‍රහය" නමින් හැඳින්වෙන මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

- ✓ සූර්ය පියසි පද්ධති ස්ථාපිත කිරීම සඳහා රජයේ ආයතනවලට ස්ථානීය පරීක්ෂාව, පිරිවිතර/ ලංසු ලියවිලි සකස් කිරීම, TEC සඳහා සේවය ලබාදීම ආදිය ඇතුළු තාක්ෂණික සහාය ලබා දීම සිදු කරන ලදී.

- ✓ සූර්ය පියැසි පද්ධති ස්ථාපිත කිරීමේ නිරත වූ නව සූර්ය සේවා සැපයුම්කරුවන් 50 දෙනෙකු ලියාපදිංචි කිරීම සිදු කරන ලදී. සම්පූර්ණ සැපයුම්කරුවන්ගේ ලියාපදිංචි ප්‍රමාණය මේ වනවිට 152 ක් වේ.

- ✓ බලශක්ති කළමනාකරුවන්, ග්‍රාමීය සංවර්ධන නිලධාරින් සහ වයඹ පළාත් සභාවේ රියදුරන් සහ මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේ කාර්ය මණ්ඩලය ඇතුළු සාමාන්‍ය කාර්යාල නිලධාරින් සඳහා පුහුණු/ දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.



උතුරු මැද පළාතේ ජෛවස්කන්ධ ස්ථාපිත කිරීම



ආගමික ස්ථාන සඳහා සූර්ය විදුලිබලය හඳුන්වා දීම

<table>
<tr><td></td><td><br>කල්පිටිය දූපත් සඳහා ගෘහස්ථ සූර්ය බල පද්ධති<br><br>යාපනය විශ්වවිද්‍යාලය සඳහා ජෛවස්කන්ධ වියළීමේ යන්ත්‍ර පරිත්‍යාග කිරීම</td></tr>
<tr><td>5</td><td><u>ආධාර සපයන්නන් විසින් අරමුදල් ලබා දුන් ව්‍යාපෘති</u><br><br>ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් අරමුදල් සැපයූ ප්‍රධාන පුනර්ජනනීය බලශක්ති (RE) සංවර්ධන ව්‍යාපෘති දෙකක් ශ්‍රීලසුබඅ විසින් ආරම්භ කර තිබූ අතර මේ වනවිටත් සිදු කරගෙන යනු ලැබේ. එම ව්‍යාපෘති දෙක වන්නේ,<br>1. සූර්ය පියසි විදුලිබල උත්පාදන ව්‍යාපෘතිය<br>2. වතු ක්ෂුද්‍ර ජල විදුලි පුනරුත්ථාපන සහ නැවත බලගැන්වීමේ ව්‍යාපෘතිය.<br><br>සූර්ය පියසි විදුලිබල උත්පාදන ව්‍යාපෘතිය<br>මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශ වෝල්ටීයතාවය පදනම් කරගත් විදුලිබල උත්පාදනය උත්ප්‍රේරණය කිරීම සහ ජනප්‍රිය කරවීමේ අරමුණින් ශ්‍රීලසුබඅ විසින් රාජ්‍ය සහ පෞද්ගලික අංශ, ආයතනවල සූර්ය PV නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ. රාජ්‍ය අංශ ආයතන සඳහා විශ්වවිද්‍යාලවල ඉංජිනේරු පීඨ මූලික වශයෙන් ඉලක්ක කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම් පහත දක්වා ඇත,<br>✓ ජාතික ජාලය සඳහා 200 kWp එක් කරමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය සහ යාපනය විශ්වවිද්‍යාලයේ සූර්ය PV පියසි පද්ධති 4 ක් ස්ථාපිත කිරීම.<br>✓ ජාතික ජාලය සඳහා 800 kWp එක් කරමින් පෞද්ගලික අංශ ආයතනයන්හි සූර්ය PV පියසි පද්ධති 11ක් ස්ථාපිත කිරීම.<br><br>කොග්ගල බ්‍රැන්ඩික්ස් ආයතනයේ 100kWp සූර්ය පද්ධතියක් ස්ථාපිත කිරීම<br><br>පැලියගොඩ MJF Teas හි 100kWp සූර්ය පද්ධතියක් ස්ථාපිත කිරීම</td></tr>
</table>



පල්ලෙකැලේ මාස් හෝල්ඩින්ග්ස් ආයතන පරිශ්‍රයේ 100 kWp සූර්ය පද්ධතියක් ස්ථාපිත කිරීම



යාපනය විශ්වවිද්‍යාලයේ 60 kWp සූර්ය පද්ධතියක් ස්ථාපිත කිරීම

**වතු ක්ෂුද්‍ර ජලවිදුලි පුනරුත්ථාපන සහ නැවත බලගැන්වීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය යටතේ වත්තල ප්ලාන්ටේෂන්ස් පීඑල්සී ට අයත් ස්ට්‍රැත්ඩන් වතුයායේ අත්හැර දමා තිබූ 50 kWp ක්ෂුද්‍ර ජල විදුලි ව්‍යාපෘතියක් පුනරුත්ථාපනය කරන ලදී.








ස්ට්‍රැත්ඩන් වතුයායේ ක්ෂුද්‍ර ජලවිදුලි ව්‍යාපෘතිය

UNDP/GEF/FAO ආධාර සැපයූ 'තිරසර ජෛවස්කන්ධ බලශක්ති උත්පාදනය සහ නවීන ජෛව-බලශක්ති තාක්ෂණ ප්‍රවර්ධනය කිරීම' සහ 'ශ්‍රී ලංකාවේ බලශක්ති උත්පාදනයේ සහ භාවිතයේදී විමෝචනය වන වායු අවම කිරීම සඳහා වන ක්‍රියාමාර්ග' යන මැයෙන් යුත් ව්‍යාපෘති ක්‍රියාවට නැංවෙමින් පවතින අතර ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ නියාමන වශයෙන් ශ්‍රීලසුබඅ ක්‍රියා කරයි. පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇත.

**'තිරසර ජෛවස්කන්ධ බලශක්ති නිෂ්පාදනය සහ නවීන ජෛව-බලශක්ති තාක්ෂණ ප්‍රවර්ධනය කිරීම'**

- ජෛවස්කන්ධ බලශක්ති පර්යන්ත 6 ක් සඳහා යෝජනා කැඳවන ලද අතර ස්ථාන 3 ක් (කුරුණෑගල, රත්නපුර සහ ගාල්ල) සඳහා ආයෝජකයෙකු තෝරා ගන්නා ලදී. තෝරාගත් ආයෝජකයා විසින් ජෛවස්කන්ධ පර්යන්ත පිහිටුවීම සිදු කරගෙන යනු ලැබේ. මෙම පර්යන්ත මඟින් ජෛවස්කන්ධ

වටිනාකම් එක් කළ ආකාරකට පරිවර්තනය කරනු ඇති අතර එහි තොරතුරු හුවමාරු දත්ත සමුදා පද්ධතියක්ද (වර්ධනය - සැපයුම් - පරිභෝජක) පවතී. මෙම පර්යන්ත 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වනු ඇත.

- ජෛවස්කන්ධ බලශක්ති තාක්ෂණ ප්‍රදර්ශක ව්‍යාපෘති 15ක් ක්‍රියාවට නැංවන ලද (මහා පරිමාණයේ ව්‍යාපෘති 3 ක් සහ කුඩා සහ මධ්‍ය පරිමාණයේ ව්‍යාපෘති 12 ක්) අතර ඉහත සියලු ප්‍රදර්ශක ව්‍යාපෘති සඳහා අධීක්ෂණ, වාර්තාකරණ සහ සත්‍යාපන පද්ධති සකස් කර ඇත. ඊට අමතරව, ඉදිරියේදී ක්‍රියාවට නැංවීමට නියමිත ඉන්ධන මාරු කිරීමේ ව්‍යාපෘති සඳහා ශක්‍යතා අධ්‍යයන 12 ක් සම්පූර්ණ කර ඇත. මෙම වැඩසටහන, දේශීය පර්යේෂණ සහ සංවර්ධන ව්‍යවසායකයන්ට ඔවුන්ගේ ජෛවස්කන්ධ බලශක්ති තාක්ෂණ සම්බන්ධ නව්‍යකරණ නිෂ්පාදන සඳහා වැඩි වෙළඳපොළක් අත්පත් කර ගැනීම සඳහාද සහාය දක්වා ඇත.
    - සම මූල්‍යකරණ ආයෝජන ලීවරණය ඇ.එ.ජ. ඩොලර් මිලියන 5.7 ක් පමණ වේ.
    - සෘජු විමෝචන අඩු කිරීම වර්ෂයකට කාබන්ඩයොක්සයිඩ් ටොන් 11,426 ($tCO_2$/yr).
- ප්‍රදර්ශක ව්‍යාපෘති අදියර II ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රී ලංකා කාළගුණික අරමුදල සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කර ඇත.
    - නව ඉන්ධන මාරු ප්‍රදර්ශක ව්‍යාපෘති >10 (මේ දක්වා විශාල 4 , SMIs 6)
    - නව ව්‍යාපෘති මඟින් අපේක්ෂිත සම මූල්‍යකරණ ලීවරණය- > ඇ.ඩො.මිලියන 2.2
    - සෘජු විමෝචන අඩුවීම >13,040 $tCO_2$/yr








ව්‍යාපෘතිය මඟින් ක්‍රියාවට නැංවූ ජෛවස්කන්ධ බලශක්ති ප්‍රදර්ශක කිහිපයක්

- පසුගිය වර්ෂයේ සිදු කරන ලද මූලික අධ්‍යයන වලංගු කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ වලංගු කිරීමේ වැඩමුළු දෙකක් පවත්වන ලද අතර උපදේශන වාර්තා සකස් කර සම්පූර්ණ කරන ලදී.

- වර්තමාන වනාන්තර කළමනාකරණ සැලැස්මෙහි අඩුපාඩු සම්බන්ධයෙන් අදහස් ලබා ගැනීම සඳහා සහ වතු ක්ෂේත්‍රයේ සුමට වාණිජ/ සංරක්ෂණ වන කළමනාකරණයක් සහතික කිරීම සඳහා ඵලදායී ක්‍රියාවට නැංවීමේ සහ අධීක්ෂණ වැඩපිළිවෙළක් යෝජනා කිරීම සඳහා ප්‍රාදේශීය වැවිලි සමාගම් හි වන කළමනාකරණය පිළිබඳ ඒකාබද්ධ චක්‍රලේඛයක් කෙටුම්පත් කරන ලදී.
- තිරසර ලෙස නිෂ්පාදනය කරන ලද ඉන්ධන දැව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ සකස් කර අවසන් කරන ලද අතර කොමිෂන් සභා අනුමැතිය ලබා ගෙන ඇත. ක්ෂේත්‍රයේදී ප්‍රමිත පරීක්ෂා කිරීම සඳහා විස්තීර්ණ විගණක පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ හෙක්ටයාර 100 ක දැව ඉන්ධන වගා කිරීමේ නියමු ආකෘති පිහිටුවමින් පවතී.
  - ඉන්ධන දැව - හෙක්ටයාර 50; ප්‍රජා ඉන්ධන දැව - හෙක්ටයාර 50.
  - ඉන්ධන දැව වගා කිරීම සඳහා ප්‍රාදේශීය වැවිලි සමාගම්, රාජ්‍ය නොවන සංවිධාන/ ප්‍රජා මූල සංවිධාන සහ රබර් පර්යේෂණ ආයතනය සමඟ සමඟ ගිවිසුම් අත්සන් කිරීමට නියමිතය.
- ජෛවස්කන්ධ නිෂ්පාදනය කිරීම සහ සැපයීම සඳහා පුහුණු අවශ්‍යතා ඇගයීම සිදු කර ඇත.
- පවතින දැව ඉන්ධන සම්පත් පිළිබඳ තොග ගැනීමේ සහ දත්ත සමුදාය සම්පූර්ණ කර ඇත.




**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විවිධ වර්ධන ආකෘති නියමු පරීක්ෂණ සිදු කිරීම**

- පරිභෝජකයන්, රාජ්‍ය අංශ පාර්ශවකරුවන්, වතු සමාගම් සහ මූල්‍ය ආයතන සඳහා දකුණු, මධ්‍යම, වයඹ සහ ඌව පළාත්වල වැඩමුළු සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

**2016 කාර්ය සැලසුමෙහි විශේෂතා – ප්‍රධාන ක්‍රියාකාරකම්**

- අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගනිමින් පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ අන්තර් අමාත්‍යාංශ නිලධාරි කමිටුව පිහිටුවීම.
- ජෛවස්කන්ධ බලශක්ති ක්ෂේත්‍රයට සහාය දැක්වීම සඳහා වැදගත් ප්‍රතිපත්තිමය තීරණ හඳුනාගැනීම සහ සකස් කිරීම.
- ජෛවස්කක්ධ බලශක්ති පර්යන්ත සහ සැටලයිට් සැපයුම් පද්ධති ස්ථාපිත කිරීම.
- ඉන්ධන දැව සැපයුම් කර්මාන්තය සඳහා ඵලදායී ප්‍රතිපත්ති සහ දිරිදීමනා යෝජනා ක්‍රම පිළිබඳ නිර්දේශ කෙටුම්පත් කිරීම.
- ඉන්ධන දැව වගා කිරීමේ ආකෘති ස්ථාපිත කිරීම අඛණ්ඩව සිදු කිරීම.
- තිරසර ලෙස නිෂ්පාදනය කළ ඉන්ධන දැව සඳහා නිර්ණායක සහ දර්ශක නිකුත් කිරීම.

| | |
|---|---|
| | ○ තාක්ෂණ ප්‍රදර්ශක ව්‍යාපෘති - අදියර II අඛණ්ඩව සිදු කිරීම සහ සම්පූර්ණ කිරීම.<br>පුහුණු, දැනුවත් කිරීම් සහ මාධ්‍ය ප්‍රචාරක වැඩසටහන් පැවැත්වීම සහ තාක්ෂණ ප්‍රදර්ශනය පිළිබද වාර්තාමය වීඩියෝ පටයක් සකස් කිරීම.<br><br>**"ශ්‍රී ලංකාවේ බලශක්ති උත්පාදනයේ සහ භාවිතයේදී විමෝචනය වන හරිතාගාර වායු අවම කිරීමේ ක්‍රියාමාර්ග" සඳහා ව්‍යාපෘතිය (NAMA)**<br><br>○ අපේක්ෂිත ජාතිකව නිශ්චය කළ දායකත්වයන් (Intended Nationally Determined Contribution - INDCs) සඳහා යෝග්‍ය අධීක්ෂණය, වාර්තාකරණය සහ තහවුරු කර ගැනීම (Monitoring, Reporting, Verification – MRV) යාන්ත්‍රණයක් ලෙස සහ NDCs සපුරා ගැනීම උදෙසා ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට අරමුදල් ලබා ගැනීමේ අවශ්‍යතාවයන් ලිවරණය කිරීමට සහාය දක්වනු ලබන ව්‍යාපෘති මූල්‍යකරණ යාන්ත්‍රණයක් ලෙසද භාවිතා කළ හැකි මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. 2015 සිට 2018 දක්වා වර්ෂ 4 ක ව්‍යාපෘතියක් යටතේ තාක්ෂණයන් මඟින් ශ්‍රී ලංකාවේ NDCs සඳහා අවශ්‍ය MRV රාමුව පිහිටුවීමට අපේක්ෂා කෙරේ. MRV රාමුව සඳහා නියමු ව්‍යාපෘති ලෙස භාවිතා කරනු ලබන වර්ග තුනක ව්‍යාපෘති ඒ යටතේ ක්‍රියාත්මක කරනු ඇත. ඒවා නම්,<br>1. ආරම්භයේදී පළාත් 5 ක ජීව වායු ඒකක 1,000<br>2. තේ කර්මාන්තශාලා වල ඉහළ කාර්යක්ෂමතාවයෙන් යුත් මෝටර් 1,300 සහ<br>3. බැටරි ගබඩාකිරීම් සමඟ සූර්ය විදුලිබල ජනන පද්ධති 150<br><br>○ තේ කර්මාන්තයේ ඉහළ කාර්යක්ෂමතාවයක් සහිත මෝටර් ස්ථාපිත කිරීම සඳහා තාක්ෂණ සැපයුම්කරුවන් හය දෙනෙකු තෝරා ගන්නා ලදී. කර්මාන්තශාලා 5 ක ඉහල කාර්යක්ෂමතාවයෙන් යුත් මෝටර් 23 ක් සහ විචල්‍ය සංඛ්‍යාත ධාවක 5 ක් ස්ථාපිත කිරීම නිම කර ඇත.<br>○ සූර්ය විදුලිබල පද්ධති සේවා සැපයුම්කරුවන් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ප්‍රතිලාභීන් තෝරා ගැනීම සම්පූර්ණ කර ඇත.<br>○ කුරුණෑගල සහ කෝට්ටේ හරිත කලාපයන්හි පද්ධති 14 ක් ස්ථාපිත කරමින් පළමු අදියර සඳහා ස්ථාපනය කිරීම් ආරම්භ කරනු ඇත.<br>○ පළාත් 5 ක ජීව වායු වැඩසටහන ක්‍රියාවට නැංවීම සඳහා අවබෝධතා ගිවිසුම් සකස් කර මෙහෙයුම් කමිටු පත් කර ඇත. දෙසැම්බර් මාසය දක්වා ඉල්ලුම්පත් 380 කට වඩා ලැබී ඇත. සමාලෝචනය කිරීම සඳහා ඉල්ලුම්පත් 291 ක් තෝරාගෙන ඇති අතර මේ වනවිට පද්ධති 40 ක් ඉදිකරමින් පවතී. තවද, වයඹ සහ දකුණු පළාත්වල අවස්ථා තත්ත්ව විශ්ලේෂණයක් සිදු කර ඇත. ඉදිකරන ලද ජීව වායු පද්ධති සත්‍යාපනය කිරීම සඳහා තත්ත්ව සහතික කිරීමේ පද්ධතියක් සහ ක්‍රමවේදයක් සකස් කරන ලද අතර ජීව වායු පද්ධති ක්‍රියාවට නැංවීම, ක්‍රියාත්මක කිරීම සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම සඳහා ව්‍යාපෘති නිලධාරීන් 300 කට වඩා වැඩි සංඛ්‍යාවක් පුහුණු කරන ලදී. |









**NAMA ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද තාක්ෂණ ප්‍රදර්ශන කිහිපයක්**

- අන්තර්ජාතික උපදේශන කණ්ඩායමේ මෙහෙයුම් දෙකක් සහ සම්බන්ධිත ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලද අතර එහිදී අවම කිරීමේ විකල්ප (RE/ EE සහ වෙනත්) 17 ක් සඳහා මූලික ආන්තික අවකරණ පිරිවැය වක්‍ර (MACC) විශ්ලේෂණ සිදු කරන ලදී.

- බලශක්ති ක්ෂේත්‍රයේ හරිතාගාර වායු විමෝචනය සඳහා අවම කිරීමේ විකල්ප වල දීර්ඝ ලැයිස්තුව සඳහා MACC විශ්ලේෂණය 2017 වර්ෂයේ ජනවාරි මස ආරම්භ කිරීමට නියමිතය.



| | |
|---|---|
| | • බලශක්ති NAMAs සඳහා සාමාන්‍යකරණ අධීක්ෂණය, වාර්තාකරණය සහ තහවුරු කර ගැනීමේ රාමුව කෙටුම්පත් කරන ලදී. නියමු තාක්ෂණ 3ක් සඳහා MRV ක්‍රමවේද සකස් කර MRV පරාමිති හඳුනාගෙන ඇත – කෙටුම්පත් අදියර ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇත. |
| **6** | <u>බලශක්ති උද්‍යාන සංවර්ධනය කිරීම</u><br><br>භූ-කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකාවට පුනර්ජනනීය බලශක්ති සම්පත් ආකාර කිහිපයක් ස්වභාවිකව ලැබී ඇත. සූර්ය සහ සුළං බලශක්තිය එම ආකාරයන්ගෙන් කිහිපයකි. ශ්‍රී ලංකාව සමකය ආසන්න තීරුවෙහි පිහිටා ඇති බැවින්, වර්ෂය පුරා සූර්යාලෝකය ලැබේ. ඒ හා සමානව සර්ම කලාපීය උෂ්ණත්වය සහ ඉන්දියන් සාගරයෙහි දිවයින ස්ථානගතව ඇති ආකාරය අනුව බලවත් සුළං ප්‍රවාහ පවතී.<br>ශ්‍රීලසුබඅ විසින් සූර්ය විභවය පිළිබඳව මෑතකදී සිදු කරන ලද අධ්‍යයනවලින් මන්නාරම, අම්පාර, මොනරාගල, හම්බන්තොට, මුලතිව්, මඩකලපුව සහ පොලොන්නරුව දිස්ත්‍රික්කවල මුළු විභවය මෙ.වො. 1,100 ක් වන ස්ථාන 11 ක් හඳුනාගෙන ඇත. තවද, ජාතික පුනර්ජනනීය බලශක්ති පරීක්ෂණාගාරය (NREL) විසින් 2003 වර්ෂයේදී සම්පාදනය කරන ලද සුළං බලශක්ති සම්පත් සිතියම මඟින් හොඳ තත්ත්වයේ සිට විශිෂ්ට තත්ත්වය දක්වා සුළං සම්පත් පවතින කලාප 3 ක් හඳුනාගෙන ඇත. එම කලාප වන්නේ, කල්පිටිය අර්ධද්වීපයේ උතුරේ සිට මන්නාරම් දූපත් සහ යාපනය අර්ධද්වීය දක්වා වයඹ වෙරළබඩ කලාපය, දිවයින අභ්‍යන්තරයේ මධ්‍යම කඳුකර ප්‍රදේශය – වැඩි වශයෙන් මධ්‍යම පළාතේ සහ සබරගමුව සහ ඌව පළාත්වල සමහර ස්ථාන, ශ්‍රී ලංකාව තුළ හොඳ තත්ත්වයේ සිට විශිෂ්ට තත්ත්වය දක්වා සුළං සම්පත් 5,000km$^2$ පමණ පවතින බව අස්තමේන්තු කර ඇත. මුළු සුළං ප්‍රදේශයෙන් 4,100 km$^2$ ක් පමණ ගොඩබිම් ප්‍රදේශවල පවතී. සුළං සහිත ප්‍රදේශය ශ්‍රී ලංකාවේ මුළු වර්ග ප්‍රමාණයෙන් (65,600 km$^2$) 6% ක් නියෝජනය කරනු ලැබේ. වර්ග කිලෝමීටරයට මෙ.වො. 5 ක් ලෙස මධ්‍යස්ථ උපකල්පනයක් භාවිතා කළහොත් මෙම සුළං ප්‍රදේශයට මෙ.වො. 20,000 කට වඩා වැඩි ස්ථාපිත ධාරිතාවයක් ඇති කිරීමේ විභවයක් පවතී. මේ දක්වා මුළු ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 128 ක් වන අතර මෙ.වො. 101 ක තවත් බලාගාර ඉදිකරමින් පවතී.<br>මෑතකදී ADB ආධාර යටතේ උතුරු පළාතේ සිදු කරන ලද සුළං සම්පත් ඇගයීමේ ව්‍යාපෘතිය මඟින් මන්නාරම් කලාපයේ සුළං විභවය මෙ.වො. 375 ක් වන බව අනාවරණය වී ඇත. පුනරීන් කලාපය මෙ.වො. 100 කට වඩා වැඩි විභවයක් පවතින ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති තවත් ස්ථානයකි.<br>රාජ්‍ය සහ පෞද්ගලික අංශ සංවර්ධකයන්ට ප්‍රතිලාභ අත් කර දිය හැකි සැලසුම් කරන ලද සුළං සහ සූර්ය බලශක්ති සංවර්ධනයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2009 වර්ෂයේදී ශ්‍රීලසුබඅ විසින් "බලශක්ති උද්‍යාන" ඇති කිරීමේ අදහස පළමු වරට යෝජනා කරන ලදී. මෙම සන්දර්භය තුළ, ශ්‍රීලසුබඅ විසින් සම්පත් ඇගයීම්, ඉඩම් අත්පත් කර ගැනීම්, පාරිසරික සහ වෙනත් ව්‍යවස්ථාපිත නිෂ්කාශන ලබා ගැනීම සහ යටිතල ව්‍යුහ ඉදිකිරීම සිදු කරනු ඇත. අවසන් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල ඔවුන්ගේ විදුලි බලාගාර ඉදිකිරීම සඳහා තරඟකාරී ලංසු මඟින් ආයෝජකයන් තෝරා ගනු ලැබේ.<br>✓ මොනරාගල ප්‍රදේශයේ මෙ.වො. 100 ක සූර්ය බලශක්ති උද්‍යානයක් සඳහා විභවයක් සහිත ස්ථාන තුනක් හඳුනාගත් අතර කොටියාගල ප්‍රදේශයේ ස්ථානයක් තෝරා ගන්නා ලදී. ඉඩම් අත්පත් කර ගැනීම සඳහා මූලික සාකච්ඡා සිදු කරන ලද අතර ව්‍යාපෘති කාර්ය මණ්ඩලය තෝරා ගන්නා ලදී.<br>✓ පුනරීන් සුළං උද්‍යානය පිහිටුවීම සඳහා ස්ථානයක් හඳුනාගෙන ස්ථිර කර ඇත. සම්පත් ඇගයීම සම්පූර්ණ කරන ලදී. |

| | *බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම (EnMAP යටතේ)* |
|---|---|
| | **බලශක්ති කළමනාකරණ ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම තුළින් පහත සඳහන් සමස්ත බලශක්ති ඉතිරි කිරීම සාක්ෂාත් කරගැනීමට හැකිවී තිබේ.** |

| ප්‍රභවය | මුළු ඉතිරි කිරීම |
|---|---|
| විදුලිය | ගි.වො.පැ. 38 |
| ඩීසල් | ලීටර් මිලියන 11.04 |
| දැව් තෙල් | ලීටර් මිලියන 14 |
| ද්‍රව පෙට්‍රෝලියම් වායු (LPG) | ටොන් 35 |
| ඉන්ධන දැව | කි.ටොන් 27.2 |


**1** <u>බලශක්ති කළමනාකරණ පද්ධති පිහිටුවීම</u>

ISO50001 බලශක්ති කළමනාකරණ පද්ධති හඳුන්වාදීම තුළින් වාණිජ, කර්මාන්ත සහ ගෘහස්ථ අංශවල බලශක්ති සංරක්ෂණය සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පහසුකම් සපයනු ලැබේ.

- ✓ පෞද්ගලික අංශයේ බලශක්ති කළමනාකරුවන් 208ක්, රාජ්‍ය අංශයේ බලශක්ති කළමනාකරුවන් 400 ක් සහ බලශක්ති විගණකවරුන් 16 ක් 2016 වර්ෂය අවසානය වනවිට බලාත්මක කරන ලදී.
- ✓ ආයතන 18 ක ISO50001 විගණන සිදු කර ඇත.

**2** <u>ප්‍රමිත සහ නියාමන හඳුන්වාදීම</u>

කර්මාන්ත, ගෘහස්ථ සහ වාණිජ අංශයන්හි බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා යෝග්‍ය නියාමන මැදිහත්වීම් සම්පාදනය කිරීම සමඟ දැනුම්වත්භාවය ඇති කිරීම සඳහා ශ්‍රීලසුබඅ විසින් විවිධ ක්‍රියාකාරකම් සිදු කරමින් පවතී.




LED විදුලි පහන් සඳහා බලශක්ති ලේබලය





LFL බැලස්ට්ස් සඳහා ප්‍රසිද්ධියට පත් කළ ගැසට් පත්‍රය

| විස්තරය | ප්‍රගතිය |
| --- | --- |
| CFL විදුලි පහන් | CFL විදුලි පහන් සඳහා වන ප්‍රමිති සංශෝධනය කරන ලදී. එම ප්‍රතිසංශෝධිත ප්‍රමිති ශ්‍රී ලංකා ප්‍රමිති ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. |
| නාලාකාර ප්‍රතිදීප්ත විදුලි පහන් සහ බැලස්ට්ස් | බලශක්ති ලේබලය අනිවාර්ය කිරීම පිළිබඳ නියාමන ගැසට් කිරීම සිදු කරන ලදී. |
| වායු සමීකරණ | කෙටුම්පත් බලශක්ති නාමකරණ ප්‍රමිත සකස් කරන ලද අතර වැඩිදුර කටයුතු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) වෙත යවා ඇත. |
| ශීතකරණ | ශීතකරණ වල බලශක්ති පරිභෝජන දත්ත පරීක්ෂා කිරීම සිදු කරමින් පවතී. මේ වනතෙක් විවිධ සන්නාමවල සහ ආකෘතිවල ශීතකරණ 15ක් පමණ පරීක්ෂා කර ඇත. |
| LED විදුලි පහන් | LED විදුලි පහන් සඳහා ස්වේච්ඡා බලශක්ති ලේබලයක් හඳුන්වා දෙන ලදී. |
| පරිගණක | කෙටුම්පත් බලශක්ති නාමකරණ ප්‍රමිති සකස් ඇත. |

- ✓ "ශ්‍රී ලංකා ගොඩනැගිලි සංග්‍රහය - 2008" සංශෝධනය කරන ලදී. එය මෙම වර්ෂය අවසානයේදී ප්‍රසිද්ධියට පත් කිරීමට නියමිතය.
- ✓ " ශ්‍රී ලංකාවේ සුනිත්‍ය බලශක්ති නිවාස සඳහා මාර්ගෝපදේශ" සකස් කරන ලදී.




**3** <u>උපදේශන සේවාවන්</u>

කර්මාන්ත, වාණිජ සහ රාජ්‍ය අංශ ආයතනවල බලශක්තිය හා සම්බන්ධ ගැටලු සඳහා උපදේශන සේවා සැපයීම , ගැටලු සඳහා පිළිතුරු සැපයීම, ඉල්ලීම් මත සිදු කරනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ISO 50001 විගණන සඳහා සහභාගී වීම ආදිය මඟින් ශ්‍රීලසුබඅ සහාය ලබා දෙයි.

- ✓ රාජ්‍ය ආයතන සඳහා බලශක්ති විගණන 11 ක් සම්පූර්ණ කරන ලදී.
- ✓ බලශක්ති කාර්යක්ෂමතා වර්ධක, බලශක්ති විගණන සේවා හා තාක්ෂණික සැපයුම් යන කාණ්ඩ යටතේ බලශක්ති සේවා සමාගම් 34 ක් ලියාපදිංචි කරන ලද අතර යාවත්කාලීන කළ බලශක්ති සේවා සමාගම් ලැයිස්තුව අන්තර්ජාලය තුළ ප්‍රසිද්ධියට පත් කර ඇත.

**4**

<u>ජයග්‍රහණ සඳහා සම්මාන පිරිනැමීම</u>

ශ්‍රී ලංකා ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මාන (SLNEEA) වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් කර්මාන්ත සහ වාණිජ අංශවල බලශක්ති කළමනාකරණය පිළිබඳ උනන්දු කරනු ලැබේ.

- ✓ ප්‍රධාන අමුත්තා ලෙස ශ්‍රී ලංකා ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සහභාගිත්වයෙන් සහ විදුලිබල සහ පුනර්ජනනීය බලශක්ති ගරු අමාත්‍යවරයාගේ සහ ගරු නියෝජ්‍ය අමාත්‍යවරයාගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මාන උත්සවය 2016 වර්ෂයේ නොවැම්බර් මස 24 වැනි දින BMICH හිදී පැවැත්විණි.
- ✓ ශ්‍රී ලංකා ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මාන (SLNEEA) උත්සවයේදී ලබා දුන් සම්මාන,
  - ❖ ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මාන (SLNEEA)
  - ❖ විශිෂ්ට බලශක්ති සේවා සමාගම සම්මානය (ESCO)
  - ❖ වර්ෂයේ විශිෂ්ටතම බලශක්ති කළමනාකරු
  - ❖ බලශක්ති ක්ෂේත්‍රයේ විශිෂ්ට පුද්ගලයා සම්මානය








**ශ්‍රී ලංකා ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මාන 2016 හි ජයග්‍රාහකයන්**

**5**

<u>අංශ විශේෂිත බලශක්ති කළමනාකරණ වැඩසටහන්</u>

පළාත් මට්ටමින් බලශක්ති කළමනාකරණ වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රිලසුබඅ සහාය ලබා දෙයි.

**6**

<u>ජාතික බලශක්ති සංරක්ෂණ වැඩසටහන</u>

- ✓ පෙර පාසල් ගුරුවරුන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් 4 ක් පවත්වන ලදී.
- ✓ බාලදක්ෂයන් 14,500 ක් සඳහා බලශක්ති සංරක්ෂණ වැඩසටහන් 6 ක් පවත්වන ලදී.
- ✓ මාධ්‍යවේදීන් සඳහා පුනර්ජනනීය බලශක්ති සහ බලශක්ති කාර්යක්ෂමතාවය පිළිබඳ වැඩමුළු 9 ක් පවත්වන ලදී.
- ✓ මාධ්‍යවේදීන් සඳහා නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ සහ පුත්තලම සුළං බලාගාරයේ ක්ෂේත්‍ර චාරිකා 2 ක් සංවිධානය කරන ලදී.




**පෙර පාසල් ගුරු පුහුණු වැඩසටහන**





**බාලදක්ෂයන් සඳහා බලශක්ති සංරක්ෂණ වැඩසටහන් (14500)**

- ✓ දහම් පාසල් 9000 ක සහභාගීත්වයෙන් දහම් පාසල් අතර රචනා තරඟයක් පවත්වන ලදී. රචනා 2000 ක් අතරින් රචනා 100 ක් අවසාන වටයට තෝරා ගැනිණි.
- ✓ පාසල් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.
- ✓ රාජ්‍ය ආයතන සඳහා මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.
- ✓ අ.පො.ස (සා.පෙළ) ශිෂ්‍යයන් සඳහා බලශක්ති කාර්යක්ෂමතා මුළුතැන්ගෙය වැඩසටහන පැවැත්විණි.

**දහම් පාසල් රචනා තරඟය, ත්‍යාග ප්‍රදානය**






**අ.පො.ස (සා.පෙළ) ශිෂ්‍යයන් සඳහා බලශක්ති කාර්යක්ෂමතා මුළුතැන්ගෙය වැඩසටහන**

- ✓ බලශක්ති කළමනාකරුවන්ගේ වැඩමුළුව සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- ✓ නාවික නිලධාරින්/ රාජ්‍ය අංශ ආයතන සඳහා බලශක්ති කළමනාකරණ සහ සංරක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- ✓ NVQ සහතිකලත් මෝටර් නැවත එතීම් සිදු කරන්නන් සඳහා මෝටර් නැවත එතීම පිළිබඳ වැඩසටහන පවත්වන ලදී.
- ✓ NVQ ගුරුවරුන් බලශක්ති කාර්යක්ෂමතා මෝටර් නැවත එතීමේ භාවිතයන් සම්බන්ධයෙන් පුහුණු කරන ලදී.



- ✓ බලශක්ති කාර්යක්ෂමතාවය පිළිබඳ ළමා ගායනා ඇතුලත් DVD තැටියක් නිකුත් කරන ලදී.
- ✓ ත්‍රෛමාසිකව "සංරක්ෂා සඟරාව" ප්‍රකාශයට පත් පත් කරන ලදී.
- ✓ ' පරිසරය ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය' පිළිබඳ බුදුන් වහන්සේගේ ඉගැන්වීම් ඇතුලත් ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කෙරිණි.

| | |
|---|---|
| | <br> |
| | ***සුනිත්‍ය බලශක්ති ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීම (SAFE යටතේ)*** |
| **1** | <u>බලශක්ති තොරතුරු විශ්ලේෂණය</u><br><br>✓ ජාතික බලශක්ති තුලනය 2015 සහ ප්‍රධාන බලශක්ති සංඛ්‍යාලේඛන 2015 ප්‍රකාශයට පත් කරන ලදී.<br><br><br><br>**බලශක්ති තුලනය 2015**<br><br>✓ බලශක්ති තුලනය වෙබ් අඩවිය යාවත්කාලීන කරන ලදී.<br><br>✓ සුනිත්‍යභාවය විශ්ලේෂණය කිරීමේ උපකරණයක් ලෙස කාබන් පියසටහන යොදා ගැනීම<br>• රොටරි සමාජයේ සහයෝගිත්වය ඇතිව කාබන් පිය සටහන ගණනය කිරීම සඳහා වෙබ් අඩවි යෙදවුමක් සහ ජංගම දුරකථන යෙදවුමක් සකස් කරන ලදී. |




**කාබන් පියසටහන ගණනය කිරීම සඳහා වෙබ් අඩවි දත්ත සමුදායක් සකස් කරන ලදී**

- ✓ පරිභෝජක බලශක්ති පරිභෝජන ඇගයීම

ආහාර වටිනාකම් දාමය පිළිබඳ අධ්‍යයනයේ පළමු වර්ෂය සම්පූර්ණ කරන ලද අතර අධ්‍යයනය පිළිබඳ අතුරු වාර්තාව වයඹ විශ්වවිද්‍යාලයේ පශුසම්පත්, ධීවර සහ පෝෂණ පීඨය මඟින් ඉදිරිපත් කර ඇත.






**ආහාර වටිනාකම් දාමය පිළිබඳ බලශක්ති පරිභෝජක ඇගයීම**

- ✓ පරිභෝජක බලශක්ති පරිභෝජන ඇගයීම

2015 වර්ෂයේදි දීප ව්‍යාප්තව සිදු කරන ලද ඉන්ධන පිරවුම්හල් සමීක්ෂණයේ දත්ත ඇතුලත් කිරීම් ක්‍රියාවලිය බැහැරට ලබා දෙන ලද අතර එක්රැස් කරගත් දත්ත විශ්ලේෂණය කිරීම ආරම්භ කර ඇත.



**2**

<u>සුනිත්‍ය බලශක්ති තාක්ෂණ සංරක්ෂණ</u>

- ✓ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, ඉංජිනේරු පීඨයේ, විදුලි හා ඉලෙක්ට්‍රොනික් දෙපාර්තමේන්තුව සමඟ සහයෝගිත්වයෙන් මහා පරිමාණ සූර්ය බලශක්තිය සංවර්ධනය කිරීමේ තාක්ෂණික මැදිහත්වීම් හා සම්බන්ධ උසස් පර්යේෂණ ව්‍යාපෘති දෙකක පළමු වර්ෂය සාර්ථකව නිම කරන ලදී.

  - ශ්‍රී ලංකාව තුළ මහා පරිමාණයෙන් PV යෙදවීමෙන් බල සැපයුම ලබා දීමේ ආරක්ෂාව
  - DC ක්ෂුද්‍ර ජාලය හරහා බලශක්ති කාර්යක්ෂම PV පරිභෝජනය

- ✓ ප්‍රධාන අමුත්තා වශයෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සහභාගිත්වයෙන් 2016 නොවැම්බර් මස 24 වැනි දින BMICH හීදි පැවති ශ්‍රී ලංකා ජාතික බලශක්ති සම්මාන 2016 උත්සවයේදී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නවීකරණය කරන ලද වෙබ් අඩවිය දියත් කරන ලදී.




- ✓ ආසියානු පිරිසිදු බලශක්ති සම්මන්ත්‍රණය - 2016 හීදී පර්යේෂණ පත්‍රිකා තුනක් ඉදිරිපත් කරන ලදී.
  - සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති පදනම් කරගත් උත්පාදන ශ්‍රී ලාංකික ජාලයට ඒකාබද්ධ කිරීම

| | |
|---|---|
| | - පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මගින් ශ්‍රී ලංකාවේ තනි දිවයින් විදුලිබල පද්ධතියක් සඳහා ඵලදායී ඉල්ලුම් පාර්ශව කළමනාකරණය<br>- ශ්‍රී ලංකාවේ බලශක්ති කාර්යක්ෂමතා ආලෝකකරණයෙහි මැදිහත්වීම් |
| | ***දැනුම් කළමනාකරණ වැඩසටහන් (SEEK යටතේ)*** |
| **1** | <u>බලශක්ති අධ්‍යාපන වැඩසටහනක් සකස් කිරීම</u><br><br>බලශක්ති අධ්‍යාපනය සඳහා ස්වයං-ක්‍රියාකාරී පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතියික පාසල් විෂය නිර්දේශයට බලශක්ති සම්බන්ධ දැනුම හා ක්‍රියාකාරකම් එකතු කිරීම මෙහි මූලික පරමාර්ථයයි.<br><br>✓ 6 වන ශ්‍රේණියේ සිට 10 වන ශ්‍රේණිය දක්වා විද්‍යාව විෂය ඒකකය සඳහා බලශක්ති සම්බන්ධිත දැනුම හා ක්‍රියාකාරකම් හඳුන්වා දී ඇති අතර, එය දැනටමත් නව විෂය නිර්දේශ යටතේ රජයේ පාසල්වල ක්‍රියාත්මක කර ඇත, 11 ශ්‍රේණිය සහ 7 ශ්‍රේණිය සඳහා 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී.<br><br>✓ සියලු පළාත්වල බලශක්ති සමාජයන්හි ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා දිවයිනේ සියලු පළාත් ඒකාබද්ධ කර ගනිමින් ‘ අරමුදල් යෙදවීමේ වැඩසටහන්’ 3ක් පවත්වන ලදී.<br><br>✓ රජයේ පාසල්වලින් අයදුම්පත් 3,000 ක් ලැබී ඇති අතර ඒ අතරින් බලශක්ති **සමාජ** 2,700 ක් පිහිටුවා ඇත. මේ වනවිටත් තවත් බලශක්ති සමාජ පිහිටුවමින් පවතී.<br><br>✓ පළාත් 9 හි ‘අනාගත සිහින’ ප්‍රදර්ශනය පවත්වා බලශක්ති අධ්‍යාපන වැඩසටහනේ පළාත් සම්මාන ප්‍රදානය කරන ලදී.<br><br>බලශක්ති කළමනාකරණය සහ එදිනෙදා ජීවිතයේදී පුනර්ජනනීය බලශක්ති පරිභෝජනයෙහි ගුරු ශිෂ්‍ය ප්‍රජාව නිරත කරවීම සඳහා පාසැල් බලශක්ති සමාජයන්, බලශක්ති දින සැමරුම සහ ‘බලශක්ති තරුව’ තරඟය ඇතුළු පුළුල් වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 06/2015 අධ්‍යාපන චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසුව 2015 අප්‍රේල් මස 30 වැනි දින බලශක්ති අධ්‍යාපන වැඩසටහන, අධ්‍යාපන පද්ධතියට නිල වශයෙන් හඳුන්වා දෙනු ලැබීය. ඒ අනුව, පාසැල් බලශක්ති සමාජ වැඩසටහන 6 වන ශ්‍රේණිය සහ ඉන් ඉහළ ශ්‍රේණි සහිත සියලුම රජයේ පාසල්වලට හඳුන්වාදී ඇත.<br> <br>ශිෂ්‍යයන්ගේ නිර්මාණ ඇගයීම |

සන්නිවේදන වැඩසටහන්

සමාජය තුළ බලශක්ති තොරතුරු ග්‍රහණය කිරීම, සංවර්ධනය කිරීම හා බෙදාගැනීම සඳහා දැනුම බෙදා හැරීමේ උපාය මාර්ගයක් ලෙස සන්නිවේදන වැඩසටහනක් හඳුන්වා දෙන ලදි

- ✓ සීගිරියෙහි පැවති 'යෞවන ප්‍රදර්ශනය' - කුසලතා සංවර්ධනය කිරීමේ වැඩමුළු, දැනුම ව්‍යාප්ත කිරීම සහ විනෝදාස්වාදය ඇතුළු නව්‍යකරණ දැනුම්වත් කිරීමේ වැඩසටහන් ඉදිරිපත් කරන ලදී.





යෞවන ප්‍රදර්ශනය - සහභාගීවූවන් සඳහා වූ ක්‍රියාකාරකම්

**Final**

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**

**2016 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය**

| | සටහන | 2016 රු. | | 2015 ප්‍රතිප්‍රකාශිත | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල, පිරියත හා උපකරණ | 1 | 907,714,742 | | 1,026,065,370 | |
| අස්පෘෂ්‍ය වත්කම් | 2 | 14,885,933 | | 6,540,250 | |
| නොනිමි කාර්යය | 3 | 19,885,853 | | 13,744,628 | |
| ආයෝජන | 4 | 77,770,893 | | 74,609,163 | |
| ණය ආපසු ලබා ගැනීම | 5 | 60,539,709 | 1,080,797,130 | - | 1,120,959,411 |
| **ජංගම වත්කම්** | | | | | |
| ලැබීමට නියමිත දෑ | 6 | 21,286,085 | | 17,904,145 | |
| වෙනත් ජංගම වත්කම් | 7 | 49,965,177 | | 29,413,032 | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 8 | 346,032,869 | 417,284,131 | 266,066,769 | 313,383,946 |
| **මුළු වත්කම්** | | | 1,498,081,261 | | 1,434,343,357 |
| **හිමිකම් හා බැරකම්** | | | | | |
| **හිමිකම** | | | | | |
| සමුච්චිත අරමුදල | 9 | 22,100,336 | | 22,100,336 | |
| ශුද්ධ අතිරික්තිය | | 94,275,311 | | 88,848,196 | |
| විලම්බිත ප්‍රදාන | 10 | 881,213,250 | | 985,822,817 | |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල | 11 | 293,257,237 | | 205,446,714 | |
| සුනිත්‍ය ඇප අරමුදල | | 81,935,978 | 1,372,782,112 | 76,591,020 | 1,378,809,083 |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| පාරිතෝෂිත බැරකම | | 16,844,582 | | 12,005,755 | |
| ADB ණය සඳහා (L 2892 SRI) CENEIP | | 45,659,709 | | - | |
| ADB ණය සඳහා (L 2733 SRI) SPSSP | | 16,900,356 | 79,404,647 | - | 12,005,755 |
| **ජංගම බැරකම්** | | | | | |
| වෙනත් ගෙවීමට ඇති දෑ | 12 | 38,242,131 | | 37,429,298 | |
| කෙටි කාලීන ප්‍රතිපාදන - විගණන ගාස්තු | | 2,822,636 | | 2,222,636 | |
| ශුද්ධ තැන්පතුව - ඉඩම් අත්පත් කර ගැනීම | | 4,829,735 | 45,894,502 | 3,876,585 | 43,528,519 |
| **හිමිකම් හා බැරකම් මුළු ප්‍රමාණය** | | | 1,498,081,261 | | 1,434,343,357 |

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා ඒ වෙනුවෙන්**

**ප්‍රධානී (මූල්‍ය)** **අධ්‍යක්ෂ ජනරාල්** **සභාපති**

**කළමනාකරණ මණ්ඩල සාමාජික**

කළමනාකරණ මණ්ඩල සාමාජික

**Final**

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**

**2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **මුදල් ගලන - මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | | | |
| කාලසීමාවේ අතිරික්තය | 5,427,116 | | 52,419,277 | |
| **ගැලපීම්** | | | | |
| පාඩු හා අලාභ | 157,454 | | | |
| ඇප අරමුදලට මාරු කළ | | | | |
| ක්‍රමක්ෂිත ප්‍රදාන (ලත් අරමුදල් සඳහා) | (123,361,618) | | (159,394,219) | |
| බලශක්ති අරමුදලට මාරු කළ | (38,573,814) | | | |
| සේවා පාරිතෝෂිත ප්‍රතිපාදන | 5,621,087 | | 1,305,150 | |
| ක්ෂය | 123,361,618 | | 159,394,219 | |
| | (27,368,157) | | 53,724,427 | |
| (වැඩිවීම/අඩුවීම) - වෙනත් ජංගම වත්කම් | (23,934,085) | | (3,387,148) | |
| (වැඩිවීම/ අඩුවීම) - ජංගම බැරකම් | 2,365,983 | | (9,820,362) | |
| මෙහෙයුම් වලින් ඉපයූ මුදල් | (48,936,259) | | 40,516,917 | |
| ශුද්ධ මුදල් - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් | | (48,936,259) | | 40,516,917 |
| **මුදල් ප්‍රවාහය - ආයෝජන ක්‍රියාකාරකම් වලින්** | | | | |
| දේපල, පිරියත හා උපකරණ මිලට ගැනීම | (5,168,444) | | (50,887,934) | |
| අප්පෘෂ්ය වත්කම් | (8,345,683) | | (5,643,450) | |
| නොනිමි කාර්යය | (6,141,226) | | (6,805,978) | |
| FD & TB හි ආයෝජන පොලිය | (3,161,729) | | (3,537,146) | |
| මුදල් ගෙවීම් - ආයෝජනකරුවන් | (60,539,709) | | - | |
| ශුද්ධ මුදල - ආයෝජන ක්‍රියාකාරකම් වලට භාවිත | | (83,356,791) | | (66,874,508) |
| **මුදල් ප්‍රවාහය - මූල්‍ය ක්‍රියාකාරකම් වලින්** | | | | |
| විලම්බිත ප්‍රදාන | 18,752,051 | | 17,510,403 | |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල | 126,384,337 | | (26,899,008) | |
| සමුච්චිත අරමුදල | - | | - | |
| සුනිත්‍ය ඇප අරමුදල | 5,344,958 | | 3,269,392 | |
| මුදල් නැවත ගෙවීම් - විදේශ ආධාරකරුවන් | 62,560,064 | | - | |
| පාරිතෝෂිත ගෙවීම් | (782,260) | | - | |
| ශුද්ධ මුදල් - මූල්‍ය කටයුතු වලට යෙදූ | | 212,259,150 | | (6,119,213) |
| **ශුද්ධ වැඩිවීම - මුදල් හා මුදල් වලට සමාන දෑ** | | 79,966,100 | | (32,476,804) |
| **මුදල් හා මුදල් වලට සමාන දෑ - කාලසීමාව ආරම්භයේ** | | 266,066,769 | | 298,543,573 |
| **මුදල් හා මුදල් වලට සමාන දෑ - කාලසීමාව අවසානයේ** | | 346,032,869 | | 266,066,769 |

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

Final

**2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| | සටහන | 2016<br>රු. | 2015<br>රු.<br>ප්‍රති ප්‍රකාශිත |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන - ක්‍රියාකාරකම්/ ව්‍යාපෘති වියදම් | 13 | 41,247,949 | 27,910,521 |
| FARDF (17) | | 1,000,000 | |
| ක්‍රමක්ෂිත විලම්බිත ප්‍රදාන | 14 | 123,361,618 | 159,394,219 |
| භාණ්ඩාගාර පුනරාවර්තන ප්‍රදාන | | 83,416,663 | 85,160,000 |
| UNDP- පරිසර අමාත්‍යාංශය | | | |
| UNDP- මහවැලි සංවර්ධන අමාත්‍යාංශය | | 530,000 | 3,968,047 |
| ආදායම් ප්‍රදාන ADB G0303 (Clean Energy Network Efficincy Improvement Project - CENEIP) | | 50,002,360 | |
| ආදායම් ණය ADB 2733 SRI (Sustainable power Sector Support project - SPSSP) | | 923,854 | 2,865,301 |
| UNDP NAMA ව්‍යාපෘති ප්‍රදාන | | 2,036,947 | 39,000 |
| UNDP ජීව ගොනු ව්‍යාපෘති ප්‍රදාන | | 2,691,954 | 506,070 |
| අනුග්‍රහය LTL Holdings | | 6,547,053 | |
| වෙනත් ආදායම් | 15 | 133,349,512 | 139,044,099 |
| **මුළු ආදායම** | | **445,107,910** | **418,887,257** |
| **වියදම** | | | |
| ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් වියදම් | 16 | (166,460,446) | (79,546,833) |
| වැටුප් හා දීමනා | 17 | (89,359,231) | (76,761,267) |
| ගමන් වියදම් හා යැපීම් දීමනා | 18 | (1,553,237) | (713,053) |
| සැපයුම් | 19 | (4,472,982) | (5,227,728) |
| නඩත්තු වියදම් | 20 | (8,583,142) | (7,607,804) |
| කොන්ත්‍රාත් සේවා | 21 | (35,931,662) | (29,190,036) |
| ක්‍රමක්ෂය වියදම් | 22 | (123,361,618) | (159,394,219) |
| වෙනත් පුනරාවර්තන වියදම් | 23 | (8,921,899) | (8,035,388) |
| **කාල පරිච්ඡේදය තුළ වූ වියදම්** | | **(438,644,217)** | **(366,476,328)** |
| පෙර වසරේ ගැලපීම් | | (879,123) | 8,348 |
| පාඩු හා අලාභ | | (157,454) | |
| **අතිරික්තය /ඌණනය** | | **5,427,116** | **52,419,277** |

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**
**2016 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

| විස්තරය | සංචිත අරමුදල | ශුද්ධ අතිරික්තය/ හිගය | විලම්බිත ප්‍රදාන | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල | සුනිත්‍ය ඇප අරමුදල | එකතුව |
|---|---|---|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| 2014.12.31 දිනට ශේෂය | 22,100,336 | 36,428,918 | 1,127,706,633 | 232,345,722 | 73,321,629 | 1,491,903,238 |
| වැඩිවීම/අඩුවීම - 2015 වසරේ | - | 52,410,929 | (141,883,817) | (26,899,008) | 3,269,392 | (113,102,504) |
| පෙර වසරේ ගැලපුම | | 8,348 | | | | 8,348 |
| **2015.12.31 දිනට ශේෂය** | 22,100,336 | 88,848,195 | 985,822,817 | 205,446,714 | 76,591,020 | 1,378,809,082 |
| වැඩිවීම/අඩුවීම - 2016 වසරේ | - | 6,463,693 | (104,609,567) | 87,810,523 | 5,344,958 | (4,990,393) |
| පෙර වසරේ ගැලපුම | | (879,123) | | | | (879,123) |
| පාඩු හා අලාභ | | (157,454) | | | | (157,454) |
| **2016.12.31 දිනට ශේෂය** | **22,100,336** | **94,275,311** | **881,213,250** | **293,257,237** | **81,935,978** | **1,372,782,112** |

පිටු අංක 5 සිට 17 දක්වා සඳහන් කර ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කොටසකි

**ගිණුම් සටහන්**

**2016.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**1. සංයුක්ත තොරතුරු**

**1.1 සාමාන්‍යය**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (සුබඅ) 2007 වර්ෂයේ ඔක්තෝබර් මස 01 වැනි දින ස්ථාපිත කරන ලදි. බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) ගොඩනැගිලි අංක 5 හි ස්ථානගත කර ඇත.

1985 අංක 02 දරන බලශක්ති සංරක්ෂණ අරමුදල (ECF පනත), 2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත මඟින් අවලංගු කර ඇත. 2007 සැප්තැම්බර් මස 30 වැනි දිනට ECF සියලු වත්කම් සහ බැරකම් 2007 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ස්වයංක්‍රීයව SEA හි ගිණුම් වලට මාරු වී ඇත.

විදුලිබල සහ බලශක්ති අමාත්‍යංශයේ නියෝගය පරිදි ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යටතේ පැවති ආලෝකකරණය සඳහා වන ප්‍රාදේශීය මධ්‍යස්ථානය (RCL) ලංකා විදුලිබල මණ්ඩලය වෙත මාරු කරන ලදි. ඒ අනුව RCL හි වත්කම්, බැරකම් සහ සේවකයින් 2012 වර්ෂයේ දෙසැම්බර් මස ලංවීම වෙත මාරු කරන ලදි.

**1.2 අධිකාරියෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරීම, බලශක්ති සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම, බලශක්තිය ලබා දීමෙහි සහ තොරතුරු කළමනාකරණයෙහි සුරක්ෂිතභාවය, විශ්වාසනීයත්වය සහ පිරිවැය ඵලදායිතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් මෙහෙයවීමට බලශක්ති කාර්යක්ෂමතා ක්‍රියාමාර්ග සහ සංරක්ෂණ ක්‍රියාවට නැංවීම.

**1.3 ආයතනයේ අරමුදල්**

2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත අනුව අධිකාරිය විසින් පහත සඳහන් අරමුදල් තුන ක්‍රියාත්මක කරයි.

**1.3.1 අධිකාරියේ අරමුදල**

මූලික වත්කම් තැන්පතු, බලපත්‍ර ගාස්තු, ණය, බදු හා කුලී හා පාර්ලිමේන්තුව විසින් අනුමත අනෙකුත් ලැබීම් පවත්වාගෙන යෑම සඳහා අරමුදල ස්ථාපනය කර ඇත. තවද, බලශක්ති අධිකාරී පනතේ කාර්ය භාරය ඉටු කිරීමේ දී දැරිය යුතු ගෙවීම් සිදු කිරීම ද මෙමඟින් සිදු කරයි.

### 1.3.2 ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල

කාබන් වත්කම් කළමනාකරණය, අයදුම්පත් ගාස්තු, බදු හා කුලී මුදල්, වෘත්තීමය සේවා මඟින් ලැබෙන ගාස්තු, රාජ්‍ය භාගය, සෙස් බදු මඟින් ලැබෙන අරමුදල් හා ඒකාබද්ධ අරමුදලින් ලැබෙන මුදල්, තැන්පත් පවත්වා ගැනීම මෙම ගිණුම යටතේ සිදු කරයි.

තවද බලශක්ති කාර්යක්ෂමතාවය දිරිගැන්වීම සඳහා දීමනා, දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වියදම් සුනිත්‍ය බලශක්ති උත්පාදක ක්‍රමවේද මාරු වීම සඳහා තාක්ෂණ ආධාර, බලශක්ති කාර්යක්ෂම උපකරණ ප්‍රවර්ධනය සඳහා ආධාර හා පුනර්ජනනීය බලශක්ති පරිවර්තන බලාගාර සඳහා ආධාර හා අදාල ගෙවීම් මෙම අරමුදල මඟින් සිදු කරයි.

### 1.3.3 සුනිත්‍ය ඇප අරමුදල

බලශක්ති කාර්යක්ෂම ව්‍යාපෘති සඳහා ණය පහසුකම් ලබා ගන්නා ආයෝජකයන් හට ඇප භාරයක් නිකුත් කිරීම සඳහා මෙම අරමුදල භාවිතා කරයි. මේ සඳහා ඒකාබද්ධ අරමුදලින් මූලික වශයෙන් ලැබිය යුතු ප්‍රදානයන් හා බලශක්ති අධිකාරියේ අරමුදල (Fund of the Authority) මඟින් මෙයට ලැබෙන අරමුදල් මේ සඳහා භාවිතා කළ හැක.

### 1.4 සේවක සංඛ්‍යාව

2016.12.31 වැනි දිනට සේවක සංඛ්‍යාව - 104

## 2.1 වැදගත් ගිණුම් ප්‍රතිපත්ති වල සාරාංශය

### 2.1.1 සකස් කිරීමේ පදනම අනුකූල වීමේ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව 2016 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (ශ්‍රී.ල.සු.බ.අ) ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමඟින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සකස් කර ඇත.

ශ්‍රී.ල.සු.බ.අ හී මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනමින් සකස් කර ඇත. අවශ්‍ය තැන් වලදී ගිණුම්කරණ ප්‍රතිපත්ති පසු සටහන් වල අනාවරණය කර ඇත.

### 2.1.2 සංසන්දනාත්මක සංඛ්‍යා

වර්තමාන මූල්‍ය වර්ෂයෙහි වෙනස්කම් සඳහා අනුකූල වන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යා සඳහා ගැලපීම් සිදු කර ඇත. සටහන් අංක 24 ට අනුව 2016 වර්ෂය සඳහා සන්සන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශයට පත් කර ඇත.

### 2.2.1 රජයේ ප්‍රදානයන් සඳහා ගිණුම් තැබීම සහ රජයේ සහාය අනාවරණය කිරීම

රජයේ ප්‍රදානයන් ප්‍රාග්ධන ප්‍රදාන සහ පුනරාවර්තන ප්‍රදාන ලෙස කාණ්ඩ දෙකකට බෙදා වෙන් කරනු ලැබේ. පුනරාවර්තන වියදම්, කාර්ය මණ්ඩල වැටුප්, ගොඩනැගිලි කුලී ආදී වියදම් පියවීම සඳහා යොදා ගනු ලැබේ. ප්‍රාග්ධන ප්‍රධාන ව්‍යාපෘති/ වැඩසටහන් වියදම් සහ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා භාවිතා කරනු ලැබේ. ව්‍යාපෘති වියදම් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් වලින් සමන්විත වන බැවින් එම වියදම් ප්‍රාග්ධන ප්‍රදාන වලින් දරනු ලැබේ.

වත්කමෙහි ප්‍රයෝජ්‍ය ජීව කාලය ඔස්සේ ක්‍රමානුකූල සහ තර්කාන්විත පදනමින් හඳුනාගනු ලබන රජයේ ප්‍රාග්ධන ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස සලකනු ලැබේ.

ව්‍යාපෘති වියදම් සඳහා ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන ශීර්ෂය යටතේ, පුනරාවර්තන ව්‍යාපෘති/ වැඩසටහන් වියදම් හා සම්බන්ධ වන ප්‍රදාන ආදායම් ප්‍රකාශනයෙහි බැරකමක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

### 2.2.2 විදේශ ආධාර සඳහා ගිණුම් තැබීම

විදේශීය ආධාර ව්‍යාපෘති ගණනාවක් ශ්‍රී.ල.සු.බ.අ විසින් සිදු කරයි. ආසියානු සංවර්ධන බැංකුව සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ණය සහ ප්‍රදානයන් වැනි ආධාර බොහෝමයක් ලැබී ඇත. කෙසේ වෙතත් සමහර සැපයුම්කරුවන් සඳහා ගෙවීම් සහ ණය, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව මගින් ඍජුවම කරනු ලබයි. ඒ සඳහා ශ්‍රී.ල.සු.බ.අ විසින් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. ඒවා මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර ඇත.

### 2.2.3 දීර්ඝ කාලීන ආයෝජන සඳහා ගිණුම් තැබීම

රජයේ භාණ්ඩාගාර බිල්පත් වල සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පත් වල ආයෝජනය කර ඇති අතර පිරිවැයට දක්වා ඇත.

### 2.2.4 ආදායම හඳුනාගැනීම

බලශක්ති බලපත්‍ර ගාස්තු, විදුලිය විකිණීම, පුහුණු පාඨමාලා ගාස්තු, ප්‍රදර්ශන ආදායම, උපකරණ කුලියට දීම සහ වෙනත් ආදායම මඟින් ආදායම නියෝජනය වේ.
සුනිත්‍ය සහතිකවීමේ අරමුදලෙහි පොළිය ආදායමක් ලෙස සලකනු ලැබේ. එහි කොටසක් නැවත ආයෝජනය කරන ලද අතර කොටසක් අරමුදල් 2 නඩත්තු කිරීම/ ඒ සඳහා ආදායම ඉපැයීමේ පිරිවැය සඳහා පරිභෝජනය කරන ලදි.

### 2.2.5 අනිශ්චිත බැරකම් සහ අනිශ්චිත වත්කම්

2008 වර්ෂයේ මාර්තු මස 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින්ගෙන් මිලදී ගන්නා ලද විදුලි බලය සඳහා ඇස්තමේන්තුගත රු. මි. 897 ක් ශ්‍රී.ල.සු.බ.අ. විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු වේ. මෙම ගෙවීම සිදු කිරීම සඳහා මේ වන විට ක්‍රමයක් නොමැති අතර ඒ සඳහා භාණ්ඩාගාර අරමුදල් හෝ සෙස් බදු හෝ පුරස්කාර තුලින් උපයාගත යුතු වේ. මේවා භාණ්ඩාගාර අනුමැතියට යටත් වේ. එබැවින් මෙය අවිනිශ්චිත බැරකමක් ලෙස පමණක් අනාවරණය කර ඇත.

## 2.3 දේපල, පිරියත සහ උපකරණ

### 2.3.1 පිරිවැය සහ තක්සේරු කිරීම

ස්ථාවර වත්කම්, පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්‍රමක්ෂය ට දක්වා ඇත. රේඛීය ක්‍රමය භාවිතා කරමින් ස්ථාවර වත්කම් වල ක්ෂය සඳහා වෙන් කිරීම් ගණනය කර ඇත.

### 2.3.2 ස්ථාවර වත්කම් ඉවත් කිරීම

කඩා වැටුණු උඩප්පුව සුළඟ කුළුණ නැවත අගය කර අවශ්‍ය අනුමැතිය ලබාගැනීමෙන් පසු ඉවත් කරනු ලැබේ.

### 2.3.3 ක්ෂය කිරීම්

ස්ථාවර වත්කම් ක්ෂය කිරීම පුනරීක්ෂණයට යටත්ව ඇස්තමේන්තු ගත ජීව කාල පදනම මත සිදු කරයි.

**වර්ෂයක කාලයක් සඳහා ක්‍රමක්ෂය අනුපාතය පහත දක්වා ඇත.**

| අයිතමය | ක්‍රමක්ෂය අනුපාතය |
|---|---|
| ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 25% |
| මොටර් ප්‍රවාහන | 20% |
| ඡායාපිටපත් යන්ත්‍රය | 25% |

| | |
|---|---|
| පරිගණක | 33.33% |
| විදුලි භාණ්ඩ | 25% |
| පුස්තකාල පොත් | 20% |
| බලශක්ති උපකරණ | 33.33% |
| ප්‍රදර්ශන උපකරණ | 25% |
| සුළං කුළුණු | 20% |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 5% |

<u>සූර්ය බලශක්ති ව්‍යාපෘති</u>

| | |
|---|---|
| A. සූර්ය පැනල | 5% |
| B. ලෝහ ව්‍යුහ | 10% |
| C. ගොඩනැගිලි | 5% |
| D. ස්විච්විපන්න | 20% |
| E. අපවර්තක | 20% |
| F. ට්‍රාන්ස්ෆෝමර | 5% |
| G. විදුලි ඉලෙක්ට්‍රෝනික් | 33.33% |
| I. සනීපාරක්ෂක සහ ජලනල වැඩ | 5% |
| J. රථහැන් | 20% |
| K. ගෘහභාණ්ඩ සවිකිරීම් සහ කාර්යාලීය උපකරණ | 25% |
| L. මෙවලම් | 33% |
| M. යන්ත්‍ර සූත්‍ර | 20% |
| H. වෙනත් | 20% |

**2.4 බැරකම් සහ ප්‍රතිපාදන**

**2.4.1 පාරිතෝෂිත**

මූල්‍ය වර්ෂයේ අවසන් මාසයේ වැටුප පදනම් කර ගනිමින් අඩ සමක වැටුප හා සමාන මුදලක් පාරිතෝෂිකයක් වශයෙන් සියළුම සේවකයින් සඳහා වෙන් කර ඇත.

### 2.4.2 EPF & ETF

අදාල නීති සහ නියාමනයන්ට අනුව EPF & ETF සඳහා දායකවීමට සේවකයින් හිමිකම් ලබයි. EPF & ETF සඳහා ශ්‍රී.ල.සූ.බ.අ. හි දායකත්වය පිළිවෙළින් 12% සහ 3% කි.

**2.4.3 මහවැලි ඉඩම**

හම්බන්තොට සූර්ය බලාගාරය සඳහා අත්පත් කර ගත් අක්කර 50 ක මහවැලි ඉඩම සඳහා හිමිකම් ඔප්පුව මේ වන තෙක් ලැබී නොමැත. එබැවින් එය තක්සේරු කර හෝ ගිණුම්වල වත්කමක් ලෙස ඇතුලත් කර නොමැත.

**2.4.4 කළමනාකරණ මණ්ඩල අනුමැතිය**

මෙම මූල්‍ය ප්‍රකාශන 2017 ඔක්තෝබර් මස 10 වන දින අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

**1 සටහන :**

**දේපල, පිරියත හා උපකරණ**

**ස්ථාවර වත්කම්**

| විස්තරය | 31.12.2015 දිනට ඒකාබද්ධ ශේෂය රු. | 2016 කාලය තුල අත්පත් කර ගැනීම් | ප්‍රත්‍යාගණන අගය රු. | 2016 කාලය තුල බැහැර කිරීම් රු. | 31.12.2016 දිනට අධිකාරි අරමුදලේ ශේෂය රු. | 31.12.2016 දිනට බලශක්ති අරමුදලේ ශේෂය රු. | 31.12.2016 දිනට ඒකාබද්ධ ශේෂය රු. |
|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | 45,856,451 | - | | | | 45,856,451 | 45,856,451 |
| ගොඩනැගිලි | - | - | | | | | - |
| ලී බඩු සහ කාර්යාල උපකරණ | 19,420,184 | 185,286 | | | 19,605,470 | | 19,605,470 |
| වාහන | 52,266,495 | - | | | 52,266,495 | | 52,266,495 |
| ජායාපිටපත් යන්ත්‍රය | 2,994,191 | - | | | 2,994,191 | | 2,994,191 |
| පරිඝණක | 33,258,570 | 362,700 | | | 33,621,270 | | 33,621,270 |
| විදුලි භාණ්ඩ | 429,197 | - | | | 429,197 | | 429,197 |
| පුස්තකාල පොත් | 1,438,352 | - | | | 1,438,352 | | 1,438,352 |
| බලශක්ති උපකරණ | 89,142,935 | 2,440,452 | | | 91,583,387 | | 91,583,387 |
| සුසං කුළුනු හා උපකරණ | 46,482,873 | 1,237,429 | 444,421 | (925,921) | 47,238,802 | | 47,238,802 |
| ශීතකරණ පරීක්ෂා කිරීමේ රසායනාගාරය | 42,165,337 | - | | | 42,165,337 | | 42,165,337 |
| <u>සූර්ය සහ සුළු පරිමාණ ජල ව්‍යාපෘති:</u> | | - | | | | | - |
| A. සූර්ය පැනල | 660,106,452 | - | | | 660,106,452 | | 660,106,452 |
| B. වානේ ව්‍යුහයන් | 222,261,738 | - | | | 222,261,738 | | 222,261,738 |
| C. ගොඩනැගිලි | 131,017,606 | - | | | 131,017,606 | | 131,017,606 |
| D. ස්විච් ගියර | 13,973,767 | - | | | 13,973,767 | | 13,973,767 |
| E. අපවර්තක | 79,091,306 | - | | | 79,091,306 | | 79,091,306 |
| F. ට්‍රාන්ස්පෝමර | 45,753,626 | - | | | 45,753,626 | | 45,753,626 |
| G. විදුලි ඉලෙක්ට්‍රොනික් උපකරණ | 31,257,940 | 361,100 | | | 31,619,040 | | 31,619,040 |
| I. සනීපාරක්ෂක සහ ජලනල | 166,473,900 | 25,575 | | | 166,499,475 | | 166,499,475 |
| J. කේබල් | 100,224,571 | - | | | 100,224,571 | | 100,224,571 |
| K. ලී බඩු සවිකිරීම් සහ කාර්යාල උපකරණ | 3,014,584 | - | | | 3,014,584 | | 3,014,584 |
| L. මෙවලම් | 14,243,433 | 5,000 | | | 14,248,433 | | 14,248,433 |
| M. යන්ත්‍රෝපරණ | 4,001,375 | 46,000 | | | 4,047,375 | | 4,047,375 |
| H. වෙනත් | 60,039,664 | - | | | 60,039,664 | | 60,039,664 |
| ප්‍රදර්ශන උපකරණ | 354,853 | - | | | 354,853 | | 354,853 |
| UNDP ව්‍යාපෘති වල ස්ථාවර වත්කම් | 19,500 | 504,800 | | | 524,300 | | 524,300 |
| | **1,865,288,900** | **5,168,342** | **444,421** | **(925,921)** | **1,824,119,291** | **45,856,451** | **1,869,975,742** |

**ක්ෂය ගිණුම**

| විස්තරය | ක්ෂය අනුපාතය % | 2015 කාලය තුල ක්ෂය රු. | 31.12.2015 දිනට ශේෂය රු. | 2016 කාලය තුල ක්ෂය රු. | 2016 කාලය තුල බැහැර කිරීම් රු. | 31.12.2016 දිනට ශේෂය රු. | 31.12.2016 දිනට ශුද්ධ පොත් අගය රු. |
|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | 0 | | | | | - | 45,856,451 |
| ගොඩනැගිලි | 5 | | | | | - | - |
| ලී බඩු සහ කාර්යාල උපකරණ | 25 | 2,379,666 | 15,790,951 | 2,472,572 | | 18,263,523 | 1,341,947 |
| වාහන | 20 | 1,158,245 | 47,361,824 | 1,247,215 | | 48,609,039 | 3,657,456 |
| ජායාපිටපත් යන්ත්‍ර | 25 | (438,462) | 1,811,405 | 281,070 | | 2,092,475 | 901,716 |
| පරිඝණක | 33.33 | 3,099,306 | 28,414,885 | 1,828,688 | | 30,243,573 | 3,377,697 |
| විදුලි භාණ්ඩ | 25 | 52,682 | 314,754 | 52,682 | | 367,436 | 61,761 |
| පුස්තකාල පොත් | 20 | 71,175 | 493,153 | 203,408 | | 696,561 | 741,791 |
| බලශක්ති උපකරණ | 33.33 | 7,041,829 | 89,244,037 | 2,238,248 | | 91,482,285 | 101,102 |
| සුලං කුළුණු හා උපකරණ | 20 | 9,648,214 | 39,239,109 | 6,433,908 | (324,046) | 45,348,971 | 1,889,831 |
| ශීතකරණ පරීක්ෂා කිරීමේ රසායනාගාරය | 20 | 8,433,067 | 16,288,527 | 8,433,067 | | 24,721,594 | 17,443,743 |
| සූර්ය සහ සුළු ජල ව්‍යාපෘති | | - | | | | - | - |
| A. සූර්ය පැනල | 5 | 33,024,410 | 148,732,470 | 33,025,517 | | 181,757,987 | 478,348,465 |
| B. වානේ ව්‍යුහයන් | 10 | 22,226,174 | 98,859,540 | 22,226,174 | | 121,085,714 | 101,176,024 |
| C. ගොඩනැගිලි | 5 | 6,444,377 | 28,443,536 | 6,560,293 | | 35,003,829 | 96,013,777 |
| D. ස්විච් ගියර් | 20 | 2,794,753 | 13,782,344 | 191,421 | | 13,973,765 | 2 |
| E. අපවර්තක | 20 | 15,732,456 | 71,561,272 | 7,081,112 | | 78,642,384 | 448,922 |
| F. ට්‍රාන්ස්පෝමර | 5 | 2,287,681 | 10,236,139 | 2,287,681 | | 12,523,820 | 33,229,806 |
| G. විදුලි ඉලෙක්ට්‍රොනික් උපකරණ | 33.33 | 3,770,899 | 30,169,921 | 1,121,099 | | 31,291,020 | 328,020 |
| I. සනීපාරක්ෂක සහ ජලනල | 5 | 8,323,695 | 36,772,641 | 8,324,143 | | 45,096,784 | 121,402,691 |
| J. කේබල් | 20 | 20,044,914 | 88,759,497 | 11,454,590 | | 100,214,087 | 10,484 |
| K. ලී බඩු සවිකිරීම් සහ කාර්යාල උප. | 25 | 442,990 | 2,989,541 | 12,539 | | 3,002,080 | 12,504 |
| L. මෙවලම් | 33.33 | 47,340 | 14,050,642 | 54,977 | | 14,105,619 | 142,814 |
| M. යන්ත්‍රෝපකරණ | 20 | 800,275 | 2,589,530 | 756,753 | | 3,346,283 | 701,092 |
| H. වෙනත් | 20 | 12,007,933 | 52,962,987 | 7,004,694 | | 59,967,681 | 71,983 |
| ප්‍රදර්ශන භාණ්ඩ | 25 | 500 | 354,725 | 128 | | 354,853 | - |
| ස්ථාවර වත්කම් - UNDP ව්‍යාපෘති | | - | | 69,637 | | 69,637 | 454,663 |
| | | **159,394,119** | **839,223,430** | **123,361,616** | **(324,046)** | **962,261,000** | **907,714,742** |

අප්පෘෂ්ය වත්කම්

| විස්තරය | 2015 වසරේ අත්පත් කර ගැනීම් | 31.12.2015 දිනට ශේෂය රු | 2015 වසරේ අත්පත් කර ගැනීම් | 31.12.2016 දිනට ශේෂය රු |
|---|---|---|---|---|
| පරිඝණක මෘදුකාංග | 2,085,000 | 2,085,000 | 8,345,683 | 10,430,683 |
| දත්ත සහ තොරතුරු | 3,558,450 | 4,455,250 | 896,800 | 4,455,250 |
| | 5,643,450 | 6,540,250 | 9,242,483 | 14,885,933 |

**3 සටහන : නොනිමි කාර්යය**

| | **31.12.2016** | **31.12.2015** |
|---|---|---|
| පුනර්ජනනීය බලශක්ති තක්සේරුව | 2,377,000 | 2,377,000 |
| ADB quantum Leap - WRA (wind force) | 2,299,935 | 2,299,935 |
| Energy Efficiency Utilization of pv thru DC Micri grid | 442,000 | 442,000 |
| කාර්යාල ගොඩනැගිල්ල | 3,936,978 | 668,893 |
| විදුලියෙන් දුවන අනුරූ වාහනය | 7,956,800 | 7,956,800 |
| සුළං මාපක කුළුණ - සාම්පූර් | 130,550 | - |
| සුළං මාපක කුළුණ - නාඩුකුඩා | 1,775,025 | - |
| clean Energy Network Efficiency Project | 15,788 | - |
| Revision of code for Energy Efficiency Building Practi: | 951,777 | - |
| | 19,885,853 | 13,744,628 |

**4 සටහන : ආයෝජන**

ස්ථිර තැන්පතු (බොරැල්ල ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පත් කර ඇත)

| ආයෝජනය කළ දිනය | කල්පිරීමේ දිනය | ආයෝජන අනුපාතය | තැන්පත් ලියා. අං. | **31.12.2016** දිනට තැන්පත් | **31.12.2015** දිනට තැන්පත් |
|---|---|---|---|---|---|
| 21.09.2011. | 21.09.2015 | 11.00% | 2-0061-05-10416 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2015 | 11.00% | 2-0061-05-10432 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2015 | 11.00% | 2-0061-05-10408 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2015 | 11.00% | 2-0061-05-10343 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2015 | 11.00% | 2-0061-05-10335 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2015 | 11.00% | 2-0061-05-10378 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2015 | 11.00% | 2-0061-05-10386 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2015 | 11.00% | 2-0061-05-10327 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2015 | 11.00% | 2-0061-05-10319 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2015 | 11.00% | 2-0061-05-10297 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2015 | 11.00% | 2-0061-05-10289 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2015 | 11.00% | 2-0061-05-102262 | 1,200,000 | 1,200,000 |
| 21.09.2011. | 21.09.2015 | 11.00% | 2-0061-05-10254 | 1,200,000 | 1,200,000 |
| 25.09.2011. | 21.09.2015 | 11.00% | 2-0061-04-12376 | 450,000 | 450,000 |
| 05.10.2011. | 05.10.2015 | 11.00% | 2-0061-03-09834 | 2,894,453 | 2,894,453 |
| 02.05.2014 | 02.05.2015 | 8.50% | 2-0061-09-60845 | 9,039,590 | 8,540,000 |
| 20.10.2014 | 20.10.2015 | 11.00% | 2-0061-09-49981 | 448,169 | 423,400 |
| | | | | **28,432,212** | **27,907,853** |

භාණ්ඩාගාර බිල්පත් - මහජන බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කර ඇති

| ආයෝජනය කළ දිනය | කල්පිරීමේ දිනය | ආයෝජන අනුපාතය | තැන්පත් ලියා. අං. | 31.12.2016 දිනට තැන්පත් | 31.12.2015 දිනට තැන්පත් |
|---|---|---|---|---|---|
| 18.01.2011. | 17.01.2017 | 7.00% | LKB00615C156 | 15,585,004 | 14,807,604 |
| 09.07.2011. | 11.07.2017 | 10.00% | LKB00314J011 | 33,753,677 | 31,893,706 |
| | | | | 49,338,681 | 46,701,310 |

| | | |
|---|---|---|
| **මුළු එකතුව** | **77,770,893** | **74,609,163** |

**5 සටහන**

**ණය අයකර ගැනීම**

| | | **31.12.2016** | **31.12.2015** |
|---|---|---|---|
| ADB ණය (L 2892/93 SRI) සම්පත් බැංකුව | | | |
| ක්ලීන් එනර්ජි නෙට්වර්ක් එෆිසියන්සි ඉම්පෲමන්ට් ප්‍රොජෙක්ට් | | | |
| ණය - ඔරේන්ජ් ෆීල්ඩ් | 2,793,000 | | |
| ණය - මිආමි ක්ලෝත් | 2,425,500 | | |
| ණය - ටී5 එස්කේප්ස් | 1,485,000 | | |
| ණය - එම්. ජේ. එෆ් ටීස් | 2,763,600 | | |
| ණය - ඒෂියා බයික් | 2,523,900 | | |
| ණය - මිආමි ක්ලෝතින් | 5,659,500 | | |
| ණය - එස්. ජී. ජෝසප් සහ සහෝදරයෝ | 4,649,809 | | |
| ණය - එම්. ජේ. එෆ් ටීස් | 6,448,400 | | |
| ණය - මවුන්ට් එලීසා ටී ෆැක්ටරි | 2,718,000 | | |
| ණය - ඒෂියා බයික් | 2,523,900 | | |
| ණය - මීසන් ඇන්ඩ් කම්පැනි | 3,450,000 | | |
| ණය - ලයිටි හවුස් හොටෙල් | 2,991,900 | | |
| ණය - ඒෂියා බයික් ඉන්ඩස්ට්‍රියල් | 3,365,200 | | |
| ණය - එස්. ජී. ජෝසප් | 1,862,000 | 45,659,709 | - |
| ADB ණය (L 2892/93 SRI) ජාතික සංවර්ධන බැංකුව | | | |
| සුනිත්‍ය බලශක්ති අංශය සඳහා උපයෝගී වන ව්‍යාපෘති | | | |
| ණය - ඇඹිලිපිටිය ප්ලාන්ටේෂන් | 7,110,000 | | |
| ණය - වටවල ප්ලාන්ටේෂන් | 7,770,000 | 14,880,000 | - |
| | | 60,539,709 | - |

**6 සටහන - අය විය යුතුයි**

| | 31.12.2016 | 31.12.2015 |
|---|---|---|
| ස්ථාවර තැන්පතු සඳහා අයවිය යුතු පොලිය | 1,104,643 | 701,875 |
| භාණ්ඩාගාර බිල්පත් සඳහා අයවිය යුතු පොලිය | 2,688,109 | 1,609,523 |
| බලශක්ති උත්පාදනය - හම්බන්තොට/ ඉඳුරාණ | 8,691,945 | 13,109,742 |
| ලංකා විදුලිබල මණ්ඩලය - ආර්. සී. එල්. කුලිය | 8,033,271 | - |
| සේවකයින්ගෙන් අයවිය යුතු | 2,382 | 2,382 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු බදු මුදල් | 280,458 | 2,071,868 |
| දේශීය පුහුණු වැඩසටහන් (අවිනිශ්චිත) | 443,309 | 348,381 |
| | 6,309 | 24,715 |
| හෙරිටනස් අහුන්ගල්ල | 35,659 | 35,659 |
| | - | - |
| | **21,286,085** | **17,904,145** |
| **මුළු මුදල** | 21,286,085 | 17,904,145 |

| | 31.12.2016 | 31.12.2015 |
|---|---|---|
| **7 සටහන: වෙනත් ජංගම වත්කම්** | | |
| **අත්තිකාරම් / ආපසු ගෙවන තැන්පත්** | | |
| සී.එෆ්.එල් ණය | | |
| බලශක්ති අරමුදලින් අධිකාරියට ලැබිය යුතු | 12,176,162 | 14,586,777 |
| වෛද්‍ය රක්ෂණය | 500 | 500 |
| තැන්පත් ඉන්ධන | 186,500 | 186,500 |
| හම්බන්තොට - ලංවිම තැන්පත් | 52,000 | 52,000 |
| ඉදුරාන - ලංවිම තැන්පත් | 62,500 | 62,500 |
| දුරකථන තැන්පත් | 351,048 | 351,048 |
| දුරකථන තැන්පත් - මොබිටෙල් | 2,000 | 2,000 |
| තැන්පත් - එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරණායක අනුස්මරණ අරමුදල | 340,429 | 284,280 |
| තැන්පත් - ජල සම්පාදන මණ්ඩලය | 2,500 | |
| වැඩසටහන් වැනි අත්තිකාරම් | 190,093 | 27,990 |
| තැන්පත් - හම්බන්තොට නේවාසිකාගාර කුලි | 132,000 | 132,000 |
| තැන්පත් - ස්ප්‍රිං වෝටර් පුද්. සමාගම | 3,500 | 3,500 |
| අත්තිකාරම් - ඩබ්.ඩී.ජී.එස්. ඔනිල් | 2,100,000 | - |
| ධීවර අමාත්‍යංශය - දකුණු පළාත් සභාව | 1,800,000 | 1,800,000 |
| තැන්පත් - ඇමරිකන් ප්‍රිමියම් වෝටර් | 23,000 | 23,000 |
| තැන්පත් - ජාතික තරුණ | 40,000 | 40,000 |
| තැන්පත් - ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය | 5,000 | 5,000 |
| අත්තිකාරම් - ශ්‍රී ලංකා ජාතික රෝහල | 475,000 | 475,000 |
| අත්තිකාරම් - සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව වයඹ පළාත | 26,777 | 26,777 |
| අත්තිකාරම් - දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට | 23,992 | 2,199,668 |
| අත්තිකාරම් - කර්මාන්ත තාක්ෂණ ආයතනය | 97,680 | 97,680 |
| අත්තිකාරම් - මහවැලි රීච් හෝටෙල් | 231,388 | 231,388 |
| අත්තිකාරම් - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 700,000 | 700,000 |
| අත්තිකාරම් - ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 150,000 | 150,000 |
| අත්තිකාරම් - පානදුර නගර සභාව | 24,725 | - |
| අත්තිකාරම් - විෂුවල් බිස්නස් සිස්ටම් | 510,622 | - |
| අත්තිකාරම් - රංජිත් රුවන් විජේවර්ධන | 108,000 | - |
| අත්තිකාරම් - ලංවිම සූරිය වැව | 100,750 | - |
| අත්තිකාරම් - ශ්‍රී ලංකා පදනම | 97,000 | - |
| අත්තිකාරම් - ඩබ්.ඩී.ජී.එස්. ඔනිල්, වැඩසටහන් කළමනාකරණ අංශය | 2,578,450 | - |
| අත්තිකාරම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - රුවන්වැල්ල | 256,360 | - |
| අත්තිකාරම් - එන්.සී.පී. අධ්‍යාපන දෙපාර්තමේන්තුව - අනුරාධපුර | 2,000,000 | - |
| අත්තිකාරම් - රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය | 84,150 | - |
| අත්තිකාරම් - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - ඌව | 1,253,150 | - |
| අත්තිකාරම් - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - නැගෙනහිර | 1,323,300 | - |
| අත්තිකාරම් - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුර | 1,618,300 | - |
| අත්තිකාරම් - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - වයඹ | 1,120,850 | - |
| අත්තිකාරම් - බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය | 280,122 | - |
| අත්තිකාරම් - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - මධ්‍යම | 1,976,480 | - |
| අත්තිකාරම් - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - දකුණ | 2,156,715 | - |
| අත්තිකාරම් - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව | 1,122,542 | - |
| අත්තිකාරම් - රජයේ මුද්‍රණ | 2,365,000 | - |
| අත්තිකාරම් - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - බස්නාහිර | 776,750 | - |
| අත්තිකාරම් - සුගතදාස බණ්ඩාර සහ පුත්‍රයෝ | 64,260 | - |
| අත්තිකාරම් - බී.එම්.අයි.සී.එච් | 75,000 | - |
| | 39,064,595 | 21,437,608 |
| **චක්‍රීය අරමුදල** | | |
| ආපදා ණය | 10,864,008 | 7,925,100 |
| විශේෂ අත්තිකාරම් | 4,585 | 4,585 |
| උත්සව අත්තිකාරම් | 31,989 | 45,739 |
| | 10,900,582 | 7,975,424 |
| | **49,965,177** | **29,413,032** |

| | 2016 | 2015 |
|---|---|---|
| **8 සටහන: මුදල් හා මුදල් වලට සමාන දෑ** | | |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව - බොරැල්ල | 160,380,083 | 153,623,898 |
| මහජන බැංකුව -SEA-078-1-001-8-8-503576 | 13,512,846 | 6,434,270 |
| මහජන බැංකුව -SEA-078-1-002-7-8-503576 | 4,578,684 | 4,578,684 |
| ලංකා බැංකුව - ටොරිංටන් - චක්‍රීය අරමුදල | 343,943 | 1,875,373 |
| ලංකා බැංකුව - ටොරිංටන් - අධිකාරියේ අරමුදල් | 20,969,081 | 31,943,304 |
| ලංකා බැංකුව - ටොරිංටන් - බලශක්ති අරමුදල | 146,248,232 | 67,611,240 |
| | **346,032,869** | **266,066,769** |

**9 සටහන : රැස්වූ අරමුදල**

බලශක්ති සංරක්ෂණ අරමුදලේ (ECF) 2007 සැප්තැම්බර් 30 දිනට සමුච්චිත අරමුදල් 2007 ඔක්තෝබර් 1 දින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට (SLSEA) මාරු කර ඇත. එහි පහත දෑ අඩංගුවේ:

| | | |
|---|---|---|
| රැස්වූ අරමුදල - 2007 සැප්. 30 දිනට | 7,076,392 | 7,076,392 |
| මූලික ප්‍රාග්ධනය | 5,000,000 | 5,000,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන - විදුලි හා බලශක්ති අමාත්‍යාංශය | 5,761,145 | 5,761,145 |
| ප්‍රාග්ධන ප්‍රදානය UNDP | 3,612,560 | 3,612,560 |
| දානපත ප්‍රදාන - ආහාර සහ කෘෂිකර්ම සංවිධානය | 650,239 | 650,239 |
| සුනිත්‍ය ඇප අරමුදල | | |
| එකතුව | 22,100,336 | 22,100,336 |

| | 2016 | 2015 |
|---|---|---|
| **10 සටහන: විලම්බිත ප්‍රදාන** | | |
| ප්‍රාග්ධන ප්‍රදාන 2008 | 33,770,435 | 33,770,435 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2009 | 11,955,533 | 11,955,533 |
| විදේශීය ප්‍රදාන 2009 - ජපන් | 24,165,380 | 24,165,380 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2010- හම්බන්තොට සූර්ය බල උද්‍යානය | 46,693,991 | 46,693,991 |
| - ක්‍රමක්ෂය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | 10,646,819 | 10,646,819 |
| විදේශීය ප්‍රදාන 2010 - ජපන් | 11,419,569 | 11,419,569 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2011- ඉදුරාන කුඩා ජලවිදුලි ව්‍යාපෘතිය | 15,523,945 | 15,523,945 |
| -ක්‍රමක්ෂය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන - ඉදුරාන කුඩා ජලවිදුලි ව්‍යාපෘතිය | 68,798,341 | 68,798,341 |
| විදේශීය ප්‍රදාන 2011- ජපන් | 1,155,016,402 | 1,155,016,402 |
| - කොරියානු | 191,097,075 | 191,097,075 |
| විලම්බිත ප්‍රදාන - විදේශාධාර -2012 - ඒ.ඩී.බී | 15,082,346 | 15,082,346 |
| භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන -2012 | 23,581,236 | 23,581,236 |
| විලම්බිත ප්‍රදාන - ඒ.ඩී.බී - 2013 | 43,416,071 | 43,416,071 |
| විලම්බිත ප්‍රදාන -KOIKA- 2013 | 35,662 | 35,662 |
| භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන /එෆ්.ඒ.ආර්.ඩී.එෆ් -2013 | 41,873,961 | 41,873,961 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2014 | 20,487,827 | 20,487,827 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2015 | 14,655,015 | 14,655,015 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2016 | 18,752,051 | |
| අඩු කළා: | | |
| -විලම්බිත ආදායම-2016 | (123,361,618) | |
| -විලම්බිත ආදායම-2015 | (159,394,219) | (159,394,219) |
| -විලම්බිත ආදායම-2014 | (162,919,374) | (162,919,374) |
| -විලම්බිත ආදායම-2013 | (168,752,494) | (168,752,494) |
| -විලම්බිත ආදායම-2012 | (161,579,648) | (161,579,648) |
| -විලම්බිත ආදායම-2011 | (63,412,336) | (63,412,336) |
| -විලම්බිත ආදායම- පෙර වසරවල | (26,338,720) | (26,338,720) |
| | **881,213,250** | **985,822,817** |

| | 31.12.2016 | 31.12.2015 |
|---|---|---|
| **11 සටහන:** | | |
| **ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල** | | |
| පුනර්ජනනීය බලශක්ති ආදායම | 349,270,722 | 234,856,712 |
| උපකරණ කුලියට ගැනීම හා බලශක්ති විගණනය | 24,927,402 | 23,657,099 |
| ඉතිරි කිරීමේ ගිණුමේ පොලිය - ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 47,758,836 | 36,591,569 |
| රඳවුම් බද්ද | (726,127) | (258,884) |
| බලශක්ති අරමුදලේ වැඩසටහන්/ ක්‍රියාකාරකම් වලින් ඉවත්වීම | (80,974,096) | (42,400,282) |
| කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීම | (47,000,000) | (47,000,000) |
| ලංකා බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම - ආරම්භක පිරිවැය | 500 | 500 |
| | **293,257,237** | **205,446,714** |
| **12 සටහන: වෙනත් ගෙවීමට ඇති දෑ** | | |
| සුනිත්‍ය බලශක්ති අරමුදල | | - |
| අධිකාරියට ගෙවිය යුතු අරමුදල - බලශක්ති අරමුදලින් | 12,176,162 | 14,586,777 |
| ස්විච් ඒෂියා පාලන ගිණුම | 4,548,176 | 4,548,176 |
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 500 | 500 |
| උපචිත වියදම් | 11,645,917 | 11,579,596 |
| ඉදිරිපත් නොකළ චෙක්පත් | 173,696 | 121,271 |
| ගෙවීම් - පුනර්ජනනීය බලශක්ති පැනල ලියාපදිංචි ගාස්තු | 295,860 | |
| බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව | | 2,146,796 |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 470,000 | |
| යූ.එන්.ඩී.පී. - නාමා ව්‍යාපෘතිය | 1,036,803 | |
| යූ.එන්.ඩී.පී. - බයෝමාස් ව්‍යාපෘතිය | 1,970,834 | |
| ***ණයගැතියෝ*** | | |
| පුනර්ජනනීය බලශක්ති - ඊ නෙට් සොලුෂන්ස් පුද්. සමාගම | 1,667,500 | 1,667,500 |
| බලශක්ති උපකරණ ලබා ගැනීම - ඊ නෙට් සොලුෂන්ස් පුද්. සමාගම | 326,025 | 326,025 |
| අත්පත් කර ගැනීම් | 3,167,807 | 1,614,807 |
| නාරාහේන්පිට ජාතික පොළ | 99,405 | 99,405 |
| වෙනත් ණයගැතියෝ | | (1) |
| ***විවිධ ණයගැතියෝ*** | | |
| ශ්‍රී ලංකා රේගුව | 310,748 | 310,748 |
| සුභසාධන සමිතිය SEA | 442 | 442 |
| ***ආපසු ගෙවන තැන්පතු:*** | | |
| සීමා/ ඊ-නෙට් සොලුෂන්ස් (පුද්.) සමාගම | 10,000 | 10,000 |
| ඊ.එන්.එල්. උපදේශන | 150,000 | 150,000 |
| සිග්මා ටෙක්නොලොජීස් | 10,000 | 10,000 |
| සීමා. රේන්කෝ පුනර්ජනනීය බලශක්ති (පුද්.) සමාගම | 30,000 | 30,000 |
| විදුල්කා ප්‍රදර්ශනය | 9,256 | 9,256 |
| ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව | 54,000 | 54,000 |
| ආපසු ගෙවන තැන්පත් - වාහන | 14,000 | 14,000 |
| ඒ.ටී.ඒ ඉන්ටර්නැෂනල් | 50,000 | 50,000 |
| රුහුණු සූර්ය බලශක්ති පද්ධති | | 75,000 |
| විදුල්කා සම්මන්ත්‍රණය | 25,000 | 25,000 |
| | **38,242,131** | **37,429,298** |

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| **13 සටහන : ව්‍යාපෘති වියදම් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන** | | |
| ප්‍රාග්ධන ප්‍රදාන - මහා භාණ්ඩාගාරයෙන් | 60,000,000 | 42,565,536 |
| ගෙවීම් මාරු කිරීම් - මුරෙ 295 (1) යටතේ | | |
| | | |
| අඩු කළා: | | |
| කාර්ය සාධනය | (4,341,226) | (6,805,978) |
| අප්පෘෂ්ය වත්කම් | (9,242,483) | (113,450) |
| ප්‍රාග්ධන වත්කම් - තථ්‍ය වසරේ අත්පත් කරගත් | (5,168,342) | (7,735,587) |
| | **41,247,949** | **27,910,521** |
| | | |
| **14 සටහන : ක්‍රමක්ෂිත විලම්භිත ප්‍රදාන** | | |
| තථ්‍ය වසරේ ක්ෂයවීම් | 123,361,618 | 159,394,219 |
| පෙර වසර වල ක්ෂයවීම් | | |
| | **123,361,618** | **159,394,219** |
| | | |
| **15 සටහන : වෙනත් ආදායම්** | | |
| බලශක්ති බලපත්‍ර ගාස්තු | 57,407,265 | 31,813,385 |
| ස්ථාවර තැන්පතු පොලිය | 237,635 | 1,207,403 |
| සාක් බලශක්ති මධ්‍යස්ථානය | | |
| ආපදා ණය පොලිය | 391,525 | 389,555 |
| විශේෂ අත්තිකාරම් පොලිය | 2,202 | 3,110 |
| බලශක්ති ජනන ආදායම - හම්බන්තොට | 33,404,790 | 42,049,876 |
| බලශක්ති ජනන ආදායම -ඉදුරාන | 1,335,492 | 3,559,824 |
| බලශක්ති කළමනාකරුවන් පුහුණු කිරීමේ ප්‍රගතිය | 64,954 | 359,250 |
| විදුල්කා ප්‍රදර්ශනය (අනුග්‍රහය) | | |
| විදුල්කා ප්‍රදර්ශනය (කුටි) | | |
| ස්විච් ඒෂියා වැඩසටහන | | |
| බලශක්ති කළමනාකරුවන් පිළිගැනීමට ලක් කිරීම | | |
| වෙනත් ආදායම් | 1,644,335 | 429,021 |
| | | |
| බලශක්ති අරමුදලේ ආදායමින් ඉඩමක් මිලදී ගැනීම සඳහා | | 47,000,000 |
| බලශක්ති අරමුදල් ආදායම | 38,573,814 | 12,057,675 |
| වට්නාකම් එකතුකළ බදු - බදු ගත හැකි ආදායම | | |
| සුලං දත්ත ආදායම | | |
| දැල්වීම් පරීක්ෂාව | | 175,000 |
| කාර්ය සාධන පරීක්ෂණ ගාස්තු | 287,500 | |
| | **133,349,512** | **139,044,099** |

**16 සටහන : ව්‍යාපෘති වියදම්**

| **පුනර්ජනනීය බලශක්ති** | **2016** | **2015** |
|---|---|---|
| | රු. | රු. |
| 1 සම්පත් පැවරීම හා සංවර්ධනය | 883,505 | 551,826 |
| 2 ප්‍රගතිය අධීක්ෂණය | 1,026,650 | 210,453 |
| 3 තාක්ෂණ සංවර්ධනය සහ පර්යේෂණය කිරීම | 1,809,305 | 1,762,389 |
| 4 පුනර්ජනනීය බලශක්ති සේවා | 31,902,188 | 10,280,995 |
| 5.1 දාන අරමුදල් සැපයූ ව්‍යාපෘති - සුනිත්‍ය බලශක්ති අංශය | 2,990,724 | 3,106,625 |
| 5 දාන අරමුදල් සැපයූ ව්‍යාපෘති - යූ.එන්.ඩී.පී. බයෝ මාස් ව්‍යාපෘතිය | 2,691,954 | 4,388,732 |
| 5.5 දාන අරමුදල් සැපයූ ව්‍යාපෘති -ක්ලීන් එනර්ජි නෙට්වර්ක් එෆිසියන්සි | 51,635,867 | 3,185,627 |
| 5.5 දාන අරමුදල් සැපයූ ව්‍යාපෘති - විදේශ විනිමය මාරු කිරීමේ පාඩුව | (24,365) | 39,000 |
| 5.6 නාමා | 2,036,947 | - |
| 6 හම්බන්තොට පුනර්ජනනීය බලශක්ති පරිශ්‍රය ක්‍රියාවට නැංවීම | 8,851,875 | 6.766,182 |
| 7 ඉදුරාණ පරිශ්‍රය ක්‍රියාවට නැංවීම | 1,834,814 | 1,597,884 |
| | **105,639,464** | **31,889,713** |

| බලශක්ති කළමනාකරණ | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| 1. බලශක්ති කළමනාකරණ පර්ශදයක් පිහිටුවීම | 10,907,130 | 6,939,616 |
| 2. ප්‍රමිති හා රෙගුලාසි හඳුන්වාදීම | 2,321,326 | 611,912 |
| හරිත ගොඩනැගිලි වැඩසටහන 1-7 | 530,000 | |
| හරිත ගොඩනැගිලි වැඩසටහන 1-15 | | |
| 3. උපදේශාත්මක හා මඟපෙන්වීමේ සේවා සැපයීම | 73,904 | 72,862 |
| 4. ජයග්‍රහණ ඇඟයීම | 8,965,350 | 7,319,577 |
| 5. ක්ෂේත්‍ර විශේෂිත වැඩසටහන් | 1,456,034 | 1,711,166 |
| 6. පර්යේෂණ හා සංවර්ධන | 7,125 | 2,098,844 |
| 7. නියාමන ව්‍යාපෘති ඇරඹීම | | 780,263 |
| 8. බලශක්ති විගණනය | | 2,598,873 |
| උපදේශන සේවා | 408,439 | |
| 9. ඉල්ලුම් කළමනාකරණ | 1,873,823 | |
| | 26,543,131 | 22,133,113 |

| දැනුම් කළමනාකරණය | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| 1. බලශක්ති අධ්‍යාපන වැඩසටහන | 22,886,248 | 9,994,530 |
| 2. සන්නිවේදන වැඩසටහන | 3,772,951 | 4,812,136 |
| | 26,659,199 | 14,806,666 |

| උපක්‍රමික ක්‍රියාකාරකම් | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| 1. බලශක්ති දත්ත හා තොරතුරු සැකසීම සහ පලකිරීම | 1,392,336 | 1,944,284 |
| 2. ඉන්ධන පිරවුම්හල් ජාතික සමීක්ෂණය | 21,604 | 6,721,053 |
| 3. දේශීය බලශක්ති ඉල්ලුම හදුනාගැනීම | | 911,334 |
| 4. බලශක්ති ප්‍රතිපත්ති පර්යේෂණ වැඩමුළු | | 1,140,670 |
| පර්යේෂණ හා සංවර්ධන | 4,477,600 | |
| බලශක්ති පාර්භෝගික සමීක්ෂණය | 1,497,122 | |
| සුනිත්‍ය බලශක්ති හඳුන්වාදීම | 229,990 | |
| | 7,618,652 | 10,717,341 |
| ව්‍යාපෘති සඳහා මුළු වියදම | **166,460,446** | **79,546,833** |

| පුනරාවර්ථන වියදම් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| **17 සටහන : වැටුප් හා දීමනා** | | |
| කාර්ය මණ්ඩල වැටුප් | 48,257,110 | 46,665,650 |
| ජීවන වියදම් දීමනාව | 8,556,600 | 8,751,600 |
| කාර්ය මණ්ඩල දීමනා | | 5,839,872 |
| සේ.අ.අ. 12% | 7,387,725 | 6,654,047 |
| සේ.භා.අ. 3 % | 1,845,834 | 1,663,161 |
| අතිකාල සහ නිවාඩු පඩි | 5,450,447 | 3,700,950 |
| උපයන විට ගෙවීමේ බද්ද | 5,621,087 | 1,305,150 |
| වෛද්‍ය රක්ෂණය | 4,590,000 | |
| සන්තක වාහන භාවිතාව | 1,574,988 | 1,490,837 |
| අභාවිත නිවාඩු | 1,920,000 | 690,000 |
| ඉන්ධන දීමනාව | 2,260,440 | |
| වෘත්තීය දීමනා | 1,895,000 | |
| | 89,359,231 | 76,761,267 |

| | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| **18 සටහන : ප්‍රවාහන සහ යැපීම්** | | |
| ප්‍රවාහන - දේශීය | 603,260 | 559,522 |
| ප්‍රවාහන - විදේශීය | 949,977 | 153,531 |
| | 1,553,237 | 713,053 |
| **19 සටහන : සැපයුම්** | | |
| මුද්‍රන, ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 1,124,947 | 1,329,229 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 3,277,015 | 3,764,224 |
| වෙනත් - පුවත්පත් සහ විවිධ සේවා | 71,020 | 134,275 |
| | 4,472,982 | 5,227,728 |
| **20 සටහන : නඩත්තු වියදම්** | | |
| වාහන නඩත්තුව/ රක්ෂණ සහ බලපත්‍ර ගාස්තු | 7,652,188 | 7,084,759 |
| කාර්යාල උපකරණ නඩත්තුව | 832,454 | 430,170 |
| ගොඩනැගිලි හා ව්‍යුහයන් නඩත්තුව | 98,500 | 92,875 |
| | 8,583,142 | 7,607,804 |
| **21 සටහන : කොන්ත්‍රාත්තුමය සේවා** | | |
| කාර්යාල කුලී හා කුලී ගාස්තු | 30,519,070 | 25,174,703 |
| තැපැල් හා දුරකථන ගාස්තු | 3,800,935 | 2,613,004 |
| ප්‍රවාහන | 1,011,657 | 802,329 |
| විගණන ගාස්තු | 600,000 | 600,000 |
| | 35,931,662 | 29,190,036 |
| **22 සටහන: ක්ෂය වියදම්** | | |
| ලී බඩු සහ කාර්යාල උපකරණ | 2,472,572 | 2,379,666 |
| වාහන | 1,247,215 | 1,158,245 |
| ජායා පිටපත් යන්ත්‍රය | 281,070 | (438,362) |
| පරිඝණක | 1,828,688 | 3,099,306 |
| විදුලි භාණ්ඩ | 52,682 | 52,682 |
| පුස්තකාල පොත් | 203,408 | 71,175 |
| බලශක්ති උපකරණ | 2,238,250 | 7,041,829 |
| සුළං කුළුණු හා උපකරණ | 6,433,908 | 9,648,214 |
| ශීතකරණ පිරික්සුම් රසායනාගාරය | 8,433,067 | 8,433,067 |
| හම්බන්තොට හා ඉදුරාන බලශක්ති උද්‍යාන | 100,100,993 | 127,947,897 |
| ප්‍රදර්ශන උපකරණ | 128 | 500 |
| UNDP ව්‍යාපෘති සඳහා ස්ථාවර වත්කම් | 69,637 | |
| | 123,361,618 | 159,394,219 |

**23 සටහන : වෙනත් පුනරාවර්තන වියදම්**

| | | |
|---|---|---|
| කාර්යාල සහ වෙනත් විවිධ වියදම් | 1,447,356 | 2,255,581 |
| පුවත්පත් දැන්වීම් | 587,220 | 246,186 |
| රක්ෂණ | 34,103 | 32,966 |
| භාෂා පරිවර්තන ගාස්තු | 101,863 | 41,721 |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික දීමනා | 882,400 | 465,000 |
| සංග්‍රහ වියදම් | 576,842 | 506,147 |
| කම්කරු කුලී | | |
| සුභසාධන වියදම් | | |
| දේශීය/ විදේශ පුහුණු වැඩසටහන් | 2,155,091 | 3,213,688 |
| බැංකු ගාස්තු | | 27,388 |
| විදුල්කා හා මහජන දැනුවත් කිරීම් | | |
| ජාතික ගොඩනැගිලි බද්ද (NBT) | | 1,246,711 |
| බොල් ණය | 3,137,024 | |
| | **8,921,899** | **8,035,388** |

**24** සටහන

පෙර වසර වල ප්‍රති ප්‍රකාශනය

| | 2015 | |
|---|---|---|
| | රු. | |
| | (Dr)/ Cr | |
| 1. ක්‍රියාකාරකම් - බලශක්ති කළමනාකරණ | 177,600 | Dr |
| ගෙවීමට ඇති | 177,600 | Cr |
| (බහු මාධ්‍ය කැමරාවක් මිලදී ගැනීම - විදුල්කා 2015) | | |
| | | |
| 2. කාර්යාල කුලීය | 1,969,196 | Dr |
| BMICH සඳහා ගෙවීම | 1,969,196 | Cr |
| (2015 කාර්යාල කුලී සඳහා වූ මුදල 2016 වාර්තා කිරීම) | | |
| | | |
| 3. කාර්ය මණ්ඩල පුහුණු | 27,941 | Dr |
| සේවකයින්ගෙන් ලැබිය යුතු මුදල් | 27,941 | Cr |
| (සේවකයින් 2 නෙකු සඳහා සම්පූර්ණ කරන ලද පාඨමාලා - 2015) | | |
| | | |
| 4. එකතුකල ක්ෂය කිරීම - ඡාය පිටපත් යන්ත්‍රය | 811,685 | Dr |
| ක්ෂය කිරීම - ඡාය පිටපත් යන්ත්‍රය | 811,685 | Cr |
| (ගිය වසරේ ක්ෂය කිරීම නිවැරදි කිරීම) | | |
| | | |
| 5. බලශක්ති අරමුදලෙන් මුදල් ගැනීම | 47,000,000 | Dr |
| බලශක්ති අරමුදලේ ආදායම | 47,000,000 | Cr |
| (ඉඩම් මිලදී ගැනීම සඳහා) | | |
| | | |
| බලශක්ති අරමුදලෙන් ලැබීම් | 1,838,373 | Dr |
| බලශක්ති අරමුදලෙන් ගෙවීම | 1,838,373 | Cr |
| ( VAT සඳහා මාරු කිරීම) | | |
| | | |
| බලශක්ති අරමුදලේ ආදායම | 690,729 | Dr |
| බලශක්ති අරමුදලෙන් මුදල් ගැනීම | 690,729 | Cr |
| (Output VAT පරිවර්තනය කිරීම ආපසු හැරවීම) | | |
| | 52,515,524 | |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } පීඕර්/ඊ/එස්එල්එස්ඊඒ/ එෆ්එස්/2016/04 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2018 පෙබරවාරි/ 15 දින

සභාපති

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය නිරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ඊට කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා දිගුකාලීන බද්ද පදනම මත රු.45,856,451 ක් (රු.4,856,451 ක බදු ද ඇතුලත් ) වැය කර 2015 වර්ෂයේදී ඉඩමක් මිලදී ගෙන තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම ඉඩම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි බද්ද දේපලක් ලෙස වෙනම දක්වා නොතිබුණු අතර 2016 දෙසැම්බර් 31 දින දක්වා ඉඩමෙහි වටිනාකම ක්‍රමක්ෂය කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ii) ඉඩම බදු ගැනීම වෙනුවෙන් බලශක්ති අරමුදලින් ලබාගත් රු.47,000,000 ක මුදල ප්‍රාග්ධන ලැබීම් ලෙස නොව අයභාර ලැබීමක් ලෙස හඳුනාගෙන 2015 වර්ෂයේ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයෙහි වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. මේ හේතුවෙන් එම වර්ෂයේ අතිරික්තය රු.47,000,000 කින් අධිගණනය වී තිබුණි.

(iii) ඉඩම වෙනුවෙන් දරන ලද එකතු කළ අගය මත බදු වටිනාකම රු. 2,698,675 ක් වුවද බලශක්ති අරමුදලට රු. 5,020,368 ක් හර කිරීම හේතුවෙන් එම අරමුදල් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 2,321,693 කින් ඌන ගණනය වී තිබුණි.

(iv) 2015 හා 2016 වර්ෂවලදී එම ගොඩනැගිල්ල සැලසුම් කිරීම වෙනුවෙන් වියදම් දැරීම සඳහා රු.3,936,978 ක් බලශක්ති අරමුදල් ආයෝජන ගිණුමෙන් ඉවත්කර තිබුණද එය අරමුදල් ගිණුමට හර නොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට අරමුදල් ගිණුමේ ශේෂය එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි.

(v) බලශක්ති අරමුදලින් රු. 47,000,000 ක් ඉවත් කර තිබුණද ඉඩම වෙනුවෙන් දරන ලද මුළු වියදම රු. 45,856,451 ක් වුයෙන් වැඩිපුර ඉවත් කරන ලද රු.1,143,549 අරමුදලට ආපසු ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) හම්බන්තොට සූර්ය බල උද්‍යානය සඳහා 2011 ජුලි 28 දින මහවැලි අධිකාරියෙන් පත්පත් කරගෙන තිබුණු අක්කර 50 ක ඉඩම සමාලෝචිත වර්ෂයේ දී ද තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් රාජ්‍ය ප්‍රදාන ලෙස ලැබී තිබුණු රු.60,000,000 ක මුදලින් වැඩසටහන් වියදම් සඳහා රු.42,144,744 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් ලෙස හඳුනාගත යුතු වුවද රු.41,247,949 ක් පමණක් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) නොපැවරුණු ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ක්‍රියාත්මක තිරසාර බලශක්ති අංශය අදියර 2 ව්‍යාපෘතිය හා පිවිතුරු බලශක්තිය සහ ජාල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ නිකුත් කරන ලද රු.62,560,065 ක් වූ ණය, ගෙවීමේ වගකීම අධිකාරියට පවරා නොතිබියදී අධිකාරිය විසින් ජංගම නොවන බැරකම් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණි.

## 2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට බලශක්ති අරමුදලේ ශේෂය රු.293,257,237 ක් වූ අතර එදිනට ආයෝජන ශේෂය රු.306,628,315 ක් වූයෙන් රු.13,371,078 ක වෙනස සංසන්දනය කර නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු පොලී ආදායම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 1,231,353 ක් ඇප අරමුදලට බැර කළ යුතු වුවත් රු. 1,136,900 ක් බැර කර තිබීම හේතුවෙන් රු. 94,453 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.4 අසම්භාව්‍ය බැරකම්

------------------------

2008 මාර්තු 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලංකා විදුලි බල මණ්ඩලය සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධනකරුවන් සඳහා නව ගාස්තු ක්‍රමය ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව " Cost based tariff " ක්‍රමය යටතේ පිරිවැයෙන් සියයට 90 ක් ලංකා විදුලි බල මණ්ඩලය දැරීමටත් ඉතිරි සියයට 10 සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ප්‍රතිපූරණය කිරීමටත්

තීරණය කර තිබුණි. මෙම තීරණය මත 2010 දෙසැම්බර් 31 දිනට සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු රු. 897.025.999 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය බැරකම් යටතේ හෙළිදරව් කර තිබුණද එම මුදල පියවීමට කිසිදු වැඩපිළිවෙලක් අධිකාරිය විසින් සකස් කර නොතිබුණි.

## 2.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) Regional Centre for Lighting මධ්‍යස්ථානය වෙනුවෙන් විදුලිබල මණ්ඩලයෙන් අයවිය යුතු රු.8.033.270 ක මුදල 2017 සැප්තැම්බර් 27 දින දක්වාම අයකරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට. ලැබිය යුතු ගිණුම්වල ඇතුළත් වර්ෂයට වැඩි සහ වර්ෂ 4 ට අඩු කාලපරිච්ඡේදයට අදාලව ලැබිය යුතු රු. 565.688 ක ශේෂය හා බාහිර පාර්ශවයන් වෙත ලබා දුන් රු. 3.480.844 ක අත්තිකාරම් සහ සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියේ ප්‍රධාන ක්‍රියාකාරී ව්‍යාපෘති 4 වෙනුවෙන් ලබා දුන් රු.16.397.978 ක අත්තිකාරම් මුදල්ද 2016 දෙසැම්බර් 31 දින දක්වාම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට උපචිත වියදම් ලෙස ගිණුම්වල දක්වා තිබූ රු. 11.645.917 ක් අතරින් රු. 7.269.482 ක් වර්ෂ 05 ට වැඩි කාලයක සිට ද රු. 352.704 ක් වර්ෂ 04 ක කාලයක සිටද, ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර මෙම මුදල නිරවුල් කිරීමට හෝ ඒ සඳහා වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට අධිකාරිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

## 2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

"ස්විච් - ඒෂියා" වැඩ සටහන යටතේ යුරෝපා සංගමයෙන් ලැබී තිබුණු රු. 7.334.354 ක මුදලින් රු. 3.135.202 ක්. 1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව 2010 හා 2011 වර්ෂයන්හි දී අධිකාරියේ සියලු නිලධාරීන් සඳහා වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි. නීත්‍යානුකූල නොවන මෙම ගෙවීම අදාල නිලධාරීන්ගෙන් හෝ ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීමට අමාත්‍යාංශයේ ලේකම් විසින් 2012 දෙසැම්බර් 03 දින දෙන ලද නියෝගය 2017 සැප්තැම්බර් 30 දක්වාම ඉටු කර ගෙන නොතිබුණි.

2.7 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

විගණනයේ දී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත | |
| 46 (3) වගන්තිය | බලශක්ති අරමුදලෙහි අරමුණට පටහැනිව සුනිත්‍ය බලශක්ති අධිකාරියට කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීමට හා එම ගොඩනැගිල්ලෙහි සැලසුම් සකස් කිරීම සඳහා 2015 හා 2016 යන වර්ෂ වලදී එකතුව රු.50,936,978 ක් අධිකාරිය විසින් එම අරමුදලේ ආයෝජන වලින් ඉවත්කර ගෙන තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| II පරිච්ඡේදයේ 13.7 වගන්තිය හා VII පරිච්ඡේදයේ 12.2.6 වගන්තිය | පත්කිරීමේ බලධාරියා විසින් නිසි පරිදි පත්වීම් සිදුකර නොතිබියදී හා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වැඩබැලීමේ දීමනා ලෙස එකතුව රු.2,180,886 ක් ගෙවා තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ වත්කම් සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | එකතුව රු.1,869,975,742 ක් වූ වත්කම් සඳහා වූ ස්ථාවර වත්කම් ලේඛනයක් චක්‍රලේඛය ප්‍රකාරව පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිප්අයි/2002/02 දරන චක්‍රලේඛය | වටිනාකම රු.14,885,933 ක් වූ පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමඟ 2016 වර්ෂය සඳහා වූ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (උ) | 2008 ජූලි 28 දිනැති අංක පීඊඩී/50 හා 2015 මැයි 22 දිනැති අංක පීඊඩී 2015/01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව හා චක්‍රලේඛවලට පටහැනි ලෙස ඉහළ තනතුරුවල වැඩබැලීම් සිදුකරන නිලධාරීන් 06 දෙනෙකු වෙත 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉන්ධන දීමනා ලෙස රු.2,600,000 ක් හා 2015 හා 2016 වර්ෂය තුල අංශ ප්‍රධානීන් තනතුරු 03 ක් වෙනුවෙන් ප්‍රවාහන දීමනා ලෙස රු.1,650,000 ක් ගෙවීම් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,463,693 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 52,410,929 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.45,947,236 ක අඩුවීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේදි ප්‍රාග්ධන ලැබීම් ලෙස ලැබුණු රු.47,000,000 ක් අයභාර ලැබීම් ලෙස හඳුනාගැනීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දි අඛණ්ඩව අතිරික්තයන් ලබා තිබුණ ද 2012 සහ 2013 වර්ෂයන් අතර එය සියයට 71 කින් වර්ධනය වී තිබුණි. ඒ අනුව සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ක්ෂය සැලකීමෙන් පසු අධිකාරියේ දායකත්වයේ සියයට 15 ක වැඩි වීමක් ද දක්නට ලැබුණි. කෙසේ වුව ද 2014 වර්ෂය තුල 2013 ට සාපේක්ෂව සියයට 5ක දායකත්වයේ අඩු වීමක් නිරීක්ෂණය වූ අතර 2015 දි එය 2014 ට සාපේක්ෂව සියයට 17 කින් වැඩිවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

4.1 කාර්යසාධනය
----------------

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතට අනුව අධිකාරියේ ප්‍රධාන පරමාර්ථ පහත සඳහන් කරනු ලැබේ.

(i) බලශක්ති සුරක්ෂිතභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් හඳුනාගැනීම, තක්සේරු කිරීම හා සංවර්ධනය කිරීම,

(ii) ගෘහස්ත, වාණිජමය, කෘෂිකාර්මික, ප්‍රවාහන, කාර්මික සහ වෙනත් යම් අදාල අංශයක භාවිතය සඳහා බලශක්තිය භාවිත කිරීම පිළිබඳ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම සහ බලශක්ති සංරක්ෂණ වැඩසටහන් හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම, සහ

(iii) ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීමෙන් බලශක්තිය බෙදාහැරීම පිළිබඳ සුරක්ෂිතභාවය, විශ්වාසනියත්වය සහ පිරිවැය සඵලදායිතාවය ප්‍රවර්ධනය කිරීම සහ අවම ආර්ථික පිරිවැයට ස්වකීය පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් පවතින බව තහවුරු කිරීම.

ඉහත පරමාර්ථ ඉටුකරගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බලශක්ති විගණනය
---------------------

ලංකාවේ බලශක්ති සේවා සපයන එකම රාජ්‍ය ආයතනය වශයෙන් සුනිත්‍ය බලශක්ති අධිකාරියට බලශක්ති කාර්යක්ෂමතා සේවා සැපයීම (Energy Auditing and Energy efficiency improvement) සම්බන්ධයෙන් සෘජු වගකීමක් ඇති බැවින් අධිකාරිය සතුව ඉංජිනේරුවන් හා තාක්ෂණ නිලධාරීන් ඇතුළු ප්‍රවීන කාර්ය මණ්ඩලයක් හා සංකීර්ණ මැනුම් උපකරණ තිබිය යුතු වුවත් මෙම බලශක්ති සේවා අංශයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සමාලෝචිත වර්ෂයේ දී එක් තාක්ෂණ නිලධාරියකු දක්වා අඩු වීම හා 2008 හා 2010 වර්ෂවල මිලටගෙන තිබුණු මැනුම් උපකරණ භාවිතා කිරීම හේතුවෙන් සේවා සැපයීම පහත වැටී තිබුණි.

(ආ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් මීතොටමුල්ලෙහි අක්කර 3.5 ක ඉඩමක සහ අපද්‍රව්‍ය මගින් මෙගා වොට් 10 ක විදුලි උත්පාදන ව්‍යාපෘතියක් සඳහා Western Power පුද්ගලික සමාගමක් වෙත 2014 මැයි 23 දින බලපත්‍ර (EP – 325530) නිකුත් කර

තිබුණ ද එම බලපත්‍රය වසර 02 ක වලංගු කාලය අවසානයේ දී එනම් 2016 මැයි 22 වන විටද අදාල ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.සන අපද්‍රව්‍ය අපහරණය කිරීමේ ගැටලුවට පිළියමක් ලෙස මෙවැනි ව්‍යාපෘතීන් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු වුවත් බලපත්‍ර නිකුත් කිරීමෙන් පසුව අධිකාරිය විසින් ප්‍රමාණවත් පරිදි අධීක්ෂණය කර නොමැති බව නිරීක්ෂණය විය.

ආයතනයට හෝ ව්‍යාපෘති යෝජකයාට පාලනය කිරීමට නොහැකි සාධක වූ බලාගාර ඉදිකිරීමට යෝජිත ඉඩම් ලබා ගැනීමේදී පදිංචිකරුවන්ගේ විරෝධය වැනි තත්ත්වයන් විසඳෙන තුරු සාධනීය ප්‍රගතියක් අපේක්ෂා කල නොහැකි බව සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ඈ) 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 21.1 වගන්තිය අනුව සූර්ය බල උත්පාදන පද්ධති ආනයනය කර සවිකිරීම් සිදුකරන සමාගම් වෙත බලපත්‍ර ලබාදීම හා ඒවා ගුණාත්මක හා විශ්වාසනීය තත්ත්වයෙන් ක්‍රියාත්මක වන්නේද යන්න පරීක්ෂා කිරීම ආයතනයේ කාර්යයක් වුවද, බලපත්‍රලාභී සමාගම් විසින් ආනයනය කර සවිකරන ලද සූර්යබල උත්පාදන පද්ධතිවල ගුණත්වය හා සේවා සැපයීම පිළිබඳ ප්‍රමාණවත් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

(ඇ) සුළං මාපක කුළුණු 10 ක් ඉදිකිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ 2008 ජුලි 14 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර එම ඉදි කිරීම් වසරක් තුළ අවසන් කළ යුතුව තිබුණි. එසේ වුවද 2012 වර්ෂය වනවිට ඉදිකිරීම අවසන් කර තිබූ සුළංමාපක කුළුණු 09 හි දත්ත එකතු කිරීමේදී කුළුණු වල උපකරණ ක්‍රියාවිරහිත වීම නිසා හා දත්ත එකතු කර ගැනීමට අදාල ස්ථානයන් වෙත නොයැම හේතුවෙන් ඇතැම් කුළුණුවල අඛණ්ඩව දත්ත ලබාගෙන නොතිබුණි. තව ද මෙම දත්ත උපයෝගී කර සුළං බල සම්පත් සිතියම් හා සැළසුම් සකස් කිරීම අවසාන කර නොතිබුණි.

(ඉ) 2011 වර්ෂයේදී වැඩපූර්ව අත්තිකාරම් ලෙස රු.416.875 ක් ගෙවීම්කර උපකරණ පිරිවැය හා පිරිසැකසුම් ගාස්තු ලෙස එකතුව රු.1,410,250 ක් වැයකර තිබුණු එක් සුළං මාපක කුළුනක ඉදිකිරීම් අතරමග නතර කර තිබුණු අතර 2017 සැප්තැම්බර් 30 දින වනවිටත් එම ඉදිකිරීම අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. වසර හයකට පෙර මිලදීගත් උපකරණ තවදුරටත් භාවිතා කිරීම හා පිරිසැකසුම් ගාස්තු ආපසු අයකර ගැනීම පිළිබඳ විගණනයේදී ගැටළුකාරී විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සඳහා ප්‍රධාන කාර්යාලයක් ඉදිකිරීම වෙනුවෙන් වසර 30 ක කල්බදු පදනම යටතේ 2015 ජූනි 22 දින රු.45,856,451 ක් වැයකර නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉඩමක් ලබාගෙන තිබුණි. නීතිමය උපදෙස් ලබාගැනීමකින් තොරව බදු ගිවිසුමකට එළඹ තිබීම හේතුවෙන් වසර 2 ක් තුළ සංවර්ධන කටයුතු නිමකිරීමට අපොහොසත් වුවහොත් බදු දේපලේ අයිතිය බදුකරුට ලැබෙන බවට කොන්දේසියක් ඇතුළත්ව තිබුණි. එහෙත් 2017 සැප්තැම්බර් 30 දින වනවිට වසර 2 ක් ඉක්ම ගොස් තිබුණද ගොඩනැගිල්ලේ සැලසුම් නිර්මාණ කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 25 දින විශ්‍රාම ලැබූ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකුට පාරිතෝෂික මුදල් වශයෙන් රු.782,260 ක් ගෙවා තිබූ අතර ඒ සඳහා 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙන් බැහැරව ගැලපුම් දීමනාවද එකතු කර ගණනය කර තිබූ බැවින් රු. 94,990 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ආරම්භයේ සිට සේවක වැටුප් පරිවර්තනය කිරීමේ දී සිදු වූ දෝෂ සම්බන්ධයෙන් ආයතනය විසින් සිදුකරන ලද විමර්ශන වාර්තාව 2012 පෙබරවාරි 03 දින අධිකාරිය වෙත ඉදිරිපත් කර තිබුණ ද එහි සඳහන් නිර්දේශ ආයතනය විසින් මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. එම වාර්තාවට අනුව 2007 ඔක්තෝබර් 01 දින සිට 2011 සැප්තැම්බර් 30 දින දක්වා චක්‍රලේඛ වලින් බැහැරව වැඩිපුර ගෙවන ලද රු.2,171,760 ක වැටුප් හා දීමනා අදාල නිලධාරීන්ගෙන් අය කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් නියෝග කර තිබුණද, ඒ සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) ප්‍රොටොටයිප් විදුලි වාහන තුනක් සංවර්ධනය කිරීම

2007 සැප්තැම්බර් 28 දින ඇති කර ගන්නා ලද ගිවිසුමකට අනුව මාස 18 ක් ඇතුළත ප්‍රොටොටයිප් විදුලි වාහන තුනක් සංවර්ධනය කිරීම සඳහා 2007 වර්ෂයේ දී බාහිර පාර්ශවයකට රු. 7,956,800 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, 2017 සැප්තැම්බර් 30 දින දක්වාම එක් වාහනයක් හෝ සංවර්ධනය කිරීමට සංවර්ධක ආයතනයට නොහැකි වී තිබූ අතර වර්ෂ 8 ක් ගත වී තිබුණද , වාහන 03 ක් සංවර්ධනය කරවා ගැනීමට හෝ ගෙවන ලද මුදල ආපසු අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල වශයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හා ඌනඋපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) "ස්විච් - ඒෂියා" වැඩ සටහන යටතේ ලැබී ඉතිරිව තිබූ රු. 4,548,176 ක්, 2011 වර්ෂයේ සිට මහජන බැංකුවේ ජංගම ගිණුමක ද, බලශක්ති අරමුදලට අදාල රු. 150,000,000 ක ට වැඩි මුදලක් වසර ගණනාවක සිට රාජ්‍ය බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක ද කිසිදු ආයෝජන කටයුත්තක් සඳහා යොදවා ගැනීමකින් තොරව තැන්පත් කර තිබුණි.

(ආ) අධිකාරිය සතු කැබ්රථයක් වසර 2½ ක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින අතර මෙම වාහනය අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට 2017 සැප්තැම්බර් 30 දින දක්වාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 ඡේදය ප්‍රකාරව අධිකාරිය සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර අනුමත කරගෙන නොතිබුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධිකාරිය සඳහා අනුමත කරන ලද කාර්ය මණ්ඩලය 136 ක් වූ අතර 2016 දෙසැම්බර් 31 දිනට සත්‍ය කාර්ය මණ්ඩලය 103 ක් විය. ඒ අනුව අධ්‍යක්ෂ තනතුරු 3ක්, අංශ ප්‍රධාන තනතුරු 4 ක් හා කළමනාකරණ තනතුරු 12 ක් ඇතුළුව කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 33 ක් පැවතුණි.

2007 වර්ෂයේ සිට මේ දක්වා අනුමත තනතුරු සංඛ්‍යාව යොදා ගනිමින් හා ඒ තුල සුළු සංශෝධනයන් සිදු කරමින් සංශෝධිත සංවිධාන ව්‍යුහයක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කිරීම සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

(ඇ) ඉහත සඳහන් පුරප්පාඩු වූ අධ්‍යක්ෂවරුන් තිදෙනා සහ අංශ ප්‍රධානීන් 4 න් 3 දෙනෙකු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.1(ආ) ඡේදයේ නියමයන්ගෙන් බැහැරව නිත්‍ය තනතුරේ පත්කිරීම් බලධාරියා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව අධිකාරියේ සභාපතිවරයා විසින් වැඩ බැලීමේ තනතුර සඳහා පත් කිරීම් සිදු කර තිබුණි.

4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සම්පත්

අංශ ප්‍රධානි (තාක්ෂණික ප්‍රවර්ධන) සහ වැඩබලන අධ්‍යක්ෂ (ක්‍රමෝපාය) තනතුරු දරන නිලධාරියා 2016 පෙබරවාරි 15 දින විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තාක්ෂණ) තනතුරට 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙන් බැහැරව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වසරක කාලයක් සඳහා පූර්ණ කාලීනව නිදහස්කර විගණන දිනය වූ 2017 මැයි දක්වා ඔහුට අධිකාරිය විසින් රු.1,404,828 ක වැටුප් ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 වගන්තිය ප්‍රකාර ගිණුම් ඉදිරිපත් කිරීමේ කළමනාකරණයේ වගකීම පිළිබඳ ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

5.2 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.3 ක්‍රියාකාරී සැලැස්ම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති. වැඩසටහන් හා ක්‍රියාකාරකම් සඳහා සමාලෝචිත වර්ෂයේ දි වෙන්කර තිබූ රු. 280,421,124 ක මුදලින් රු. 111,236,670 ක් හෙවත් සියයට 40 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් කාර්යක්ෂමව සිදුකර අපේක්ෂිත අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටු කර ගැනීමට අධිකාරිය අපොහොසත්ව තිබුණි .

5.4 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේ දී ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු නොමැති වීම හේතුවෙන් විගණන සැලැස්මට අනුව ප්‍රමාණවත් විගණනයක් සිදු කර නොතිබුණි.

## 5.5 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැය මඟින් ප්‍රාග්ධන වියදම් සඳහා රු. 6,000,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර ඉන් රු. 2,549,041 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව ප්‍රාග්ධන වෙන්කිරීම් වලින් රු.3,450,959 ක් එනම් සියයට 58 ක් අදාල කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි. අයවැය මඟින් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණ ද, එම ඉතිරි ප්‍රතිපාදනද උපයෝගීකර ගොඩනැගිලි හා ඉඩම් වැඩිදියුණු කිරීම සඳහා රු. 4,238,165 ක වියදමක් දරා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් අයවැයගත වියදම් සත්‍ය වියදම් සමඟ සැසඳීමේ දී වියදම් ශීර්ෂ 9 කට අදාළව සියයට 17 සිට සියයට 161 දක්වා සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය නොකිරීම් , අත්හැරීම්, නොසැසඳීම් පැවැතීම<br>(ii) විවිධ වැය ශීර්ෂ යටතේ දරන ලද වියදම් විශ්ලේෂණය කිරීමට හැකිවන පරිදි පරිගණකගත ලෙජරයන් හඳුන්වා නොදීම |
| (ආ) මූල්‍ය පාලනය | නිශ්ක්‍රිය මුදල් ශේෂයන් පැවතීම. |
| (ඇ) ණයගැති පාලනය | ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු මුදල් අප්‍රමාදව එකතුකර නොගැනීම. |

| | | |
|---|---|---|
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ කාර්යභාරය හා ප්‍රමාණය අනුව මානව සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කර නොගැනීම. |
| (ඉ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | ව්‍යාපෘති වලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපෘති කාර්යයන් සැලසුම් කළ පරිදි කාර්යක්ෂමව හා අප්‍රමාදව ක්‍රියාත්මක නොකිරීම. |
| (ඊ) | අයවැය පාලනය | තාත්විකව සකස්කර මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කර නොගැනීම. |
| (උ) | වත්කම් කළමනාකරණය | (i) දේපළ, පිරියත හා උපකරණ අගය කිරීම, ලේඛන ගත කිරීම, ක්‍රමානුකූලව සිදු නොවීම හා ඒවා අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව උපයෝජනය නොකිරීම.<br>(ii) පැරණි මැනුම් උපකරණ අපත් කිරීමට හෝ භාවිතා කිරීම නොහැකි තත්ත්වයේ ඒවා අපහරණය කිරීමට කටයුතු නොකිරීම. |



එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගනුදෙනු සඳහා විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු**

2 මූල්‍ය ප්‍රකාශන

2.2.1. ගිණුම්කරණ අඩුපාඩු

(අ)

I. මෙම ඉඩම 2017 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශන වල දී බදු දේපලක් ලෙස ඉදිරිපත් කර ඇති අතර, ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර ඇත.

II. ඉඩම බදු ගැනීම වෙනුවෙන් බලශක්ති අරමුදලින් ලබාගත් රු. 47,000,000.00 ක මුදල 2015 වර්ෂයේ දී අයහාර ලැබීමක් ලෙස සටහන් කිරීම නිසා එම වර්ෂයේ අතිරික්තය රු. 47,000,000.00 කින් අධිගණන වීම නිසා සිදු වූ වරද ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි කරන්නෙමු.

III. අදාල ඉඩම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය මගින් ලබාදෙනු ලැබූ ඉන්වොයිසි පතෙහි වැට් අගය ලෙස 5,020,368.00 සඳහන් කර ඇති අතර, එය ගිණුම් තබා ඇත. එබැවින් ශේෂය ඌණ ගණනය වී නොමැති බව අපගේ හැගීමයි.

IV. මෙය නිවැරදි කර ඇත.

V. ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශන වලදී ගිණුම් ගත කිරීමට කටයුතු යොදා ඇත.

(ආ) තක්සේරු වටිනාකම නිවැරදි පරිදි 2017 ගිණුම් වර්ෂය සඳහා ඇතුලත් කර ඉදිරි අවශ්‍යය කටයුතු සිදු කරමි.

(ඇ)

| | | |
|---|---|---|
| (ඇ) | මුලු රාජ්‍ය ප්‍රධාන වැය 2016 | 60,000,000.00 |
| | නොනිමි කාර්යය (WIP) | 4,341,226.00 |
| | අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 9,242,483.00 |
| | ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | 5,168,342.00 |
| | | 41,247,949.00 |

එබැවින් කාර්ය සාදන ප්‍රකාශනයේ ආදායම් ලෙස හදුනාගත් මුදල - 41,247,949.00 නිවැරදි බව අපගේ හැගීමයි.

ඇ) ණය ගෙවීමේ වාරිකය ආයතනයට පවරා නොතිබුනද අප අධිකාරියට අදාල අදියර වල පාලන බලය (Controling Power) ලබා දී ඇති බැවින් එය ජංගම නොවන වත්කම් හා ජංගම නොවන බැරකම් ලෙස හදුනාගෙන ඇත.

2.3. පැහැදිලි නොකල වෙනස්කම්

(අ) 2017 වර්ෂයේ අවසාන ගිණුම් වල බලශක්ති අරමුදලේ ශේෂය නිවැරදි පරිදි ගණනය කර අදාල වෙනසට හේතු පැහැදිලි කර දක්වා ඇත.

(ආ) භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතුවල අගය නිවැරදි ලෙස ගණනය කර 2017 වර්ෂයේ අවසාන ගිණුම් වලට ඇතුලත් කර ඇත.

2.4 අසම්භාව්‍ය බැරකම්

මෙම රුපියල් 897,025,999 පියවීමට අවශ්‍ය අරමුදල් අප මහා භාණ්ඩාගාරයෙන් අයදුම් කලද එය ඔවුන්ට ලබා දිය නොහැකි බව 21/12/2016 දිනැති BD/ID119/1/14/2016 ලිපියෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යංශය හරහා අපට දන්වා ඇත.

2.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

(අ) මෙම රුපියල් 8,033,270/= මුදල ලංකා විදුලි බල මණ්ඩලය විසින් අප ආයතනයට ප්‍රතිපූර්ණය කරන ලෙස 2017/09/09 දිනැති ලියමනක් ලංකා විදුලි බල මණ්ඩලයේ සභාපතිතුමාට යවා ඇති උවද ඔවුන් එය තවම ප්‍රතිපූර්ණය කර නැත. මීට පෙර වසරවල මෙවැනි ලියුම් භාණ්ඩාගාරය හා අමාත්‍යංශය මගින්ද නිකුත් කර ඇති උවද ලංකා විදුලි බල මණ්ඩලය එම ලියුම් අනුව කටයුතු කර නැත. මෙය ගරු ඇමතිතුමා හරහා කිරිමට සිදු වනු ඇත.

ආ) මෙම ලැබිය යුතු ශේෂයන්ගෙන් බොහොමයක් අන් ආයතන වලින් සේවාවන් ලබා ගැනිම සඳහා Refundable තැන්පතුය. එහෙයින් එම සේවවන් ලබා ගන්නා තුරු ම තැන්පතු ලබා ගත නොහැක. මෙය අප age analysis ප්‍රකාශයේ පැහැදිලිව සඳහන් කර ඇත. ඉතිරි ශේෂයන්ගෙන් බොහොමයක්ම බලශක්ති අධ්‍යාපන ව්‍යාපෘති සඳහා පළාත් සභා වලට ගෙවන ලද අත්තිකාරම්ය. එම සේවාවන් ඔවුන් ලබා දුන්න ද ඊට අදාල වියදම් සඳහන් කර ඒවා පියවීම සමහර පළාත් සභා කර නොමැත. නමුත් 31/12/ 2016 දින ශේෂයෙන්ද රු.20,789,010/= ම දැනට පියවා ඇත.

ඇ) 31/12/2016 දිනට උපචිත වියදම් වන රු.මි.11.6 වර්ථමානයේදි රු.මි.5. 9 දක්වා අඩු වී ඇත. මින් රු.මි. 1.36 ම ගෙවනුයේ වසර 2012 සිට 2015 දක්වා විගණන දෙපාර්තමේන්තුවට අය වූ උපචිත වියදම් ය. (මෙහි ගෙවීමට අදාල අයපත් අප ආයතනයට ලැබුනේ 2017 අගෝස්තු මසය.)

2.6 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

මෙම ස්විච් ඒෂියා වැඩසටහන මුදල් වලින් සේවකයන්ට ගෙවා තිබුනු මුදල් නැවත අය කර ගන්නා ලෙස අමාත්‍යංශයෙන් නිකුත් කරන ලද ලිපියක් මුල්‍ය අංශය වෙත ලැබී නොමැත. කෙසේ වෙතත් මෙම

ගෙවීම සධාරණීයකරනය කර භාණ්ඩාගාරයෙන් අනුමත කර ගැනිමට අප ආයතනය 29/11/2016 දිනැති ලිපියක් DMS වෙත යවා ඇති අතර 2017/03/08 දිනැති ලිපියෙන් දැනටමත් අපගේ ඉහත ඉල්ලිම අමාත්‍යාංශ ලේකම්තුමාටද යවා ඇත. 2016/06/21 දිනැති ලිපිය අනුව මහා භාණ්ඩාගාරය National salaries & carders කොමිෂමෙන් අදහස් විචසා ඇති බව දන්වා ඇත.

2.7 නීති රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම.

(අ) සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත

බලශක්ති කාර්යක්ෂමතාව යනු බලශක්ති සුරක්ෂිත අනාගතයක ප්‍රමුඛතම ඉන්ධනය සේ ජාත්‍යයන්තර බලශක්ති ආයතනය නිර්වචනය කොට ඇත. එම සංකල්පය රට තුල ව්‍යාප්ත කිරීම හා බලශක්ති යොදවන සියළු ක්ෂේත්‍රවල ඒ සඳහා උත්සහයක් ඇති කිරීම අධිකාරිය සතු ප්‍රධානතම වගකීම් හතරෙන් එකකි. මෙම වගකීම ඉටු කිරීමේ දී විවිධ මැදිහත් වීම් සිදු කරන අධිකාරිය ඒවා හරහා විශාල ආරම්භක ප්‍රතිලාභ බලශක්ති භාවිතා කරන්නන් හට මූලිකවමත් සමස්ත ආර්ථිකයට දෙවනුවත් අත්කර දී ඇත. මෙම මැදිහත්වීම් අතර පූර්වාදර්ශ සහ මංපෙත් හෙලිකර දීම සුවිශේෂී තැනක් ගනියි.

ජාතික විදුලි පරිභෝජනයෙන් 40% කට ආසන්න ප්‍රතිශතයක් සිදුවන්නේ ගොඩනැගිලි ක්ෂේත්‍රයේ බැවින් එම ක්ෂේත්‍රයේ බලශක්ති කාර්යක්ෂමතාව පිළිබඳ දැඩි අවධානයක් අධිකාරිය යොදා ඇත. මෙම ක්ෂේත්‍රයේ බලශක්ති භාවිතය ඉතා ප්‍රාථමික මට්ටමක ඇති බවත් මහා පරිමාණ නාස්තියකට එම භාවිතය දායක වී ඇති බවත් අධිකාරියේ අධ්‍යයනයක් විසින් හෙළිකොට ගෙන ඇත. විශේෂයෙන්ම කලකට ඉහත ඉදි කරන ලද වායු සමනය කරන ලද ගොඩනැගිලි මහා පරිමාණයෙන් විදුලි නාස්තියකට දායකවෙමින් වාර්ෂික විශිෂ්ඨ බලශක්ති භාවිතය 180k Wh/m2 මට්ටමද අභිබවා ක්‍රියාත්මක වන බව පෙනේ. තවද නවීන තාක්ෂණය භාවිතයෙන් මෙම අගය 60 kWh/m2, එනම් දැන් පවතින මට්ටමින් 1/3 කට අඩු කල හැකි බවද අධිකාරිය විසින් තක්සේරු කොට ඇත. නමුත් මෙවැනි පරමාදර්ශි ගොඩනැගිලි රට තුල ඉදිවී නොමැති නිසා නව ගොඩනැගිලි නිර්මාණය ද සිදු වනුයේ තවත් විදුලිය නාස්ති සිදුවන ආකාරයට බවද පෙනී ගොස් ඇත. මෙම තත්වය වෙනස් කිරීමට නායකත්වය සැපයීමට නියාමනව ව්‍යාපෘතියක අවශ්‍යතාව එදා සිට වටහා ගත් අධිකාරිය සුනිත්‍ය බලශක්තිය පිළිබඳ විශිෂ්ඨතා කේන්ද්‍රයක් (Center of Excellence in Sustainable Energy)ස්ථාපනය කිරීමට තීරණය කරන ලදී. මෙම කේන්ද්‍රය අධිකාරියේ කාර්යාල කටයුතු වලට යොදා ගැනීමට අනෙකුත් බලශක්ති පාරිභෝගිකයන්ගේ අවධානයට ලක්වීමටත් එය අගනුවර ආසන්නයේ ස්ථාපනය කල යුතු බවට තීරණය කරන ලදී.

මේ අනුව දීර්ඝ කාලයක් තිස්සේ කරන ලද උත්සහයක ප්‍රතිපලයක් ලෙස අදාල ඉඩම් කොටස පාර්ලිමේන්තුවට ආසන්න අඩවියකින් ලබා දීමට නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කරන ලදී. මෙම බිම් කොටස ඉහළ වටිනාකමක් ඇති වෙනත් පාර්ශවයන් විසින් වෙන් කොට තිබී යම් ප්‍රමාද දෝෂයක් නිසා ඔවුනට අහිමිව මතු වන නාගරික සංවර්ධන අධිකාරිය සතු බිම් කොටසක් විය. මේ කරුණු සලකා බලා ඉතා ඉක්මනින් එය අධිකාරියේ අරමුණු සඳහා යොදා ගැනීමට අධිකාරිය විසින් අදිටන් කරන ලදී. මේ සඳහා ගෙවිය යුතු මුදල සාමාන්‍ය පරිදි ඒකාබද්ධ අරමුදලින් වෙන් කර ගැනීමට කටයුතු කලහොත්

නාගරික සංවර්ධන අධිකාරිය අප වෙත ලබා දුන් මද අවසරයෙන් ප්‍රයෝජනයක් ගැනීමට නොහැකිවන හෙයින් නැවත ගෙවන පදනම මත ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදලින් රු: 50,936,978.00 ගෙවා මෙම බිම් කොටස ඉහත කටයුත්ත සඳහා ලබා ගන්නා ලදී.

තවද මෙවැනි පරමාදර්ශී ඉදි කිරීම් ශ්‍රී ලංකාවේ ඉදි කිරීම් ක්ෂේත්‍රය ආදර්ශයට ගැනීමෙන් අධිකාරියේ අරමුණු මූලිකවමද, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදලේ අභිලාශයන් සුවිශේෂීයෙන්ම ඉටුවන බවද නිරීක්ෂණය කෙරේ. මෙවැනි කාර්යක්ෂම ගොඩනැගිලි ඉදි කිරීමෙන් වසරකට ගිගාවොට් පැය 418 ක් පමණ (වර්තමාන ජනන වියදම අනුව රු. මිලියන 8,360 ක් පමණ) අවම වශයෙන් ඉතිරිකරගත හැකි බවද, එවැනි බලශක්ති සංරක්ෂණ විභවයන් ප්‍රයෝජනයට ගැනීමට මෙවැනි ආයෝජන අත්‍යවශ්‍ය බවත් අධිකාරියේ මතයයි.

(ආ) ආයතන සංග්‍රහය

මෙම අධිකාරිය 2007 වසරේ ස්ථාපනය කොට ක්‍රියාත්මක වූයේ එහි පූර්වප්‍රාප්තික ආයතනය වූ බලශක්ති සංරක්ෂණ අරමුදලේ නිලධාරීන්ගේ සේවය ලබමිනි. අධිකාරියේ පළමු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරි වසර 3 සඳහා අධිකාරියේ කටයුතු පිළිබඳ සංයුක්ත සැලැස්මක් ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගන්නා වුවද අධිකාරියේ අරමුණු සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය මානව සම්පත් අධිකාරිය වෙත ආකර්ෂණය කර ගැනීමට සරිලන බඳවා ගැනීම් ක්‍රියාපටිපාටියට අදාල අංශවලින් අනුමත කර ගැනීමට නොහැකිව ඇත. පසුගිය දශකය පුරාම විවිධ උත්සහයන් දැරුවද, අධිකාරිය ක්‍රියාත්මක වනුයේ බලශක්ති සංරක්ෂිත අරමුදල අධිකාරිය ලෙස පරිවර්තනය වන විට ලබා දුන් සේවක අන්තර්ග්‍රහණ සැලැස්ම අනුවමය. මෙම සැලැස්ම මෙන්ම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් යාවත්කාලීන කරන ලද සම්මත තනතුරු නාම සහ පාරිශ්‍රමික යොදවා අධිකාරිය වෙත පැවරී ඇති සුවිශේෂී වගකීම් ඉටු කිරීමට අවශ්‍ය මානව සම්පත් අධිකාරියට ආකර්ශණය කිරීම උගහට වී ඇත. මේ කරුණු සලකා බලා අධිකාරිය එහි දැනටමත් සේවයේ නියුතු පළපුරුදු නිලධාරීන්ට අමතරව වගකීම් පැවරීමට තීරණය කරන ලදී. වැඩ බැලීමේ පදනම යටතේ මෙම පත්වීම් සිදු කරනු ලැබුයේ අධිකාරියට පැවරී ඇති බලතල යොදා එහි අරමුණු ඉෂ්ඨ කර ගැනීමට අවශ්‍ය වෙනත් මානව සම්පත් සම්පාදන වැඩ පිළිවෙලක් අධිකාරිය සතු නොවූ බැවිනි. කෙසේ වුවද, බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය අනුමත කිරීමේ කටයුතු රේඛීය අමාත්‍යාංශය, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ද සම්බන්ධීකරණයෙන් මේ වනවිට සාදා නිමා කොට ඇත. එම කටයුතු අවසන් වූ වහාම මෙම පත් වීම් විධිමත් කිරීමට හැකිවනු ඇත.

තවද වෙනත් විකල්ප නොමැති ගනු ලැබූ මෙම තීරණය නිසා කිසිදු අනර්ථයක් අධිකාරියට සිදු වී නොමැති බවද සඳහන් කළ යුතුය. එසේ වනුයේ අදාළ තනතුරු සඳහා වැඩ බලන එම නිලධාරීන් ඒවාට අදාල සුදුසුකම් මිස සපිරු පළපුරුදු අයවළුන් වීමත්, බඳවා ගැනීම් පටිපාටිය නිසි කලට අනුමත කරදුන්නේ නියත වශයෙන්ම එම තනතුරු වලට උසස් වීම් ලබන නිලධාරීන්ට ඔවුන්වන බැවිනි. මෙම නිලධාරීන් වැඩ බලන කාලය තුල ඔවුන්ගේ වගකීම් හොඳින් ඉටු කරන ඇති අතර ස්වකීය මුල් තනතුරේ පිහිටීමත් අතිරේක රාජකාරි රැසක් ඉටු කර ඇත. කරුණු එසේ හෙයින් ඔවුන් විසින් දැරුවාවූ

අමතර වගකීම් වෙනුවෙන් ගෙවා ඇති මෙම වැඩ බිමේ දීමනා ආදිය නැවත අය කර ගැනීමට කිසිදු සදාචාරාත්මක හෝ පරිපාලනමය අවකාශයක් නොමැත.

(ඇ) මුදල් රෙගුලාසි සංග්‍රහය

විගණකාධිපති දෙපාර්තමේන්තු නියෝජිතයාගේ උපදෙස් පරිදි හා කළමනාකාර මණ්ඩලයේ අනුමැතිය ඇතිව දැනට ස්ථාවර වත්කම් Re valuation කරමින් පවති. මෙය බොහෝ ශ්‍රමයක් හා කාලයක් ගත වන හෙයින් AMC නිර්දේශය වනුයේ මෙම භාණ්ඩ සමීක්ෂණ හා Re valuation එකවර කිරීමය. කෙසේ වෙතත් අමාත්‍යංශයේ උපදෙස් පරිදි වෙනමම කමිටුවක් පත් කර භාණ්ඩ සමීක්ෂණය ද ආරම්භ කර ඇත.

(ඈ) ස්ථාවර වත්කම් ලේකනයක් මුල සිටම පවත්වා ගෙන ගොස් ඇති අතර මෙය 2012 වසරේ විධිමත් විය. 2015 වසරේ නැවත විධිමත් කෙරුණි.

(ඉ) පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් කඩිනමින් සැකසීමට පියවර ගනු ඇත. මේ වන විටත් එහි වැඩ ආරම්භ කර ඇත.

(ඊ) මේ වන විට 2016 වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

(උ) වැඩබැලීම් තනතුරු පිළිබඳ ඉහත කරුණු වලට වැඩිමනත්ව මෙම නිලධාරීන් සඳහා සපයා ඇති අනෙකුත් පහසුකම් ද එම තනතුරු සඳහා නියමිත පහසුකම් වේ. එම තනතුරු වල වගකීම් ඉටු කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට අධිකාරිය බැඳී සිටියි. එම නිසා මෙම අතිරේක වියදම් එම නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කිසිදු සදාචාරාත්මක හෝ පරිපාලනමය හැකියාවක් නොමැත.

4. මෙහෙයුම සමාලෝචනය

4.1 කාර්යසාධනය

(අ) බලශක්ති විගණනය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ආරම්භක මුල් අවස්ථාවේ බලශක්ති විගණන කටයුතු කලද, පසුව එම විගණන කටයුතු වලට සෘජුව සම්බන්ධ නොවී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචි වී ඇති බලශක්ති සේවා සපයන ආයතන හරහා සිදු කිරීමට කටයුතු කර ඇත. බලශක්ති විගණන සඳහා මුදල් වැයකළ නොහැකි රජයේ ආයතන වලට පමණක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් මුදල් අය කිරීමකින් තොරව විගණන කටයුතු කර දෙනු ලැබේ.

තවද 2015 වර්ෂයේ ආදායම ලෙස දක්වා ඇති රුපියල් 10,198,009 ට පුනර්ජනනීය බලශක්ති අංශයේ ආදායමද එකතු වී ඇති බැවින්, බලශක්ති විගණන හා මිනුම් උපකරණ කුලියට දීම මගින් 2015 වර්ෂයේදී ලද ආදායම රුපියල් 1,593,608 ක් ලෙස නිවැරදි විය යුතුය.

(ආ) ඝන අපද්‍රව්‍ය වලින් විදුලිය නිෂ්පාදනය කිරිම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය බලපත්‍ර නිකුත් කර ඇත. බලපත්‍ර නිකුත් කිරිමෙන් අනතුරුව අදාල පාර්ශවයෙන් ප්‍රගතිය පිළිබඳ විමසුවද ප්‍රමාණවත් ප්‍රගතියක් අප වෙත වාර්තා කිරිමට නොහැකි වූයේ මෙම ඝන අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳ අප ආයතනයට හෝ ව්‍යාපෘති යෝජකයාටත් පාලනය කිරිමට නොහැකි බලපෑම් නිසාය. ප්‍රධාන වශයෙන් අපද්‍රව්‍යයෙන් ක්‍රියාත්මක කිරිමට යෝජිත බලාගාර ඉදිකිරිමට ඉඩම් ලබා දීමට කිසිදු ආයතනයකට නොහැකි වූයේ පදිංචි කරුවන්ගේ බලවත් විරෝධය නිසාය. තවද මෙම ව්‍යාපෘති සඳහා තාක්ෂණය හෝ ආයෝජන සම්පාදනය කර ගැනීමටද මේ නිසා නොහැකි වී තිබිණි. මෙම ක්ෂේත්‍රයේ ඇති වියවුල් සහගත තත්වය විසඳෙන තුරු සාධනීය ප්‍රගතියක් අපේක්ෂා කළ නොහැක.

(ඇ) මේ වන විට සූර්යබල සංග්‍රාමය ක්‍රියාත්මක වෙමින් පවතින අතර, ඊට අදාල වූ සියළුම ප්‍රමිති (Standard) සකසා ඒවාට අනුකූලව සූර්යබල සංග්‍රාමය යටතේ සූර්යබල පද්ධති ආනයනය කිරීමේදී, ගුණාත්මකභාවයෙන් හා නියමිත ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ ආනයනය කිරිමට කටයුතු සකස් කර තිබේ.මෙම වහල මත සවිකරන සූර්යබල පද්ධති වලට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතේ විධිවිධාන වන අංක 16, අංක 18 හෝ අංක 21 යන කිසිදු වගන්තියකට යටත් නොවේ. මේවා නිවාස වල වහල මත සවිකරන උපාංග වේ.

නමුත්, මෙම ප්‍රශ්න කිරිම සිදුකරන්නේ පනතේ ප්‍රකාර ඉහත වගන්ති අනුව නම් ඒවාට බලපාන අධිකාරී පනතේ කොන්දේසි වලට අනුව බලශක්ති බලපත්‍ර නිකුත් කර ඇත්තේ බිම් මට්ටමේ සවිකරන මහාපරිමාණ සූර්යබල ව්‍යාපෘති සඳහා වේ. තවද මෙම ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති ආයෝජකයින් ඉතා විශාල මුදල් ප්‍රමාණයක් ආයෝජනය කරන බැවින් ඔවුන් කිසිම කෙනෙකු එම මුදල් නාස්තිවීමට ඉඩ නොදේ. එම නිසා ඔවුන් වෙනම ගිවිසුම් වලට භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතන සමඟ ප්‍රමිතිය පිලිබඳවත් ගන්නා ණය පියවීම සඳහා විදුලිය ජනනය වීම සහතික කරගැනීම පිලිබඳවත් ගිවිසුම් ඇත. එම නිසා එම භාණ්ඩ වල ප්‍රමිතිය අප බලාපොරොත්තු වන ආකාරයට වන බැවින් අතිරේක කොන්දේසි පැනවීම සිදුකර නැත.

(ඈ) දත්ත එකතු කිරීමේදී කුළුණු වල උපකරණ ඇතැම් අවස්ථාවල ක්‍රියා විරහිතවීම නිසා කුළුණු කිහිපයක අඛණ්ඩව දත්ත ලබාගැනීමේ අපහසුතාවයක් පැවතින. දැනට මෙම කුළුණු අතරින් මුල්ලිපුරම ප්‍රදේශයේ පිහිටි සුලං මාපකකුළුණ ගලවා ඉවත් කර ඇති අතර බලංගොඩ හා කලමැටිය ප්‍රදේශවල පිහිටි සුලං මාපකකුළුණු වල දත්ත ලබාගැනීමේ අපහසුතාවයක් පවතී. සීතාඑළිය, සිලාවතුර, සූරියකන්ද හා නාඩුකුඩා ප්‍රදේශ වල පිහිටි සුලං කුළුණු ක්‍රියාත්මක තත්වයේ පවතින අතර ඉතිරි ඒවාද කඩිනමින් යථා තත්වයට පත්කිරීමට කටයුතු යොදා ඇත. බලංගොඩ, කලමැටිය, මුල්ලිපුරම, සීතාඑළිය හා සිලාවතුර යන ප්‍රදේශවල පිහිටි සුලං මාපකකුළුණු වල තත්ව නිරීක්ෂණය හා දත්ත රැස්කිරීම සඳහා පිලිවෙලින් අගෝස්තු, අප්‍රේල්, අගෝස්තු, ජූලි, මැයි යන මාසයන්හිදී ක්ෂේත්‍ර චාරිකා වල නිරත වී ඇත.

එමෙන්ම මෙම දත්ත උපයෝගී කර අඳිනු ලබන සුලං බල සිතියම් මුල්ලිපුරම, සීතාඑළිය හා නාඩුකුඩා ප්‍රදේශ සඳහා අවසන් කර ඇති අතර බලංගොඩ, කලමැටිය හා සිලාවතුර යන ප්‍රදේශවල සුලංබල සම්පත් සිතියම් 2017 දෙසැම්බර් මස වන විට අවසන් කිරීමට නියමිතය. තවද පුත්තලම ප්‍රදේශයේ පිහිටි 120 MW සුලං විදුලි බලාගාර සැලසුම් කිරීමේදී අප අධිකාරිය විසින් ඉදිකරන ලද මුල්ලිපුරම සුලං මාපක

කුළුනේ සුළං දත්ත උපයෝගී කර ගන්නා ලදි. තවද මන්නාරම 100 MW සුලං විදුලි බලාගාර සැලසුම් කිරීමේදී නාඩුකුඩා කුළුනේ දත්ත උපයෝගී කර ගන්නා ලදි.

(ඉ) සුලං මාපක කුළුණු 9ක් ඉදිකිරීම සඳහා ඊ නෙට් ආයතනයට ලබා දුන් අතර එම කුළුණු 9 න් සුලං මාපක කුළුණු 8 ක ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලැබුවද කබරගල සුලං මාපක කුළුණේ පමණක් ඉදිකිරීම් කටයුතු අවසන් නොකරන ලදි. එම කුළුණේ ඉදිකිරීම් සඳහා 2011 වර්ෂයේදී වැඩ පූර්ව අත්තිකාරම්, සුලං මාපක කුළුණේ පිරිසැකසුම (Fabrication) ලෙස පිලිවෙලින් රු.416,875 ක් හා රු.833,750 ක් වශයෙන් ගෙවා ඇත. තවද රු 576,500 ගෙවා සුලං මාපක කුළුණට අවශ්‍ය උපකරණ මිලදී ගෙන ඇති අතර එකතුව වශයෙන් රු.1,827,125 ක මුදලක් දරා ඇත. මෙම ඉදිකිරීම් 2017 වර්ෂයේ මැයි මස වන විටත් අවසන් කර නොතිබූ හෙයින් ඔවුන්ගේ කොන්ත්‍රාත්තුව ලිපියක් මඟින් දැනුම් දීමෙන් අනතුරුව අවසන් කරන ලද අතර පසුව ගත් තීරණයකට අනුව මෙම සුලං කුළුණ වෙනත් ප්‍රදේශයක ඉදි කිරීමට තීරණය කර ඇත. එහිදී කබරගල සුලං කුළුණ සඳහා සකස් කරන ලද කුළුණේ පිරිසැකසුම් කොටස් හා ගෙන්වන ලද උපකරණ යොදා ගැනීමට නියමිත අතර දැනට සුලං කුළුණ හා උපකරණ සුනිත්‍ය බලශක්ති අධිකාරිය සතුව ආරක්ෂිතව පවතී.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) බදු ගිවිසුමේ සඳහන් වන්නේ මාස තුනක් ඇතුළත සංවර්ධන කටයුතු ආරම්භ කිරිමට සහ වසර දෙකක් ඇතුළත එම කටයුතු අවසන් කිරිමට අපොහොසත් වන්නේ නම් බදු ගිවිසුම අවලංගු කරන බවයි. දැනට එම භූමියේ පාංශු ගුණාංග අධ්‍යනයක් අවසන් කොට ඇති අතර ගොඩනැගිලි නිර්මාණය පිළිබඳ කටයුතු සඳහා වාස්තු විද්‍යාඥ ආයතනයක සේවය ලබා එම නිර්මාණ කටයුතු අවසන් අදියර දක්වා ළගා වී ඇත. බදු දෙන්නා වන නාගරික සංවර්ධන අධිකාරිය ගොඩනැගිලි බලපත්‍රය පිළිබඳ සලකා බැලීම අවසන් කොට නොමැති නිසා මෙම කොන්දේසිය ලිහිල් කරන ලෙස අධිකාරිය විසින් ඉල්ලීමක් සිදු කොට ඇත.

(ආ) සේවයෙන් විශ්‍රාම යාම මත ගෙවනු ලබන පාරිතෝෂිත ගෙවීම් සඳහා අදාළ 1983 අංක 12 දරනපනතට අනුව ගෙවීම් කටයුතු සිදු කර ඇති අතර එහිදී ගැලපුම් දීමනාව ද ඇතුළත් කර ගෙවීම පිලිබඳව නිවැරදි ගනනය කිරිම සූත්‍රය සොයා බැලීමට අතිරේක විගණකාධිපතිතුමා සමඟ සාකච්ඡාවේදී උපදෙස් ලැබුනි. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

(ඇ) මෙම සටහනේ සඳහන් වන ඊනියා විමර්ශන වාර්තාව විශ්‍රාමික නිලධාරියෙකු විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ආරාධනාවක් පරිදි පිළියෙල කරන ලද්දකි. එම වාර්තාව දෝෂ රැසක් සහිතව පිළියෙලව තිබීම එවකට නිරීක්ෂණය කරනු ලැබීමෙන් පසුව එම වාර්තාව මාර්ගෝපදේශයක් සේ සලකා තීරණ ගැනීම අනර්ථකාරි යැයි සලකා කටයුතු කරන ලදී.

එම නිසා එම දෝෂ සහිත වාර්තාව පදනම් කොට වැටුප් තල පිළිබඳ නිශ්චය කිරීම නුසුදුසුය. තවද අධිකාරිය ආරම්භ කරන අවස්ථාවේ දී එහි පූර්වප්‍රාප්තික ආයතනයක් වූ බලශක්ති සංරක්ෂණ අරමුදලෙහි සේවයෙහි නියුතුව සිටි සේවකයන් වෙත පනතේ 69 (ඉ) වගන්තිය යටතේ විකල්ප දෙකක් ලබා දී ඇත.

i. අධිකාරිය විසින් සේවා නියුක්තිය අර්පණය කරනු ලැබ එය භාර ගන්නා වූ බලශක්ති සංරක්ෂණ අරමුදලේ සෑම නිලධරයෙක් ම සහ සේවකයෙක් ම, නියමිත දිනයට පෙරාතුවවූ දිනයේ දී ඔහුට අදාළ වූ සේවා නියුක්තිය පිළිබඳ නියම සහ කොන්දේසිවලට වඩා අවාසි සහගත නොවන නියම සහ කොන්දේසි මත, අධිකාරියේ සේවයේ නියුක්ත කරනු ලැබිය යුතුය; නැතහොත්

ii.අධිකාරියේ සේවා නියුක්තිය අර්පණය කරනු නොලැබූ හෝ එසේ අර්පණය කරනු ලැබ එය භාර නොගත් බලශක්ති සංරක්ෂණ අරමුදලේ සෑම නිලධරයකුටම සහ සෑම සේවකයකුටම, මණ්ඩලය විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන වන්දි මුදලක් ලබා ගැනීමට හිමිකමක් තිබිය යුතු ය.

මේ අනුව (1) වැනි විකල්ප යෝජනාවට එකඟ වී අධිකාරියේ සේවයට බැදුණු සේවකයන්ට එම එකඟවූ වැටුප ගෙවීමට අධිකාරිය බැදී සිටියි. ඒ අනුව වැටුප් පරිවර්තනයන් සිදු කොට ඇත.

මේ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය.

(ඇ) මෙම ව්‍යාපෘතිය තාක්ෂණ සංවර්ධන වැඩසටහනක් යටතේ ආරම්භ කරන ලද්දකි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ ඛණිජ ඉන්ධන මත මුළුමනින්ම යැපෙන ප්‍රවාහන ක්ෂේත්‍රය විවිධාංගීකකරණය කිරිම සඳහා විද්‍යුත් ශක්තිය යොදවා ගැනීමට ඇති හැකියාව ප්‍රදර්ශනය කිරිමයි. එසේ වුවද මෙම කාර්ය සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරු එම කටයුත්ත අවසන් කිරිමට අපොහොසත්ව ඇත. මේ පිළිබඳ නීතිපතිතුමන්ගේ උපදෙස් ලබා ගත් අතර එම නිළධාරීන් අප වෙත දැන්වූයේ වියදම් වී ඇති මුදල හා සසඳන විට බේරුම්කරණය හෝ නීති මාර්ගයෙන් කටයුතු කිරිම ඉතා විශාල වියදමක් දරා සිදුකළ යුතු වැයමක් බවයි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කිරිමේ හැකියාව සොයා බලන ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් කොන්ත්‍රාත්කරු හරහා මෙම අධිකාරියට දන්වා ඇත. ඒ සඳහා ඇති විකල්ප හදුන්වා දෙන විස්තරාත්මක වාර්ථාවක් පිළියෙල කොට ඇත. මෙම වාර්තාව සති 2 ක් ඇතුළත අමාත්‍යාංශය වෙත බාර දීමට හැක.

4.3 නිෂ්ක්‍රීය ඌණ උපයෝජිත වත්කම්

(අ) කාර්යමණ්ඩලය වෙත ගෙවන ලද මෙම දීමනාව වෙනුවෙන් එකඟතාවය ඉල්ලා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් මගින් 2012-12-05 දින භාණ්ඩාගාරය වෙත ලිපියක් යවන ලදී. තව ද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ උපදෙස් අංක 13 පරිදි පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශ ලේකම් හරහා ද 2013.01.04 දින භාණ්ඩාගාර එකඟතාවය ඉල්ලා ලිපියක් යවා ඇති අතර, තවදුරටත් මේ පිළිබඳව සම්පූර්ණ විස්තර ඇතුලත් ලිපියක් 2014.12.02 දින පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශ ලේකම් හරහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදී. එහි පිටපත් භාණ්ඩාගාරය හා විගනකාධිපති වෙත ද යොමු කර ඇත. තව ද මේ පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් අනුමැතිය ඉල්ලා භාණ්ඩාගාරය වෙත ලිපියක් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් මගින් 2016.12.06 දින යොමු කර ඇත.

(ආ) ඔබගේ කෙටුම්පත් වාර්තාවේ සඳහන් පරිදි අධිකාරිය සතු 54 – 3189 දරණ කැබ් රථය මේ වන වට අවුරුදු 2 ½ ක පමණ කාලයක් තිස්සේ නිෂ්ක්‍රීයව පවතී. මේ සම්බන්ධයෙන් 2015.06.17 වන දින

Automobile Association of Ceylon ආයතනයෙන් තක්සේරු වාර්තාවක් ලබාගෙන ඇති අතර එහි සඳහන් වන්නේ එම රථය අලුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් වාසි සහගත නොවන නිසා අපහරණය කිරීමට නිර්දේශ කරන බවයි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතේ අරමුණු, කාර්යයන් ඉටු කිරීමට සුදුසු සංවිධාන ව්‍යුහයක් සහ බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර වැටුප් හා සේවක කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළද ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට නොහැකි වුණි.

2007 වර්ෂයේ සිට මේ වන තෙක් බඳවා ගැනීම් පරිපාටි සහ සංවිධාන ව්‍යුහයන් කිහිපයක්ම සකස් කළ නමුත් ඒවායේ පැවති අඩුපාඩු හේතුවෙන් ඒවා ප්‍රතික්ෂේප විය. පසුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ඒ සම්බන්ධ පර්යේෂණ නිලධාරියෙකුගේ සහාය ඇතිව 2007 සිට මේ දක්වා අනුමත තනතුරු සංඛ්‍යාව යොදා ගනිමින් හා ඒ තුල සුළු සංශෝධනයන් සිදු කරමින් සංශෝධිත සංවිධාන ව්‍යුහයක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කිරීම සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

(ආ) අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් නොමැති බැවින් ආයතනික බඳවා ගැනීම් කටයුතු තාවකාලිකව නවතා ඇත. ඒ අනුව මේ වන විටත් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බඳවා ගැනීම් පටිපාටිය අනුමත වීමෙන් අනතුරුව සියළුම බඳවා ගැනීම් සිදු කළ හැකිය.

(ඇ) විමසුමේ සඳහන් පරිදි පත්වීමේ බලධාරියා අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස නිවැරදි විය යුතුය. (2007 අංක 37 දරණ සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතේ 55(1)). අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධානියා ලෙස සභාපති තුමන් අදාළ පත්වීම් සිදු කර ඇත. ජ්‍යෙෂ්ඨ විශේෂඥ (මානව සම්පත්) මගින්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්) මගින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා මගින්, ආදී වශයෙන් නිර්දේශ ලබාදී ඇත (පෞද්ගලික ලිපි ගොනු පරීක්ෂා කර ලැබූ විට එය තහවුරු කරගත හැකිය).

4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සම්පත්

පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතා වර්ධනය සඳහා පිහිටුවා ඇති රාජ්‍ය අධිකාරිය ලෙස මෙම අධිකාරිය රේඛීය අමාත්‍යාංශය සමඟ නිරන්තරයෙන් ක්‍රියාත්මක වේ. විශේෂයෙන්ම පනතින් සලසා ඇති නීතිමය ප්‍රතිපාදන ක්‍රියාවට නංවා ගැනිම සඳහා විවිධ වූ නියමයන්, නියෝග සහ තවත් නීතිමය ලියවිලි පිළියෙල කිරීමට විශාල වැඩ කොටසක් සිදු කල යුතුව ඇත. මේ සඳහා හොඳම විකල්පයක් ලෙස අධිකාරියේ පලපුරුදු තාක්ෂණ කරුණු මෙන්ම පරිපාලනමය කටයුතු පිළිබඳව මනා පරිචයක් ඇති චමිල ජයසේකර මහතා අමාත්‍යාංශයට ද්වීතියක පදනමින් සේවය ලබා දීම යැයි අධිකාරිය විශ්වාස කරයි. මෙම නිලධාරියා අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තාක්ෂණ) තනතුරට අනුයුක්තව සිටියා වුවද අධිකාරියේ වගකීම් ද එම කාල වකවානුවේ නොපිරිහෙළා ඉටු කරන ලද බවත්, අධිකාරියේ අවශ්‍යතා අමාත්‍යාංශ මට්ටමෙන් වැඩි වේගයකින් ඉෂ්ට කර ගැනීමටත් දායකවූ බව

කිවමනාය. මෙම ද්විතීය පදනමින් සිදු කල පත්වීම් අධිකාරියේ කටයුතු වලට මහත් අර්ථ සම්පන්න වූ බව අධිකාරියේ මතයයි.

5 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ කළමනාකරණයේ වගකීම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත.

5.2 2012-2016 කාල සීමාව සඳහා සංයුක්ත සැලැස්ම සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සකස් කරන ලද අතර, ඒ යටතේ හඳුනාගන්නා ලද වැඩසටහන් දිගුකාලීන වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කරන ලදී. ඉන්පසු කාල සීමාව සඳහා, ප්‍රමුඛත්වය දිය යුතු වැඩසටහන් ඇතුළත් කර 2015-2025 දස වසර ක්‍රියාකාරී සැලැස්ම සම්පාදනය කරන ලදී.

ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරි ක්‍රමවේද අමාත්‍යාංශය මඟින් සකස් කරන ලද අතර, ඊට අදාළව විශේෂයෙන් තිරසර බලශක්ති සංවර්ධනය සම්බන්ධ බලශක්ති ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා ආයතනයේ නිලධාරීන් විසින් කටයුතු කරන ලදී. බලශක්ති ප්‍රතිපත්තිය සකස් කිරීමෙන් පසු, ඊට අනුරූප වන පරිදි ආයතනික සංයුක්ත සැලැස්ම සම්පාදනය කිරීම අරමුණු විය. බලශක්ති ප්‍රතිපත්තිය සම්බන්ධ කෙටුම්පත මේ වන විට ඊට අදාළ සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර, ඒ අනුසාරයෙන් සංයුක්ත සැළැස්ම සම්පාදනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

5.3 2015 ජනපතිවරණයෙන් පසු පත්වූ රජය යටතේ දින 100 වැඩසටහන ක්‍රියාත්මක වූ පසු 2016 සඳහා අධිකාරිය විසින් සම්ප්‍රදායානුකූලව වැඩ සැලැස්ම පිළියෙල කරන ලදී. එසේ උවද 2015 වසරේ අවසාන භාගයේ පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණයට පසු නව අමාත්‍ය මණ්ඩලයක් පත් වූ අතර රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍ය මෙන්ම නියෝජ්‍ය අමාත්‍ය වරුන් ද, අලුතින් පත් විය. ඒ අනුව නව රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව ඉදිරි වැඩසටහන් නිර්මාණය කිරීම 2016 වසරේ මුල් භාගය තුල සිදු විය. ඒ වන විටත් සම්පාදනය කොට තිබූ 2016 වැඩ සැලැස්ම මේ අනුව පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට අවකාශයක් නොතිබිණ.

කැඳවීම පාදක කොටගත් නව උපාය මාර්ග හඳුන්වා දීමද, බලශක්ති කාර්යක්ෂමතාව වර්ධනය කිරීමේ වැඩසටහන නව මුහුණුවරකින් ජනාධිපති කාර්යසාධන බලකායක් යටතේ ප්‍රති නිර්මාණය කිරීම ද දැක්විය හැක. මේ අනුව 2016 වසර සඳහා මුලින් නිර්මාණය කරන ලද වැඩ සැලැස්ම ක්‍රියාත්මක කිරීම ගැටළු සහගත විය. එම නිසා එකී වසරේ කාර්ය සාධනය 40%ක් පමණ වූ බව සඳහන් කරමි. එසේ වුවද එම වසරේ ඵලදායී ලෙස ඉදිරි ක්‍රියාමාර්ග නිර්මාණය කිරීම සඳහා අධිකාරිය විසින් යොදාගත් බව කරුණාවෙන් දන්වමි.

5.4 ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු බඳවා ගැනීම සඳහා කලමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොමැති අතර අභ්‍යන්තර විගණකවරයකු බඳවා ගැනීම සඳහා පමණක් 2018.06.01 දින අනුමැතිය ලැබී ඇත.

5.5 අයවැය ලේඛනමය පාලනය

(අ) මෙහි සඳහන් ආයතනය කළමනාකරණය සඳහා වෙන් කළ ප්‍රාග්ධන රුපියල් මිලියන 6 න් ඉතිරි රුපියල් මිලියන 3.4 කාර්යාලය ගොඩනැගිල්ල තැනීම සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමට වියදම් කෙරිණි. එහෙයින් මෙහි කිසිම මුදලක් ඉතිරි නොවීය.

(ආ) මෙහි පාරිතෝෂික ගෙවීම් වසර මුලදී නිවැරදිව ඇස්තමේන්තු කළ නොහැක. නමුත් පාරිතෝෂික පනත අනුව මෙය ගෙවිය යුතු හෙයින් විචලනයක් ඇත.

තවද විදේශ ගමන්, විදේශ පුහුණු වීම් වලට විදේශිය ආරාධනා 2016 වසර තුල ලැබෙන හෙයින් ආයතනයේ පූර්ව සැලැස්මක් අනුව සිදු කල නොහැක. එහෙයින් එයද අයවැය සමඟ විචල්‍යතාවයන් පෙන්නුම් කරයි.

පුවත්පත් මිලදී ගැනීම අඩුකළ හෙයින් ඉන් විශාල මුදලක් ඉතිරි විය.

6 පද්ධති සහ පාලනයන්

විගණකාධිපතිතුමා විසින් පෙන්වා දී ඇති ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඒවා අදාල අරමුණු පරමාර්ථ ඉටුකර ගැනීම යොමු කිරීමටත් අදාල දුර්වලතාවයන් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමටත් පියවර ගනු ලැබේ. මෙහි සඳහන් පරිගණක ලෙජර් ක්‍රමය හඳුන්වා දී ඇති අතර, 2019 වසරේ සිට එමගින් ගිණුම් කටයුතු සිදු කෙරේ.